
නිවනේ නිවීම
සයවන වෙළුම
කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු

# නිවනේ නිවීම

## (දෙසුම් පෙළකි)

සයවන වෙළුම - තෙවන මුද්‍රණය
(16-18 දෙසුම්)

කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු

පොත්ගුල්ගල ආරණ්‍ය සේනාසනය
'පහන් කණුව'
කන්දේගෙදර,
දේවාලේගම

ISBN 955 - 8832 - 09 - X

ප්‍රකාශනය
ධම්ම්ග්‍රන්ථ මුද්‍රණ භාරය

# ධර්මදානයකි

මුදලට විකිණීම සපුරා තහනම් වෙයි.

ප්‍රථම මුද්‍රණය - 1999 මැයි

## පොත ලබාගත හැකි ස්ථාන

1. පොත්ගුල්ගල ආරණ්‍ය සේනාසනය
'පහන් කණුව' කන්දේගෙදර, දේවාලේගම.

2 රෝයල් ඉන්ස්ටිටියුට්,
191, හැව්ලොක් පාර,
කොළඹ 5.

3. ඩී. ටී. වේරගල මහතා
422, වැලිපාර, තලවතුගොඩ.

4. අනුර රූපසිංහ මහතා
27, කොළඹ වීදිය, මහනුවර

5. මහා භාරකාර දෙපාර්තමේන්තුව
2, බුලර්ස් පටුමග,
කොළඹ 07.

*මුද්‍රණය*
කොලිටි ප්‍රින්ටර්ස්
17/2, පැඟිරිවත්ත පාර, ගංගොඩවිල,
නුගේගොඩ.
ටෙලි : 011-4302312

මෙම දේශනාමාලාව පැවැත්වීමට ආරාධනාකොට

අප ධෛර්‍යවත් කළ

මීතිරිගල නිස්සරණ වන සේනාසනාධිපතිව වැඩවිසූ

අපවත් වී වදාළ

අතිපූජනීය, මහෝපාධ්‍යාය

## මාතර ශ්‍රී ඥානාරාමාභිධාන

අප ගුරුදේවයන් වහන්සේගේ ශ්‍රී නාමයට

## 'නිවනේ නිවීම'

පූජෝපහාරයක්ම වේවා!

එතං සනතං

එතං පණීතං

යදිදං

සබබ සංඛාර සමථො

සබබූපධිපටිනිසසගෙගා

තණ්හකඛයො

විරාගො

නිරොධො

නිබබානං

"මෙය ශානතය

මෙය ප්‍රණීතය

එනම්

සියලු සංස්කාරයන්ගේ සංසිඳීම

සියලු උපධීන් අතහැර දැමීම

තණ්හාව ක්ෂය කිරීම

නොඇල්ම නම්වූ විරාගය

නැවැත්ම නම් වූ නිරෝධය

නිවීම නම් වූ නිබ්බානය"

# පටුන


| | පිටුව |
|---|---|
| හැදින්වීම | vi |
| ප්‍රකාශක නිවේදනය | x |
| ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය මගින් පළකැරෙන ග්‍රන්ථ මුද්‍රණයට දායකවීම | xii |
| අමාගඟ | xiii |
| ග්‍රන්ථ සංකේත නිරූපණය | xv |
| 'නිවනේ නිවීම' - 16 | 1 |
| 'නිවනේ නිවීම' - 17 | 25 |
| 'නිවනේ නිවීම' - 18 | 49 |

# හැඳින්වීම

බුද්ධ දේශනාවෙහි දැක්වෙන ප්‍රතිපත්ති මාර්ගයේ අවසාන පරමාර්ථය වන 'නිවන' පිළිබඳව ඈත අතීතයේ පටන්ම විවිධ මතිමතාන්තර ප්‍රකාශයට පත් වී ඇත. ආර්ය අෂ්ටාංගික මාර්ගය 'සම්මා දිට්ඨි' නම් වූ 'හරි දැක්ම' පෙරටු කරගත් ප්‍රතිපදාවකි. එබැවින් ඒ මාර්ගයෙහි ගමන් කරන්නෙකුට ගමනෙහි ඉලක්කය ගැන නිරවුල් අවබෝධයක් ඇතිවිය යුතුමය. බුද්ධ වචනයට අනුකූලව එවැනි අවබෝධයකට මඟ හෙළි කිරීම මෙම දේශනා මාලාවේ පරමාර්ථය විය.

මීතිරිගල නිස්සරණ වන සෙනසුනෙහි ප්‍රධාන කර්මස්ථානාචාර්යයන් වහන්සේ වශයෙන් වැඩ විසූ, අපවත් වී වදාළ අතිපූජනීය මහෝපාධ්‍යාය මාතර ශ්‍රී ඤාණාරාම මාහිමිපාණන් වහන්සේ විසින් අප වෙත කරන ලද සමාරාධනය මේ දේශනා පෙළට ආසන්න නිමිත්ත විය. අපගේ ගුරුදේවයන් වහන්සේ වූ උන්වහන්සේ, මෙයට වසර කීපයකට පෙර නිස්සරණ වන යෝගාවචර සඟ පිරිසට ඉදිරිපත්වූ එක්තරා ධර්ම ගැටළුවකදී 'නිවන' පිළිබඳව දේශනා පෙළක් පැවැත්වීම ප්‍රයෝජනවත් විය හැකි බවත්, ඒ දේශනා පටිගත කරගැනීමට කටයුතු යෙදිය හැකි බවත් පවසමින් අප වෙත කරන ලද දයාන්විත ආරාධනය පිළිගැනීමට මුලදී පසුබට වීමු. යළිත් එම ආරාධනාව කළ අවස්ථාවේදී, එසේ පසුබට වීමට එක් හේතුවක් වශයෙන් අප සඳහන් කළේ 'නිවන' සම්බන්ධයෙන් දැනට ප්‍රචලිතව ඇති ඇතැම් මතිමතාන්තර කෙරෙහි අප දක්වන වෙනස් ආකල්පය නිසා ඇතිවිය හැකි ප්‍රතිචාරයය. එවිට උන්වහන්සේ වදාළේ: "ඒකට කමක් නෑ...... මා ආරාධනා කළ බව දේශනාවේදීම කියන්න" යනුවෙනි.

ඒ සා උදාර පැවරීමකින් උත්සාහවත්ව ආරම්භ කැරුණු මෙම දේශනා මාලාව දෙවසරකට වැඩි කාලයක් තිස්සේ (1988.08.12-1991.01.30) දෙපෝයකට වරක් බැගින් අප ගුරුදේවයන් වහන්සේගේ අතිපූජනීය පාදමූලයේදී නිස්සරණ වනයේ අප සබ්‍රහ්මචාරී ගරුතර යෝගාවචර සඟ පිරිස හමුවේ පවත්වන්නට යෙදුණි. ගිලන්වූ ඇතැම් අවස්ථාවලදී පවා මාහිමිපාණන් වහන්සේ යහන්ගතව දෙසුමට සවන් දුන්හ. උන්වහන්සේ බැහැර සෙනසුනෙක වැඩ විසූ එක් අවස්ථාවෙක, මාහිමිපාණන් වහන්සේ මුල'සුනෙහි නොමැතිව දේශනා පැවැත්වීම සම්බන්ධයෙන් පැනනැඟුනු ප්‍රශ්නයක් නිසා එක් දේශනා වාරයක් මඟ හැරුණි. ඒ බැව් සැළවූ විට. නොකඩවාම දේශනාමාලාව පැවැත්විය යුතු බවත්, තමන් වහන්සේට ඒ දෙසුම් පටිගත කළ පසුව වුවද ඇසිය හැකි බවත්, උන්වහන්සේ වදාළහ.

අප ගුරු දේවයන් වහන්සේගේ ඒ උදාර මුදිතා ගුණයට හා ධර්මකාමී ශාසන දයාවට නමස්කාර වේවා!

දෙසුම් **33** කින් පරිමිත මෙම දේශනා මාලාව පැවැත්වීමේදී අප අනුගමනය කළ විවරණ මාර්ගය අනුව හේතුසාධක වශයෙන් පෙළ අටුවා ආදියෙන් කොතෙකුත් උද්ධෘත පාඨ ගෙනහැර දැක්වීමට සිදුවිය. ඒ අනුව එක්තරා බුද්ධිගෝචර රටාවක් මෙහි දැකිය හැකි නමුදු අප පරමාර්ථය වූයේ සද්ධර්මයේ සජීව ප්‍රායෝගික පක්ෂය ඉස්මතු කර දීමමය. ඇතැම් විට හුදු බුද්ධිවාදයක අතරමං වී සිටින උගතුන් කිසියම් ධර්මප්‍රබෝධයක් තුළින් ප්‍රතිපදාව වෙතට යොමුකරවා ගැනීමට මේ විවරණ මාර්ගය උපකාරවත් විය හැකිය. කෙසේ හෝ වේවා, යමෙකුට ධර්මරසය විඳිමින්ම දෙසුමකට සවන්දිය හැකිවන අයුරින් විවිධ උපමා, උපමා කථා, නිදර්ශන ආදියෙන් දෙසුම් පෙළ පණපෙවීමට උත්සාහවත් වීමු. බුදු පියාණන් වහන්සේ වදාළ පරිදිම, "මෙහි ඇතැම් නුවණැති පුරුෂයෝ උපමාවෙකිනුදු දෙසුමෙක අරුත මැනැවින් වටහා ගනිත්".

අසන්නවුන්ගේ අවධානය නොවිසිරෙන අයුරින් මුතු ඇට පෙළක් නූලක අවුණන්නාක් මෙන් ධර්ම කාරණා සාධක සහිතව ගොනු කර දැක්වීම දේශනාවක් තුළ දී කළ හැකි පහසු කාර්යයක් නොවේ. එබැවින් එවැනි ගැටමුසු තැන්වලදී හේතුසාධක කීපයක් පමණක් දැක්වීමෙන් සෑහීමකට පත්වීමට සිදුවිය. එහිලා වඩාත් සවිස්තර විවරණ විග්‍රහ අප අතින් ලියැවී පළවූ ග්‍රන්ථ කීපයක ඇතුළත් වී ඇත.[1]

දෙසුම් පෙළ නිමකොට සත්වසරකට පසු "නිවනේ නිවීම" නමින් එළිදැක්වෙන මෙම ග්‍රන්ථයෙන් යම් ශාසනාර්ථයක් ඉටු වෙතොත් එයින් ජනිත කුශල සම්භාරය දෙසුම්පෙළට ඇරයුම් කොට වදාළ අප ගුරුදේවයන් වහන්සේ වූ මීතිරිගල නිස්සරණ වන සේනාසනාධිපතිව වැඩවිසූ අතිපූජනීය මහෝපාධ්‍යාය මාතර ශ්‍රී ඥානාරාම මාහිමිපාණන් වහන්සේ අනුමෝදන් වන සේක්වා! ඒ දුර්ලභ ගුරු ඇසුර ලබාගැනීමට මහපැදූ ශ්‍රී කල්‍යාණී

---

1 * 1 Concept and Reality in Early Buddhist Thought - (1971)
* 2 Samyutta Nikaya - An Anthology Part II - (Wheel No. 183/185)
* 3 Ideal Solitude - Wheel No. 188
* 4 උත්තරීතර හුදෙකලාව - (දම්සක් අංක 172/173)
* 5 The Magic of the Mind - (1974)
6 Towards Calm and Insight-Printed for free distribution by J.Alwis
* Published by Buddhist Publication Society. P.O. Box 61, Kandy
බෞද්ධ ග්‍රන්ථ ප්‍රකාශන සමිතිය, තැ.පෙ. 61. මහනුවර

යෝගාශ්‍රම සංස්ථාවේ සමුත්පාදක අතිපූජනීය පණ්ඩිත කඩවැද්දුවේ ශ්‍රී ජිනවංශ මාහිමිපාණන් වහන්සේටත් අතිපූජනීය නාඋයනේ අරියධම්ම මාහිමිපාණන් වහන්සේටත් මෙම ධර්මදානමය කුශලය හිමිවේවා!

පටිගත වූ දෙසුම් 33 පිටපත් කිරීමේ භාරදූර කාර්යය මහත් පරිශ්‍රමයකින් ඉටුකළ හපුරුදෙණියේ පියදස්සන හිමියන්ටද, සමීක්ෂණ ශුද්ධි ආදියෙන් පසුව එම අත්පිටපත මුද්‍රණය සඳහා සකස් කර දුන් පූජ්‍ය උඩර්රියගම ධම්මජීව, පූජ්‍ය මහයායේ ධම්ම සුනෙත්ත යන හිමිවරුන්ටද දෙසුම් පටිගත කිරීම් පිටපත් කිරීම් ආදී කටයුතුවලට සහායවූ හැමදෙනා වහන්සේලාටද මෙම ධර්මදානමය පින පරම ශාන්ත නිර්වාණාවබෝධය පිණිසම වේවා! එමෙන්ම, අවශ්‍ය අවස්ථාවලදී කැසට් පටි සපයාදීමෙන් හා ලිපි ද්‍රව්‍ය, ඡායා පිටපත් ලබාදීමෙන් අනුග්‍රහය දැක්වූ ඩඩ්ලි ප්‍රනාන්දු මහතා ප්‍රධාන ඩී. එච්. පී. මුණවීර සහ සමාගමේ කාර්යමණ්ඩලයටද අපගේ පුණ්‍යානුමෝදනාව හිමිවේ.

අමිලවූ ධර්මය මිල කිරීමකින් නොපිරිහෙළා ධර්මකාමීන් අතට පත්කිරීම අපගේ අභිලාෂය විය. එහෙත් විශාල ග්‍රන්ථයක් බවට පත්වන මෙම දෙසුම් පෙළ එක්වරම බොහෝදෙනෙකුන් අතට පත් කිරීමේ දුෂ්කරතාව වැටහුණෙන් දෙසුම් 3 බැගින් වෙළුම් 11 ක් වශයෙන් එළි දැක්වීමට අදහස් කළෙමු. මේ අනුව යටත් පිරිසෙයින් දෙසුම් කිහිපයක් හෝ කියවීමට වැඩිදෙනෙකුට අවස්ථාව සැලසෙන අතරම ධර්මදානමය පුණ්‍ය කර්මයට බොහෝදෙනාගේ සහභාගිත්වයද ලැබෙනු ඇතැයි හඟිමු. එබැවින්, ග්‍රන්ථය තවමත් ශුද්ධිපත්‍ර අවස්ථාවේ පවතින නමුදු මෙසේ පළමු වෙළුම නිකුත් කිරීමට තීරණය කළෙමු. යථා කාලයේදී සම්පූර්ණ ග්‍රන්ථය පුස්තකාල මුද්‍රණයක් වශයෙන් අංග සම්පූර්ණව මුද්‍රණය කෙරෙනු ඇත. කෙසේ වෙතත්, 'නිවනේ නිවීම' වෙළුම් එකොළොසම පිළිවෙළින් එකතු කරගන්නා පාඨකයින්ගේ පහසුව තකා අවසන් වෙළුම සමග උපමා ඉඟිවැලක් හා ගාථා ඉඟිවැලක් ද සහිත 'පදයතුරක්' (අනුක්‍රමණිකාවක්) නිකුත් කිරීමට බලාපොරොත්තු වෙමු. එම පදයතුර සකස් කිරීමේදී අපට සහාය වූ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස් උපාලි ජයනෙත්ති මහතාට ඒ පින නිවන් දොර ඇරෙන යතුරක්ම වේවායි පතමු.

ග්‍රන්ථ මුද්‍රණයෙහිලා මුද්‍රණාලය හා අවශ්‍ය සම්බන්ධීකරණය පිළිබඳ සම්පූර්ණ වගකීම භාරගෙන විශේෂ කැපවීමකින් ග්‍රන්ථය එළිදැක්වීමට කටයුතු කරන මහාභාරකාර තැන්පත් යූ. මාපා මහතාට මෙම ධර්මදානමය කුශලය ස්වකීය ධර්ම ප්‍රාර්ථනා ඉෂ්ට කරගැනීම පිණිස හේතුවාසනා වේවා! එසේම, වෙළුම් එකොළොසකින් නිමාවන ග්‍රන්ථයෙහි බරපැන, 'බර පැනයක්' නොවනු පිණිස 'ධර්මග්‍රන්ථ මුද්‍රණ භාරය' නමින් විශේෂ

අරමුදලක් පිහිටුවීමෙන් පුරෝගාමීවූ පින්වත් ජී.ටී. බණ්ඩාර මහතාට එම ආදර්ශවත් පරිත්‍යාගයෙන් ජනිත කුශලය පරම ශාන්තවූ 'නිවනේ නිවීම' පසක් කරගැනීමට උපනිශ්‍රය වේවායි! යි පතමු. මුද්‍රණ භාරයේ තීරණාත්මක අවසාන අදියර සඳහා පූර්ණ සහයෝගය දෙන කරුණාරත්න සහ පුත්‍ර සමාගමේ කාර්‍ය මණ්ඩලයටද අපගේ පුණ්‍යානුමෝදනාව හිමි විය යුතුව ඇත.

මෙයට
සසුන් ලැදි,
**කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු**

පොත්ගුල්ගල ආරණ්‍ය සේනාසනය
'පහන් කණුව'
කන්දෙගෙදර
දේවාලේගම

**(25 41) 1997 ජූලි 1**

# ප්‍රකාශක නිවේදනය

අතිපූජ්‍ය කටුකුරුන්දේ ඤාණනන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ "නිවනේ නිවීම" දේශනා මුද්‍රණය කොට, ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයහට එම දහම් පොත් ලබාදීමේ මූලික අදහස අප තුළ ඇතිවී මුත්, මුද්‍රණය සඳහා වැය වන මුදල උපයා ගැන්ම ප්‍රශ්නයක් විය. එය විසඳීම පිණිස අප කිහිප දෙනෙක් යෝජනා කළේ වැයවන මුද්‍රණ වියදම පමණක් අය කර ගැන්මට ප්‍රමාණවත් වූ මිලකට එම දහම් පොත් විකිණීමයි. එහෙත්, අපගේ එම යෝජනාව ගරු ඤාණනන්ද ස්වාමීන් වහන්සේ එකහෙලා ප්‍රතික්ෂේප කරමින් "ධර්මය මිල කරන්න බැහැ, එය අවශ්‍ය අයහට නොමිලේ ලබා ගැන්මට හැකිවිය යුතුයි..." කීහ.

එබැවින් උන්වහන්සේ අදහස් කළ පරිදි මුලින්ම මුද්‍රණය කල "නිවනේ නිවීම" දේශන මාලාව සඳහා වියදම් ලබා ගැන්මේ වැඩ පිළිවෙලක් වශයෙන් රෝයල් ඉන්ස්ටිටියුට් හි අධිපති ජී.ටී.බණ්ඩාර මහතා විසින් මහා භාරකාර දෙපාර්තමේන්තුවෙහි "ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය" නමින් අරමුදලක් අරඹනු ලැබීය. එවකට මහා භාරකාර ධූරය දැරූ යූ. මාපා මහතාගේ අදහසක් අනුව පිහිටුවන ලද එකී භාරයෙහි අරමුණ වූයේ මෙම පුණ්‍ය ක්‍රියාව ඉටුකර ගැනීම සඳහා දායක වීමට කැමති අය හට මුදලින් කෙරෙන තම පුණ්‍යාධාර එම භාරයට බැර කිරීමට අවස්ථාව සළසා දීමයි.

1997 වසරේදී ඇරඹුනු මෙම ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය මගින් පූජ්‍ය ඤාණනන්ද හිමියන්ගේ දේශනා 33 කින් යුත් "නිවනේ නිවීම" වෙළුම් 11 කින් මුද්‍රණය කොට නොමිලේ බෙදා දීමට අමතරව පසළොස්වක පොහෝ දිනයන්හිදී පහන් කණුව සෙනසුන වෙත රැස්වෙන උපාසක උපාසිකාවන් සඳහා උන්වහන්සේ විසින් කෙරෙන ධර්ම දේශනා "පහන් කණුව ධර්ම දේශනා" නමින් මේ වන විට ග්‍රන්ථ 5ක් පළකොට තිබේ. එතැනින් නොනැවතී උන්වහන්සේගේ අනෙකුත් සිංහල සහ ඉංග්‍රීසි ග්‍රන්ථද එසේම ධර්ම දාන වශයෙන් පළකිරීමට හැකිවීම ඊට දායක වූ අප සැමගේ ඉමහත් සතුටට හේතුවිය.

අති පූජ්‍ය ඤාණනන්ද ස්වාමීන් වහන්සේගේ එම ධර්ම දේශනා අගයමින් එම සත්කාර්යය නොනවත්වා කරගෙන යෑම පිණිස දායක භවතුන්ගෙන් අප වෙත ලැබෙන පැසසුම් සහිත ප්‍රතිචාරය නිසාම ඒ අයගේ පහසුව පිණිස අප විසින් මෑතකදී "ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය" නමින් සම්පත්

බැංකුවේ නුගේගොඩ ශාඛාවේ අංක 0003 6000 1415 දරණ ජංගම ගිණුම විවෘත කරන ලදී.

අති පූජ්‍ය කටුකුරුන්දේ ඤාණනන්ද හිමියන් විසින් පහදා දෙනු ලබන නිර්මල බුදු දහම ඔබ අතට පත් කිරීම අපගේ එකම අරමුණයි. ඊට ඔබගෙන් ලැබෙන දායකත්වය ඉමහත් කුශලයකි. අපට ඉමහත් ධෛර්යයකි.

මෙම වටිනා ග්‍රන්ථ මුද්‍රණය කොට බෙදා හැරීමේ සම්පූර්ණ කාර්යභාරය ජී.ටී. බණ්ඩාර මහතා විසින් රෝයල් ඉන්ස්ටිටියුට් හි පින්වත් නිලධාරීන්ගේ සහායද ඇතිව වෙහෙස මහන්සි නොබලා ඉටුකර දීම ගැන අපගේ බලවත් ප්‍රසාදය මෙහිලා විශේෂයෙන්ම සඳහන් කළයුතු වේ.

මෙයට,
සසුන් ලැදි
ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරකාර මණ්ඩලය

# ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය මගින් පළකැරෙන ග්‍රන්ථ මුද්‍රණයට දායක වීම

අති පූජ්‍ය කටුකුරුන්දේ ඤාණනන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් දේශිත නිර්මල බුදු දහම, "නිවනේ නිවීම" සහ "පහන් කණුව ධර්ම දේශනා" නමින් පළ වී ඇති දහම් පොත් තුළින් මේ වන විටත් ඔබ ඇතැම් විට කියවා තිබිය හැක.

එම ස්වාමීන් වහන්සේගේ ධර්ම දේශනා හැකි පමණ මුද්‍රණය කොට නොමිලේ බෙදා දීම ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරයේ අරමුණයි.

මෙතෙක් එම භාරය මගින් පළකොට ඇති ධර්ම ග්‍රන්ථ එකී ග්‍රන්ථ වල අවසාන පිටුවෙහි දක්වා ඇත.

මෙම මහඟු පුණ්‍ය ක්‍රියාව සඳහා දායක වීමට කැමති පින්වතුන්, පහත සඳහන් උපදෙස් පිළිපැදීම මැනවි.

1. චෙක්පත්/මුදල් ඇනවුම් මගින් එවන සියලු ආධාර "ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය" නමින් සම්පත් බැංකුවේ නුගේගොඩ ශාඛාවේ අංක 0003 6000 1415 දරණ ගිණුමට බැර කිරීම පිණිස පහත සඳහන් ලිපිනයට එවිය හැකිය.
2. දිවයිනේ පිහිටි ඕනෑම සම්පත් බැංකු ශාඛාවක් මගින් ඔබගේ ආධාර මුදල් ඉහත සඳහන් ගිණුමට බැර කල හැක.
3. කෙසේ වුවද, ඔබගේ පහසුව පිණිස සියලු පුණ්‍යාධාර කොළඹ 05, හැව්ලොක් පාරේ අංක 191 හි පිහිටි රෝයල් ඉන්ස්ටිටියුට් ආයතනයේ ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය වෙනුවෙන් පිහිටුවා ඇති අංශයටද බාර දියහැක.
4. මෙම භාරය මගින් නිකුත් කැරෙන ධර්ම ග්‍රන්ථ මගින් ඔබගේ දායකත්වය වරින් වර දායක භවතුන්ගේ දැනගැන්ම සඳහා පළ කරනු ඇත.
5. ඔබ විසින් කරනු ලබන ආධාරය බැංකු ගිණුමට බැර කරන විට ඒ සඳහා නිකුත් කරනු ලබන කුවිතාන්සියෙහි ඡායා පිටපතක් පහත සඳහන් ලිපිනයට එවීමෙන් මෙම ධර්ම දානමය කටයුත්තට දායක වන ඔබගේ නම සහ දායක මුදල අප විසින් වරින් වර පළ කරන දායක ලැයිස්තුවෙහි ඇතුළත් කිරීම කළ හැකිය.

ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය<br>
රෝයල් ඉන්ස්ටිටියුට්<br>
අංක 191, හැව්ලොක් පාර<br>
කොළඹ 05

# අමා ගඟ

මහවැලි ගඟ උතුරට හැරවීමෙන් පසු එතෙක් නිසරු මුඩු බිම් ලෙස පැවති පෙදෙස්වල සිදුවූයේ ඉමහත් වෙනසෙකි. පිපාසයට පැන්බිඳක් නොලබා සිටි ගොවීහු පෙදෙස පුරා නිහඬව ගලා යන සිසිල් දිය දහරින් පිනා ගියහ. මැලවුනු ගොයම සරුව තිල්වන්ව කරලින් බර විය. මල් පලින් ගැවසීගත් තුරු-ලිය බලා සැනසෙන පෙදෙස් වැසියෝ තුටු කඳුළු වගුළහ.

දහම් අමා ගඟ "උතුරට" හැරවීමේ වැඩ පිළිවෙළක් මෙයට තෙවසරකට පෙර ඇරඹුණි. දහම් පත-පොත තබා "එදා-වේල" සඳහා වත් විය පැහැදම් කිරීමට වත්-කමක් නැත්තෝ, නිහඬව නොමිලයේ ගලායන අමිල දහම් අමා දිය දහරින් සදහම් පිපාසය සන්සිඳුවා ගත්හ. අරිටු මිසදිටු හැර, සැදැහැයෙන් සරුව, ගුණ නුවණින් බරව පිළිවෙත් මඟට නැමී ගත්හ. ලොවී - ලොවුතුරු මල් පල නෙලා ගනිමින් හද පුරා පිරි බැතියෙන් නන් අයුරින් සොම්නස පළකළහ.

"ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය" නමින් දියත් කළ මෙම ධර්මදාන වැඩපිළිවෙල සඳහා අපගෙන් වැයවුනේ පිරිසිදු ධර්මදාන සංකල්පය පමණි. අමාගඟ "උතුරට" හැරවූවෝ සසුන් ගුණ හඳුනන පරිත්‍යාගශීලී සැදැහැවත්හුමය. "නිවනේ නිවීම" පොත් පෙළ එළි දැක්වීමෙන් නොනැවතී "පහන් කණුව ධර්මදේශනා" පොත් පෙළෙහි "බර පැන" දැරීමටත්, දෙස් - විදෙස්වල දහම් පිපාසිතයින් උදෙසා අප අතින් ලියැවෙන අනිකුත් පොත - පත ඒ අයුරින්ම එළි දැක්වීමටත් ඔවුහු උත්සුක වූහ. "දෙන දේ පිරිසිදුවම දීමේ" අදහසින් අමිල වූ දහම ඊට නිසි ශෝභන මුද්‍රණයකින්ම ධර්මකාමීන් අතට පත් කිරීමට පියවර ගත්හ. මුද්‍රිත පිටපත් සංඛ්‍යාව අවසන්වනු හා සමගම "නැවත මුද්‍රණ" පළකිරීමෙන් දහම් අමා ගඟ වියළී යා නොදීමට දැඩි අදිටනකින් ඇප කැපවූහ.

"පොත් අලෙවිය" පිළිබඳව මෙකල බහුලව දක්නට ලැබෙන වාණිජ සංකල්පයට පිටුපා, තහංචිවලින් තොරව, තමන් අතට නොමිලයේම පත් කැරෙන "දහම් පඬුර" තුළින් ධර්මදාන සංකල්පයෙහි අගය වටහා ගත් බොහෝ පාඨක පින්වත්හු තමන් ලද රස අහරක්, නෑ-හිතවතුන් සමග බෙදා-හදා ගන්නාක් මෙන් නොමසුරුව අන් දහම් ලැදියනටද දී ධර්ම දානයට සහභාගී වූහ. ඉනුදු නොනැවතී, ශක්ති පමණින් "ධර්ම ග්‍රන්ථ මුද්‍රණභාරයට" උරදීමටද ඉදිරිපත්වූහ, ඇතැමෙක් ලොකු කුඩා දහම් පොත් මුද්‍රණය කරවීමේ හා නැවත-නැවත මුද්‍රණය කරවීමේ බරපැන ඉසිලීමට පවා පසුබට නොවූහ.

සම්බුදු සසුන මේ ලක් පොළොවෙහි පවතින තාක් මේ දහම් අමාගඟ ලෝ සතුන් සිත් සනහමින් නොසිඳී ගලා යේවා යනු අපගේ පැතුමයි.

**"සබ්බදානං ධම්මදානං ජිනාති"**

මෙයට,

සසුන් ලැදි

**කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු**

පොත්ගුල්ගල ආරණ්‍ය සේනාසනය
'පහන් කණුව'
කන්දේගෙදර, දේවාලේගම
2000 ජුනි 05 (2544 පොසොන්)

## නිවනේ නිවීම - සයවන වෙළුම

### (තෙවන මුද්‍රණය)

මෙම ධර්ම ග්‍රන්ථය සදහම් පිපාසිතයින් අතට පත්කිරීම උදෙසා කාලය, ධනය, ශ්‍රමය ශාසන දයාවෙන් පරිත්‍යාග කළ සැමදෙනාටම අමිල වූ ධර්මය නොමිලයේ බෙදාදීමෙන් ජනිත කුශල ශක්තිය පරම ශාන්ත උතුම් නිර්වාණාවබෝධය පිණිස හේතු වාසනා වේවා! යි පතමු.

- සම්පාදක

(2550) 2006 සැප්තැම්බර්

# ග්‍රන්ථ සංකේත නිරූපණය

මහා. - මහා වග්ග පාළි

දී.නි. - දීඝ නිකාය

ම.නි. - මජ්ඣිම නිකාය

සං.නි. - සංයුත්ත නිකාය

අං.නි. - අංගුත්තර නිකාය

ඛු.නි. - ඛුද්දක නිකාය

ධ.ප. - ධම්මපද

උදා. - උදාන

ඉති. - ඉතිවුත්තක

සු.නි. - සුත්තනිපාත

ථෙර. - ථෙරගාථා

ථෙරී. - ථෙරීගාථා

මහානි. - මහා නිද්දෙස

චු.නි. - චුල්ල නිද්දෙස

නෙත්ති - නෙත්තිප්පකරණ

සු.වි. - සුමඞ්ගලවිලාසිනී (දීඝ නිකාය අටුවාව)

ප.සූ. - පපඤ්චසූදනී (මජ්ඣිම නිකාය අටුවාව)

සා.ප. - සාරත්ථප්පකාසිනී (සංයුත්ත නිකාය අටුවාව)

මනො. - මනොරථපූරණී (අංගුත්තර නිකාය අටුවාව)

ධ.අ. - ධම්මපදට්ඨ කථා

ප.ජො. - පරමත්ථජොතිකා

ජා.අ. - ජාතකට්ඨකථා

ප.දී. - පරමත්ථදීපනී

වි.ම. - විසුද්ධිමග්ග

බු.ජ. - බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා

හේ.මු. - සයිමන් හේවාවිතාරණ මුද්‍රණය

# 16 වන

# දේශනය

# 16 වන දේශනය

**"නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස"**

"එතං සන්තං එතං පණීතං යදිදං සබ්බසංඛාරසමථො සබ්බූපධි පටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං."

"මෙය ශාන්තය මෙය ප්‍රණීතය එනම් සියලු සංස්කාරයන්ගේ සංසිඳීම, සියලු උපධීන් අතහැර දැමීම, තණ්හාව ක්ෂය කිරීම, නොඇල්ම නම් වූ විරාගය, නැවැත්ම නම් වූ නිරෝධය, නිවීම නම් වූ නිබ්බානය."

**අතිපූජනීය මහෝපාධ්‍යාය මාහිමිපාණන් වහන්සේ ප්‍රධාන ගරුතර යෝගාවචර මහා සංඝ රත්නයෙන් අවසරයි. නිබ්බාන යන මාතෘකාව යටතේ පවත්වනු ලබන දේශනා මාලාවේ දහසය වන දේශනයයි මේ.**

ඉන්ද්‍රියානුසාරයෙන් පුහුදුන් ලෝකයා ලබන ප්‍රත්‍යක්‍ෂ ඥනයත් ප්‍රඥචක්‍ෂුෂයෙන් රහතන්වහන්සේ ලබන ප්‍රත්‍යක්‍ෂඥනයත් අතර ඇති මහා පරතරය ගියවර දේශනයේදී අප බාහිය සූත්‍රය පිළිබඳ විවරණයෙන් මතුකරගත්තා. පපඤ්ච නිප්පපඤ්ච' යන දෙපදය අතර ඇත්තේත් මේ පරතරයමයි. ලෝක නිරුක්ති ලෝක ව්‍යවහාර ලෝක ප්‍රඥප්ති උඩ ගොඩනැගුනු ඉන්ද්‍රිය ඥනයේ ග්‍රාහ්‍ය - ග්‍රාහක භේදයක් තියෙනව. ඒ කියන්නේ අල්ලාගැනීමට දෙයක්, අල්ලාගන්නා කෙනෙක්, කර්තෘ -කර්ම සංකල්පනයක් තියෙනව. නිතරම ද්වයනිශ්‍රිත බවක්, දෙකක් ඇසුරු කරගත්තු බවක් තිබෙනව ඒ ඉන්ද්‍රියඥනයේ. දුටුබවක් ඇතොත් දුටුදෙයක්ද ඇත. දුටු කෙනෙක්ද ඇත. ඒකයි තර්ක ක්‍රමය. මේ පටු දෘෂ්ටි කෝණය ඉක්මවල නිප්පපඤ්ච තත්ත්වයට පත්වීමේ කෙටි ධර්මෝපදේශයක් බුදුරජාණන් වහන්සේ බාහිය තවුසාණන්ට 'දිට්ඨෙ දිට්ඨමත්තං භවිස්සති' - ආදී ඒ සූත්‍රයෙන් ප්‍රකාශ කළා. දුටු දෙයක් නෑ. දුටු කෙනෙක් නෑ. දුටු බවක් විතරයි. ලෝකයේ තිබෙන මේ ප්‍රපංච තත්ත්වයට හේතුව මේ ස්පර්ශයයි. ඒ කාරණය රහතන් වහන්සේල තේරුම්ගත්තෙ මේ දිට්ඨ සුත මුත විඤ්ඤත කියන හතරම ස්පර්ශය නිසා මොහොතකට එක්වෙලා සිදිල බිඳිලා විසිරිල යන ප්‍රත්‍ය සමවායයක් හැටියට දැකීමෙන්. දිට්ඨ සුත මුත විඤ්ඤත කියල කියන්නේ ලෝකයා දේවල් හැටියට සළකන දේ. ප්‍රඥචක්‍ෂුෂයෙන් රහතන් වහන්සේලාට පේන්නේ ස්පර්ශය නිසා - 'ඵස්සං පටිච්ච' පටිච්ච සමුප්පාදයේ හරය එතනයි - 'ඵස්සං පටිච්ච සපර්ශය නිසා මොහොතකට එක්වෙලා සිදිල බිඳිල විසිරිලා යන ප්‍රත්‍යයසමවායයක් පමණයි.

ඒකම පටිච්ච සමුප්පාදය දැකීම වෙනව. ස්පර්ශායතනවලට සීමාවුනු, එහෙම නැත්නම් සළායතනයට සීමාවුනු මේ පටු දෘෂ්ටිකෝණය ඉක්මවල, ''විඤ්ඤාණං අනිදස්සනං අනන්තං සබ්බතොපහං' යන පදවලින් හඳුන්වන ඒ නිවනට - නිෂ්ප්‍රපඤ්ච තත්ත්වයට - පත්වීමට නම් ස්පර්ශනිරෝධය දැකිය යුතුයි. යමක් නිසා ස්පර්ශයෝ ස්පර්ශකරත්ද, ඒ දේ නැති කිරීමෙන්ම ස්පර්ශ නිරෝධය සැලසෙන බව බුදුරජාණන් වහන්සේ උදාන පාළියේ මුචලින්දවග්ගයේ එන එක්තරා සූත්‍රයක ප්‍රකාශ කරල තියෙනව උදානගාථාවකින්. සැවැත් නුවර අන්‍යතීර්ථක පරිබ්‍රාජකයින් තමන් ලාභ සත්කාර වලින් පිරිහීම නිසා බුදුරජාණන් වහන්සේ කෙරෙහිත් සංඝයා වහන්සේලා කෙරෙහිත් ඊර්ෂ්‍යාව ඇති කරගෙන, සංඝයා වහන්සේලාට ගමේදීත් වනයේදීත් බනින්න පටන් ගත්ත, අසභ්‍ය පරුෂ වචන වලින්. සංඝයා වහන්සේලා පිරිසක් ඇවිල්ල බුදුරජාණන් වහන්සේට මේක පැමිණිලි කළා. ඒ අවස්ථාවේ බුදුරජාණන් වහන්සේගේ ප්‍රතිචාරය උනේ එක්තරා උදාන ගාථාවක් පමණයි. උදාන ගාථා කියන්නේ ප්‍රීතිවාක්‍යනෙ. ප්‍රීතිවිදියේ ගාථාවක් ප්‍රකාශ කළා. නමුත් ඒකේ තියෙනව ධර්මෝපදේශයකුත්.

**'ගාමෙ අරඤ්ඤෙ සුඛදුක්ඛ ඵුට්ඨො - නෙවත්තතො නො පරතො දහෙථ**
**ඵුසන්ති ඵස්සා උපධිං පටිච්ච - නිරූපධිං කෙන ඵුසෙය්‍යුං ඵස්සා'**[1]

මුල්පද දෙකේ තියෙන්නේ උපදේශයක්. 'ගාමෙ අරඤ්ඤෙ සුඛදුක්ඛ ඵුට්ඨො' - ගමෙහි හෝ වේවා ආරණ්‍යයෙහි හෝ වේවා සැපදුක් වලින් ස්පර්ශකරන ලද්දේ, 'නෙව අත්තතො නො පරතො දහෙථ' - 'තමාය' කියල හිතන්නත් නරකයි. 'අනුන්ය' කියල හිතන්නත් නරකයි. තමා කියා හෝ නොතැකිය යුතුයි. අනුන් කියා හෝ නොතැකිය යුතුයි. මක්නිසාද, ධර්ම න්‍යායය ඊළඟට ඉදිරිපත් කරනව. මේක අනුන්ගේ වැරැද්දක්වත් තමන්ගේ වැරැද්දක්වත් නොවෙයි. මෙතන තිබෙන්නේ - ඵුසන්ති ඵස්සා උපධිං පටිච්ච - නිරූපධිං කෙන ඵුසෙය්‍යුං ඵස්සා - උපධීන් නිසා ස්පර්ශයෝ ස්පර්ශ කරත්, 'නිරූපධිවූ තැනැත්තාව, උපධීන්ගෙන් මිදුනු තැනැත්තාව, කෙසේ නම් ස්පර්ශයෝ ස්පර්ශ කරත්ද? ඔච්චරයි බුදුපියාණන් වහන්සේ වදාළෙ. මෙයින් අපට නිවන 'සබ්බූපධිපටිනිස්සග්ගො, නිරූපධි' යන නම්වලින් හැඳින්වීමේ තවත් වැදගත්කමක් හෙළිවෙනව. අපි කලිනුත් දේශනා කීපයකදීම මේ 'උපධි, පටිනිස්සග්ග' වචන එහෙම හමුවන අවස්ථාවේදී මේ උපධි කියන සංකල්පය පිළිබඳව තරමක් දුරට විස්තර කළා. දැන් මෙතනදීත් යන්තම් මතක් කර ගැනීම් වශයෙන්, සැකෙවින් කියනවනම් ලෝකයේ සම්මත උපධි සංකල්පය මොකක්ද? කෙනෙකුගේ මමත්වය රඳාපවතින්නට උපකාර වන, රන් රිදී මුතු මැණික් මිල මුදල් ගේ දොර ඉඩකඩම් වස්තු සම්භාරය, දේපොල සමූහය, තැන්පතු සමූහය, ඒ හැම එකක්ම උපධි හැටියට සළකනව සාමාන්‍ය අර්ථයෙන්. [2]ශාසනික අර්ථයෙන්, ධර්මානුකූලව ගැඹුරින් සළකල බැලුවොත් උපධි' කියල කියන්නෙ මේ පඤ්චුපාදානස්කන්ධයට.

උපාදානස්කන්ධ - උපාදානස්කන්ධ කියල කියන්නේ අල්ලාගැනීම් ගොඩක්. අල්ලාගැනීම් ගොඩක් කියන කොට මෙතන ද්‍රව්‍ය වශයෙන්, වස්තු වශයෙන් සළකන්න දෙයක් නැහැ. නමුත් මේ අල්ලාගැනීම් ගොඩම, අර තණ්හා මාන දිට්ඨි පපඤ්චවලට යටවුනු, ලෝක ව්‍යවහාර වලට යටවුනු පෘථග්ජනයා, කල්පනා කරනව ඒ අල්ලා ගැනීම් ගොඩ අල්ලා ගත්තු **දෙයක්** හැටියට, තැන්පතු හැටියට. අල්ලා ගෙන තැන්පත් කරගත්තු දේවල් හැටියට සැළකීමෙන් තමයි උපධි සංකල්පය ඇතිවෙන්නෙ. එතකොට මේ එකම දේ පිළිබඳව බලන දෘෂ්ටි කෝණයක වෙනසයි. මේ තණ්හා මාන දිට්ඨි මඟින් කල්පනා කරගන්නව මෙතෙක් අල්ල ගත්තු දේවල්, අල්ල ගන්න තිබෙන දේවල් දැන් මේ අවස්ථාවේ අල්ලාගන්න දේවල් වගේ. ඒ හැම එකක්ම හරියට අර සේප්පුවක දල තැන්පත් කරගත්තු දේවල් වගේ හිතාගන්නව. අන්න එහෙම එකතුවෙච්ච උපධිගොඩක් තමයි මේ ලෝකයා බදාගෙන සිටින්නෙ. එතකොට ඒ උපධීන් අතහැරීම තමයි මේ නිවන කියල කියන්නෙ. ඒ විදියට එකතුකරගත්තු උපධි අතහැරීම. මේ උපධි අතහැරීමට එක්තරා විදියක අවබෝධයක් අවශ්‍යයි. ප්‍රඥා ආලෝකයෙන් මේ උපධිවල නිස්සාරත්වය දකින්න ඕන. උපධිවල නිස්සාරත්වය දැකීමෙන්මයි උපධි අතහරින්නෙ. අතහරිනව නොවෙයි ඇත්ත වශයෙන්ම අතහැරෙන විදියෙ තත්ත්වයක් එනව. මේක අපි තරමක් දුරට උපමාවක් වශයෙන් අර කලින් දේශනයකදී සඳහන් කළා. නැවතත් ඒක මතුකරගනිමු. අපට හුඟක් උපකාර උනා සිනමා දර්ශනය.

සිනමා දර්ශනය ආශ්‍රයෙන් උපධිපටිනිස්සග්ගය ඒ අවස්ථාවෙ විස්තර කළේ හදිසියේම අර ශාලාව ඒකාලෝක උනාම එතෙක් චිත්‍රපටිය නරඹමින් සිටිය ඒ නරඹන්න තුළ එකතුවෙලා තිබුනු - එතනදී ඒ පුද්ගලයට උපධි හැටියට සැළකෙන්නෙ අර කථාන්තරයට සම්බන්ධ, ඒ සිනමා ලෝකයට අදාළ තැන්පතු ගොඩයි - අන්න ඒ තැන්පතු සමූහය ඉබේම අතහැරෙනව. ඒ කියන්නේ, අර ආලෝකය ආවාම තේරුම්ගන්නව මේක මායාවක්, මැවීම් ගොඩක්, කියන ඒ අවබෝධය එනව. අන්න ඒ විදියට තමයි උපධීන් අත හැරෙන්නෙ. එහෙමත් නැත්නම් තව ටිකක් විස්තර වශයෙන් සළකනව නම්, ඒ ශාලාව ඒකාලෝක වෙනවත් එක්කම ඒ චිත්‍රපටිය හා සම්බන්ධ සංස්කාර - සංස්කාර කියන වචනය ඇත්ත වශයෙන්ම නාට්‍යවලට අයිති වචනයක්, ඒ නළුනිළියන් ආදීන් එහෙම නැත්නම් නොයෙකුත් කෘත්‍රිම ක්‍රමවලින් කරන මවාපෑම් රාශිය - ඒ සංස්කාර වල යථාස්වභාවය අවබෝධ වෙනව. ශාලාව හදිසියෙන් ඒකාලෝක උනාම ඒ නරඹන්න සිනමා ලෝකයෙන් ගිලිහෙන්නෙ කොහොමද? අර සංස්කාර සමනය වෙනව. 'සබ්බසංඛාර සමථො' - ඊළඟට ඒ නිසාම එතෙක් සැබෑ හැටියට, තාත්ත්වික හැටියට හිතාගෙන එකතු කර ගෙන තිබුන අත්දැකීම් රාශිය නැතිවෙල යනව. 'සබ්බූපධි

පටිනිස්සග්ගො' - ඒක නැතිවුනාට පස්සේ ඉදිරියට එන ජවනිකා රසවිඳීමට අවශ්‍යවන, ආස්වාද කිරීමට අවශ්‍ය වන, තණ්හාව නැතිවෙනව - තණ්හක්ඛයො - ඒ තණ්හාව නැතිවීම නිසා ඊට පස්සෙ එන ජවනිකාවල විචිත්‍රත්වය මැකිල යනව - 'විරාග' - එහෙම මැකිල යනකොට අර චිත්‍රපටිය යන්ත්‍ර වශයෙන් නොනැවැත්වුවත් ඒ තැනැත්තාට චිත්‍රපටිය නැවතිලා - 'නිරොධ' - ඒ නිරෝධය නිසාම ඒ තැනැත්තා අර සිනමා ලොවේ නොයෙක් විදියේ කෙලෙස්වලින් රත්වෙලා හිටපු ඒ රත්වීම් ඔක්කෝම නිවිල යනව - 'නිබ්බාන'. එතකොට එතනම තියෙනව අපි මේ නිවනට ගත්තු සිනමාවේ කතන්දරය. ඔන්න සිනමා ලොවේ අවදිවීමෙන් අපට තේරුම්ගන්න පුළුවන් ඒ උපධි අතහැරෙන්නෙ යම්කිසි අවබෝධයකින්. ප්‍රඥා ආලෝකයකින්. මේක ඇත්ත වශයෙන්ම අපේ හිතේම තහවුරු විය යුතු කාරණයක් නිසා අපි තව ටිකක් නිදසුන් දෙන්න බලමු.

එදිනෙදා ජීවිතයෙත් මේ විදියෙ සමහර අවස්ථාවල්වල අවබෝධය නිසා උපධි අතහැරෙන බව අපට අහන්ට දකින්ට ලැබෙනව. යම්කිසි කෙනෙක් ලොකුම මුදල් නෝට්ටුවකින්, ලොකුම මුදල් ගොඩ එකතු කරගෙන සේප්පුවක තැන්පත් කරගෙන රෑ තිස්සේ නිදි නැතිව ඒක ආරක්ෂා කරමින් සිටිනව. එක දවසක්දා උදේ පාන්දර නැගිට්ට හැටියෙ ප්‍රවෘත්ති මාධ්‍යයෙන් දැනගන්ට ලැබෙනව කලින් දවසේ රෑම යම්කිසි හේතුවක් නිසා අර මුදල් නෝට්ටුව සම්පූර්ණයෙන්ම අවලංගු කළ බව. එතකොට අර පුද්ගලය ඊට පස්සේ අර නෝට්ටු ගොඩ දිහා බලන්නේ කොහොමද? නිකම්ම කඩදාසි ගොඩක්. ඒ නෝට්ටු හා සම්බන්ධව තිබුන තණ්හාව, මානය, දෘෂ්ටිය එහෙම පිටින්ම නැති වුනා. නෝට්ටුව අවලංගු උනා. ඊට පස්සේ සමහර විට ඒ නෝට්ටුවලින් ගිනිතපිනව අර පුද්ගලය. ගිනිබත් කරනව. ඔන්න ඒකත් එක්තරා විදියක උපධිපටිනිස්සග්ගයක්, තාවකාලික නමුත් උපධිපටිනිස්සග්ගයක් ලෝකයේ සිදුවන.

අපි හිතල බලමු තවත් කෙනෙක් හදිසි ස්ථාන මාරුවක් ලැබිල සියලුම බඩුබාහිරාදිය, චංචල දේපොල - නිශ්චල දේපොල ගෙන යන්න බැරිනිසා දල යනව - නමුත් චංචල දේපොල ටික එකතුකර ගන්නව. උපධිටික එකතු කර ගන්නව අලුත් ස්ථානයට අරගෙන යන්න. වාහනයත් ඇවිල්ල ප්‍රමාදය අභවන නලාහඬ නගනව. වෙලාවත් පහුවෙන්න ගිහිල්ල. නමුත් මේ තැනැත්තගෙ සූදානම්වීම අවසාන නැහැ. ලොකු රත්වීමකින්, නොසන්සුන්කමකින්, එහාට මෙහාට දුවනව, නමුත් තාම ඉවර නැහැ, ඒ සූදානම් වීම. බැරිම තැන, මීට වඩා ප්‍රමාදවීම හොඳ නැහැ කියල හැඟෙන අවස්ථාවේදී, අතට අහුඋන දෙයක් අරගෙන ඉහින් කනින් එල්ලගෙන දොරකඩ ළඟට පුළුවන් වේගෙන් දුවගෙන යනව. ඒ එක්කම ඇහැ ඇරෙනව. මේ දැක්කෙ **හීනයක්**, ස්ථාන මාරුව ලැබුනෙ **හීනෙන්**. ආපු වාහනේකුත් නැහැ.

කළ සුදානමකුත් නැහැ. අන්තිමට ඉතුරු වෙන්නෙ හතිය විතරයි. ඔන්න එතකොට ඔතනත් එක්තරා විදියක සිහින ලෝකෙන් අවදිවීමක්. මෙයින් අපට පේනව ඒ සිහිනය හා සම්බන්ධ උපධි ගිලිහීමේ අවස්ථාව. මේ අපි නිතර අත්දකින කාරණයක්. අපි කිව්ව දැන් මේ සිහිනලෝකයෙන් සැබෑලෝකයට මාරුවෙන කොට සිහින ලෝකය හා සම්බන්ධ උපධි ගිලිහෙන බව. නමුත් ඇත්ත වශයෙන්ම සිහිනයෙන් මේ ඇතුල්වෙන්නෙ සැබෑලෝකයකටද? සිහිනෙන් අවදිවෙනව කියල කියන්නේ නියම අවදිවීමක්ද? නියම ඇස් ඇරීමක්ද? කියන එකත් ප්‍රශ්නයක්. ධර්මානුකූලව කල්පනා කරල බලනකොට සිහිනයෙන් අවදිවීම නියම අවදිවීමක්ද? 'බුද්ධ' 'බෝධි' 'සම්බෝධි' ආදී පද වල තියෙනව අවබෝධය පමණක් නොවෙයි, 'අවදිවීම' කියන අර්ථයත්. සමහර අවස්ථාවල්වල ඒක මතුකරල දීලත් තියෙනව ධර්මයෙ. මේක එක්තරා අවදිවීමක්. ඊළඟට ධම්මචක්ඛු', පඤ්ඤාචක්ඛු 'චක්ඛුං උදපාදි'' ආදී ඒ ධර්මයෙ යෙදිල තියෙන පදවලින් ඇසක් පහළවීම ගැන කියවෙනව. අපි කාටත් ඇස් තියෙනව. නමුත් ඇසක් පහළවීම ගැන කියවෙනව. ඉතින් මෙයින් අපට හැඟෙන්නෙ මේ නිවන පිළිබඳව කථාකරන කොට, ධර්මයෙ ගැඹුරු පක්ෂය ගැන කථා කරන කොට, අර සිහිනයෙන් අවදිවීම නියම අවදිවීමක් නොවෙයි. තවත් සිහින ලෝකයකට ඇතුල්උනා වගේ වැඩක්. නමුත් ඊළඟට අපි බලමු මේ උපධි සංකල්පය ගැඹුරට යන හැටි.

මේ සංසාර සිහිනය - දැන් එතකොට සංසාර සිහිනයයි අප ඉදිරියෙ තිබෙන්නෙ - මේ සංසාර සිහිනෙන් මිදීමට නම්, මේ සංසාර සිහිනයට අදාළ සියලුම උපධීන් නිසසාර බව යම්කිසි ආකාරයකින් වැටහෙන්න ඕන. ඒක වැටහෙන්නෙත් එක්තරා ආලෝකයකින් බව කලින් දවසෙ සාකච්ඡා කළ බාහිය සූත්‍රයෙ උදාන ගාථාවෙන්ම පෙනී ගියා. අපි ඒ අවස්ථාවෙ ප්‍රකාශ කළා ලෝකයා ලෝකය හැටියට සළකන මේ 'සළායතන ලෝකය' - සපර්ශායතන සම්බන්ධ ලෝකය - අර බාහිය සූත්‍ර උදාන ගාථාව පසුබිම් කරගෙන විමසල බලන කොට, හරියට, පළාදැමීමට තරම් ඝනවූ මෝහාන්ධකාර පටලයක් තුළ ක්‍රියාත්මක වන පටු ආලෝකධාරා හයක් පමණයි. ඒ අන්ධකාරය නිසාම අර ඉරත් හඳත් තරුත් බැබලෙන බවයි එදා අපි ප්‍රකාශ කළේ. 'විඤ්ඤාණං අනිදස්සනං අනන්තං සබ්බතො පහං' කියල කියන ඒ 'සබ්බතො පහ' - හැම පැත්තෙන්ම ප්‍රභාවත් වූ - අනිදස්සන විඤ්ඤාණයේ ඉරත් හඳත් තරුත් නැතෙයි කියල කිව්වෙ ඒවාට බැබලීමට අවශ්‍ය අන්ධකාරයක් එතන කොහෙත්ම නැති නිසයි. රූප අරූප නැතිවෙන්නෙත්, අරූපය රූපයේ සෙවනැල්ලක්. සෙවනැල්ලක්වත් ඉතිරි වන්නේ නැහැ. මක් නිසාද? අර විනිවිද යන ප්‍රඥාව නිසා. ඒ කාරණා අපි එදා ප්‍රකාශ කළා. එතකොට දැන් මෙයින් තේරෙනව මේ නිවනින් කියවෙන 'සබ්බූපධිපටිනිස්සග්ගය' අර අනික් තාවකාලික අවදිවීම් වගේ නොවෙයි.

කලින් අපි උපමා වශයෙන් ගත්තු අවදිවීම් තුනම තාවකාලික අවදිවීම්. සිනමා ලොවේ අවදිය ඉතාමත්ම තාවකාලිකයි. ඒ සිනමා ලෝලය හදිසියේ බලාපොරොත්තු නැති ආකාරයට ශාලාව ඒකාලෝක වීම නිසා ඒ දර්ශන ගැන කළකිරුනට මොකද නැවතත් ශාලාව අඳුරු වෙලා චිත්‍රපටය ඇරඹෙන කොට, එහෙම නැත්නම් ශාලාව අඳුරුඋන හැටියේ තමන් දන්නෙවත් නැතිව කාමාශ්‍රව, භවාශ්‍රව, අවිජ්ජාශ්‍රව ගලාගෙන ඇවිල්ල අර පුද්ගලය ආයෙත් අර සිනමාලෝකයෙ අතරමං වෙනව. ඊළඟට අර නෝට්ටුව ගැන කියාපු කාරණයත් එහෙමයි. ඒ අවලංගුවුනු නෝට්ටු පිළිබඳ තණ්හා මාන දිට්ඨි නැති උනාට මොකද වලංගු නෝට්ටු සොයා ගෙන යනව ඊට පස්සේ. ඊළඟට සිහිනලොවේ අවදිවීමත් තාවකාලික බව අපි කවුරුත් දන්නව. ඊළඟට නිඳට ගියාට පස්සේ ආයෙත් සිහින දකිනව. මේ විදියේ තාවකාලිකත්වයක් නොවෙයි මේ නිවන පිළිබඳව අවදිවීම. ඊට හේතුව සංසාරයේ ඒ නිඳට අදින, සිහින වලට අදින, සංසාර සිහිනයට අදින, සියලුම ආශ්‍රවයන් ඒ ප්‍රත්‍යක්ෂ ඥානයෙන්, පූර්ණ ප්‍රත්‍යක්ෂ ඥානයෙන්, එහෙම පිටින්ම විනාශවෙනව. වියලිල යනව. ක්ෂය වෙනව. ආසවක්ඛය' කියන පදය නිවන හැඳින්විමට මූලික පදයක් හැටියට සූත්‍රවල යෙදිල තියෙන්නෙත් ඒ නිසයි. රහතන් වහන්සේල මේ හපන්කම කරන්නේ අරහත්ඵල සමාධියෙදි.

මේ අර්හත්ඵල සමාධිය පිළිබඳව සෑහෙන පමණ සූත්‍රවල සඳහන් වෙනව. නමුත් ඒව ගැන කියැවෙන සූත්‍ර වෙන ආකාරයකටයි තේරුම් කරන්නේ. මෙතන යම්කිසි අභිරහසක් තියෙනව. ඒක නිසා අපට ටිකක් සවිස්තරව මේ ගැන කියන්නත් සිද්දවෙනව. අර බාහිය සූත්‍ර උදාන ගාථාවෙනුත් අපට පෙනීගියා, රහත් සිතක සැටි දක්වන සමහර සූත්‍රදේශනා, වරදවා විපරිත අඳමින් තේරුම් කිරීම නිසා, මේ නිබ්බානය පිළිබඳ මහා අවුලක් ඇති වෙලා තියෙන බව. ඒකට හේතුව ඇත්ත වශයෙන්ම අර්හත්ඵල සමාධිය මහ ආශ්චර්‍යවත් එකක්. ලෝකයාට හිතන්නත් බැරිතරම් මහ පුදුම විදියෙ දෙයක්. ඔය කාරණයම තමයි රතන සූත්‍රයෙම බුදුපියාණන් වහන්සේ ප්‍රකාශකරල තියෙන්නෙ පැහැදිලිවම –

**'යං බුද්ධ සෙට්ඨො පරිවණ්ණයී සුචිං**
**සමාධිමානන්තරිකඤ්ඤමාහු**
**සමාධිනා තෙන සමො න විජ්ජති**
**ඉදම්පි ධම්මෙ රතනං පණීතං**
**එතෙන සච්චෙන සුවත්ථිහොතු'[3]**

යම්බඳු පිරිසිදු වූ සමාධියක් බුඩශ්‍රේෂ්ඨයාණන් වහන්සේ නිතර නිතර වර්ණනාකර ඇත්ද, යම් සමාධියකට ආර්යයන් වහන්සේලා ආනන්තරිකයයි කියත්ද. ආනන්තරික යන නම දෙත්ද, 'සමාධිනා තෙන සමො න විජ්ජති' ඒ සමාධිය හා සමවූ අනික් සමාධියක් නම් නැත. 'ඉදම්පි ධම්මෙ රතනං

පණීතං, නිර්වාණ ධර්මය පිළිබඳ මේකත් ප්‍රණීත රතන ස්වභාවයක්. මේ සත්‍යයෙන් ඔබට යහපතක් වේවා. කියන එකයි මේ ගාථාවෙ අදහස. එතකොට මේ අසමසම සමාධිය, මේ අසමසම අරුම පුදුම සමාධිය, ඇත්ත වශයෙන්ම නිවන පිළිබඳව ගැටලු ඇතිවීමට එක හේතුවක් වී තිබෙනව. මේ අර්හත්ඵල සමාධිය පුදුම දෙයක් වන්නේ මෙතැන කියවෙනව විශේෂයෙන්ම 'ආනන්තරික' කියල වචනයක්. අපි ඒ වචනය ඔස්සේ ටිකක් විමසල බලමු මෙතන කියවෙනව අර්හත්ඵල සමාධිය 'ආනන්තරික' නමිනුත් හඳුන්වන බව.

මේ 'ආනන්තරික' කියල කියන්නේ මේ නිවන පිළිබඳ ප්‍රත්‍යක්ෂයේ එක්තරා විශේෂත්වයක් අඟවන පදයක්. අරහත් මාර්ග ඥානයෙන් කෙලෙස් ක්ෂය කළාට අනතුරුවම, ඒ එක්කම නිවන පිළිබඳ - නිවන කියල කියන්නෙ භව නිරොධය, සළායතන නිරෝධය - ප්‍රත්‍යක්ෂයකුත් ලැබෙනව. අපි අර කලින් අවස්ථාවක කිව්වෙ විභාගෙට ලියල ඉවරවෙනකොටම ප්‍රතිඵල ආව කියල. ආයිත් ප්‍රතිඵල එනකං බලාපොරොත්තුවක් අවශ්‍ය නැහැ කියල. අන්න ඒ වගේ. අන්න ඒ 'අනන්තරා'. අනතුරුවම පූර්ණ ප්‍රත්‍යක්ෂයක් ලැබෙනව. ඒ පූර්ණ ප්‍රත්‍යක්ෂය අඟවන විශේෂ වචනයක් තියෙනව. 'අඤ්ඤ' කියන එක. ඒ වචනය ඉතාමත්ම වැදගත්. අඤ්ඤ කියල කියන්නෙ - 'ආජානාති' කියන පදයෙන් එන්නෙ. - පූර්ණ වශයෙන් අවබෝධ කර ගැනීම. අර්හත්ඵල සමාධිය හඳුන්වනව 'අඤ්ඤඵල සමාධි' 'අඤ්ඤ විමොක්ඛ' ආදි නම්වලිනුත්. මේ 'අඤ්ඤ' කියන වචනය ඉතාමත්ම වැදගත් වචනයක්. දැනීම දැනගැනීම හඟවන 'ඤා' කියන ධාතුවෙන් නිෂ්පන්න පද රාශියක් අපට මේ සූත්‍ර දේශනාවල හමුවෙනව. 'සඤ්ඤා, විඤ්ඤාණ, පඤ්ඤා, ඤාණ, අභිඤ්ඤා, පරිඤ්ඤා, අඤ්ඤ' - සඤ්ඤා කියන්නෙ හඳුනා ගැනීම. විඤ්ඤාණ කියන්නෙ වෙන්කොට දැනගැනීම. අපි කෙටියෙන් සැළකුවොත් - පඤ්ඤා කියන්නේ ප්‍රකට වශයෙන් දැන ගැනීම. ඤාණ කියල කියන්නෙ දැනීම. අභිඤ්ඤා කියන්නෙ විශේෂ වශයෙන්, විශිෂ්ට වශයෙන් දැන ගැනීම, පරිඤ්ඤා කියන්නෙ පිරිසිඳ දැනගැනීම. අඤ්ඤ කියල කියන්නෙ 'ආජානාති' සම්පූර්ණ වශයෙන්ම සහතිකවීමට පුළුවන් තරම් ප්‍රත්‍යක්ෂවශයෙන්ම දැන ගැනීමයි. මේ 'අඤ්ඤ' කියන වචනයට ලැබුනු වැදගත් තැන හෙළිවන තවත් ගාථා යුගලයක් අපට ඉතිවුත්තකයෙ තිකනිපාතයෙන් හමුවෙනව.

> **'සෙඛස්ස සික්ඛමානස්ස - උජුමග්ගානුසාරිනො**
> **ඛයස්මිං පඨමං ඤාණං - තතො අඤ්ඤා අනන්තරා**
> **තතො අඤ්ඤා විමුත්තස්ස- ඤාණං වෙ හොති තාදිනො**
> **අකුප්පා මෙ විමුත්තීති - භව සඤ්ඤොජනක්ඛයෙ'[4]**

'සෙඛස්ස සික්ඛමානස්ස උජුමග්ගානුසාරිනො'- ඍජු වූ ආර්‍යඅෂ්ටාංගික මාර්ගය අනුව යමින් හික්මෙන්නාවූ සෙඛ පුද්ගලයාට 'ඛයස්මිං පඨමං ඤාණං' -ක්ලේශක්ෂය පිළිබඳව පළමුවෙන්ම ඤාණය උපදිනව. 'තතො අඤ්ඤා අනන්තරා'. ඊට අනතුරුවම 'අඤ්ඤා' නම් වූ අර්හත්ඵලය, ඒ නිර්වාණ ප්‍රත්‍යක්ෂය ලැබෙනව. 'තතො අඤ්ඤා විමුත්තස්ස - ඤාණං වෙ හොති තාදිනො'- ඒ විදියට පූර්ණ පත්‍යක්ෂයෙන්, පූර්ණ අවබෝධයෙන්, නිවන් දුටු පුද්ගලයාට. ඒ 'තාදී' පුද්ගලයාට, 'එහෙවු' පුද්ගලයාට, ස්ථිරසාර පුද්ගලයාට, ඥානයක් ඇතිවෙනව. 'අකුප්පා මෙ විමුත්ති' ති - මගේ මේ විමුත්තිය, මගේ මේ චෙතො විමුත්තිය අකොප්‍යයි. 'අකම්ප්‍යයි' අචලයි. මක්නිසාද 'භව සඤ්ඤොජනක්ඛයෙ' - භව සංයෝජන ඔක්කොම ක්ෂය වෙලා කැඩිල ගිහිල්ල, නිසා. ඔන්න එතකොට මේක කීප අතකින්ම බොහොම ස්ථිරසාර ප්‍රත්‍යක්ෂයක් බව මේ ගාථාවලිනුත් අපට පැහැදිලි වෙනව. දැන් ඇත්ත වශයෙන්ම මේ ගාථාදෙක ඒ සූත්‍රයේ ඉදිරිපත් කරල තියෙන්නෙ බුදුරජාණන් වහන්සේ, මේ නිර්වාණාවබෝධය පිළිබඳව වැදගත්වන ධර්ම තුනක් හැඳින්වීම් වශයෙන්. ඒ ධර්ම තුන හඳුන්වල තියෙන්නේ ඉන්ද්‍රිය නාමයෙන් - 1. අනඤ්ඤාතං ඤස්සාමීතින්ද්‍රිය, 2. අඤ්ඤින්ද්‍රිය 3. අඤ්ඤාතාවින්ද්‍රිය කියන ඉන්ද්‍රිය තුන හැඳින්වීම් වශයෙනුයි, මේ ගාථා දෙක ප්‍රකාශ කරල තියෙන්නේ. 'අනඤ්ඤාතං ඤස්සාමීතින්ද්‍රිය' කියන වචනෙත් තියෙනව මේ 'අඤ්ඤා' කියන වචනය. 'අඤ්ඤා' වශයෙන්, සම්පූර්ණ වශයෙන්, එතෙක් අවබෝධ නොකළාවූ යමක් අවබෝධ කරන්නෙමි යන - එතන කියන්නේ 'ඛයස්මිං පඨමංඤාණං' කියන එකේ හැඳින්වීමමයි. පළමුවෙන් ලැබෙන කෙලශක්ෂය පිළිබඳ ඒ ඥානය හඳුන්වල තියෙන්නෙ එතන 'අනඤ්ඤාතංඤස්සාමීතින්ද්‍රිය' කියල.

ඊළඟට 'තතො අඤ්ඤා අනන්තරා' කියල ප්‍රකාශ කළේ අන්න අර අඤ්ඤින්ද්‍රිය. ඒක ඉතාම පැහැදිලියි. 'අඤ්ඤා නමැති ඉන්ද්‍රිය අඤ්ඤින්ද්‍රිය.

ඊළගට 'අකුප්පා මෙ විමුත්තීති' කියල ඒ විදියට එන ඥානය, තුන්වෙනුව කියාපු ඒ ඥානයෙ අකෝප්‍ය බව විමුක්ති ඥාන දර්ශනයයි. ඇත්ත වශයෙන්ම ඒක තමයි අර 'අඤ්ඤාතාවින්ද්‍රිය' කියල කියන්නෙ. ඒ අඤ්ඤාව ලබාගෙන සම්පූර්ණ කරගත්තු තැනැත්තා. මේ දෙක අතරෙ බොහොම සියුම් වෙනසක් තියෙන්නෙ. උදාහරණයක් හැටියට ගත්තොත්, 'භුත්තාවී පවාරිතො' කිව්වොත් 'භුත්ත' කියල කියන්නෙ කාල ඉවරකළ. 'භුත්තාවී පවාරිතො' කිව්වොත්, කාල ඉවරකළා පමණක් නොවෙයි, ආහාර වළඳල ඉවරකළා විතරක් නෙවෙයි, අතත් වසනව, තවත් එපා කියල. හොඳටම ඒක ස්ථිරයි. මගේ මේ විමුත්තිය අකෝප්‍යයි කියල කිව්වෙ අන්න අර අඤ්ඤාතාවින්ද්‍රියෙන්. 'ඒක එහෙම පිටින්ම ස්ථිරයි. විමුක්ති ඥාන දර්ශයෙනුත් තහවුරු වෙලා තියෙනව. ඔන්න ඔය විදියට අපට හිතාගන්න පුළුවන්. මේ අර්හත්ඵල සමාධියෙ එක අංශයක් අපි මේ ආනන්තරික කියන වචනය ඔස්සේ ගිහිල්ල දැක්වුයෙ.

ඊළඟට අර රතන සූත්‍ර ගාථාවෙ දක්වල තියෙන ආකාරයට, ඇත්තවශයෙන්ම බුදුරජාණන් වහන්සේ විසින් මේ අසමසම අරුමපුදුම සමාධිය නොයෙකුත් සූත්‍ර දේශනාවල වර්ණනා කරල තියෙනව. යම්කිසි හේතුවක් නිසා ඒවා පිළිබඳව අටුවාචාරීන් වහන්සේල - සමහර විට නිපාත පද ගැන පිටු ගණන් දැක්වුවත් - ඒවා පිළිබඳව සමහරවිට වචන දෙක තුනක අටුවාවකින් ඉවරකරල තියෙනව. අපි අන්න එබඳු සූත්‍ර කීපයක් ඉදිරියට ගනිමු. අඞ්ගුත්තර නිකායෙ ඒකාදසම නිපාතයෙ- ඒකාදසම නිපාතය කියනකොට අගකෙළවර - එනව සූත්‍රයක් සන්ධ සූත්‍රය කියල. ඒ සන්ධ සූත්‍රයේදී බුදුරජාණන් වහන්සේ සන්ධ ස්වාමීන් වහන්සේට ප්‍රකාශ කරනව එක්තරා භද්‍ර වූ ආජානීය පුරුෂයකු වඩන අරුම පුදුම සමාධියක් ගැන. මහ පුදුම විදියේ සමාධියක් ඒ විස්තර කරන්නෙ. ඒ සමාධියේ ලක්ෂණ මෙන්න මෙහෙමයි කියැවෙන්නේ. ඒ පුද්ගලය ඒ සමාධියේදී -

**'සො නෙව පඨවිං නිස්සාය ඣායති න ආපං නිස්සාය ඣායති න තෙජං නිස්සාය ඣායති නවායං නිස්සාය ඣායති නආකාසානඤ්චායතනං නිස්සාය ඣායති න විඤ්ඤාණඤ්චායතනං නිස්සාය ඣායති න ආකිඤ්චඤ්ඤායතනං නිස්සාය ඣායති න නෙවසඤ්ඤානාසඤ්ඤායතනං නිස්සාය ඣායති න ඉධලොකං නිස්සාය ඣායති න පරලොකං නිස්සාය ඣායති යම්පිදං දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං පත්තං පරියෙසිතං අනුවිචරිතං මනසා තම්පි නිස්සාය න ඣායති, ඣායති ච පන. එවං ඣායිංච ඛො සන්ධ භද්‍රං පුරිසාජානියං සඉන්‍දදෙවා සපජාපතිකා ආරකාව නමස්සන්ති.'**

**නමො තෙ පුරිසාජඤ්ඤ - නමො තෙ පුරිසුත්තම**
**යස්ස තෙ නාභිජානාම - යම්පි නිස්සාය ඣායසි.**[5]

මේ සූත්‍රයෙ අදහස අපි කියමු ඊළඟට. මේ කියන ධ්‍යානයේදී මේ භද්‍ර වූ ආජානීය - ආජානීය අශ්වය කියලයි. කියන්නේ, ඒ අශ්වයෙකු පිළිබඳ උපමාවකටත් සම්බන්ධ කරලයි මේක දක්වන්නෙ. ඒ උපමා දිග කතන්දර අපි කියන්න යන්නෙ නෑ - මේ ආජානීය භද්‍ර වූ පුරුෂයා වඩන මේ පුදුම සමාධියෙ කොහොමද ලක්ෂණ: සො නෙව පඨවිං නිස්සාය ඣායති 'හෙතෙම පෘථිවිය ඇසුරු කරගෙන ධ්‍යානය වඩන්නේ නැහැ. පෘථිවිය අරමුණු කරගෙනත් ධ්‍යානය වඩන්නෙ නැහැ. පොළොව අරමුණු කරගෙන කියලම අපි කියමු. පොළොව අරමුණු කරගෙන ධ්‍යානය වඩන්නෙත් නැහැ. ජලය අරමුණු කරගෙන ධ්‍යානය වඩන්නෙත් නැහැ. ගින්න අරමුණු කරගෙනත් නොවෙයි. වායුව අරමුණු කරගෙනත් නොවෙයි. ආකාසානඤ්චායතනය විඤ්ඤාණඤ්චායතනය ආකිඤ්චඤ්ඤායතනය, නෙවසඤ්ඤානාසඤ්ඤායතනය, ඒ එකක්වත් අරමුණු කරගෙන නොවෙයි. රූප අරූප දෙකම ඉවරයි එතකොට. ඊළඟට 'න ඉධ ලොකං නිස්සාය' - මේ ලෝකය මුල්කරගෙනත් නොවෙයි.

පරලෝකෙ පිළිබඳවත් නොවෙයි. ඊළඟට ඔන්න ඔක්කොම අහුවෙන හැටියට පාඨයක් තිබෙනව - යම්පිදං දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං, පත්තං, පරියෙසිතං, අනුවිචරිතං මනසා තම්පි නිස්සාය න ඣායති' යම්තාක් දුටු ඇසූ දැනුන, සිතින් දැනගත්, සිතින් පැමිණියාවූ, පර්යේෂණ වශයෙන් සොයා බැලූ, විචාරා බැලූ ඒ කිසිවක් පිළිබඳවත් නොවෙයි මේ ධ්‍යානය වඩන්නෙ. එතකොට කෙනෙකුට හිතෙන්න පුළුවන් ධ්‍යානයක් වඩන්නෙ නැහැ කියල. ඊළඟට ඒක අවධාරණය කිරීමටයි බුදුරජාණන්වහන්සේ, ප්‍රකාශ කරන්නෙ - 'ඣායති ච පන' - එසේ වී නමුත් ධ්‍යානයක්ද වඩයි. ඊළඟට - 'එවං ඣායිංච පන සන්ධ' - එබඳුවූ ධ්‍යානය වඩන්නාවූ ඒ භද්‍ර වූ ආජානීය පුරුෂයා වෙත ඉන්ද්‍ර ප්‍රජාපතී ඇතුළු දෙවියන් ඇවිල්ල ඈතින් ඉඳගෙනම - කොයිතරම් ගෞරවයකින්ද - නමස්කාර කරනව මෙන්න මෙහෙම ගාථාවක් කියල.

**'නමො තෙ පුරිසාජඤ්ඤ - නමො තෙ පුරිසුත්තම**

**යස්ස තෙ නාභිජානාම - යම්පි නිස්සාය ඣායසි'**

'ආජානීය පුරුෂය, ඔබට නමස්කාර වේවා. පුරුෂෝත්තමය, ඔබට නමස්කාර වේවා. යම් බඳු වූ ඔබ යමක් ඇසුරු කොට ගෙන ධ්‍යානය වඩන්නෙහිද, එය අපි නොදනිමු.' මෙයින් පෙනෙනව මේකෙ අරුම පුදුම සවභාවය.

ඊළඟට සන්ධ ස්වාමීන් වහන්සේ විමසනව බුදුරජාණන් වහන්සේගෙන් 'කථං ඣායිං' - කොයි විදියට ධ්‍යාන වඩනකොටද මෙහෙම වෙන්නෙ කියල. ඒකට පොඩි පැහැදිලි කිරීමක් වශයෙන් බුදුපියාණන් වහන්සේ ප්‍රකාශ කරනව ඒ ධ්‍යානය වඩන අවස්ථාවේදී ඒ භද්‍ර වූ ආජානීය පුරුෂයාට 'පඨවිසම්ං පඨවිසඤ්ඤා විභූතා, පෘථිවියෙහි, පෘථිවි සඤ්ඤාව විභූත වෙලා. ඒ වචන ගැන අපට ටිකක් කියන්න වෙනව පහුවෙලා. ඒ වගේම 'ආපස්මිං ආපො සඤ්ඤා විභූතා හොති' ඔය කියාපු එක එක අරමුණක් පිළිබඳව දිගටම නොකිව්වට තේරුම් ගන්න පුළුවන්. ඒ ආපො ආදී ඒ හැම එකක් පිළිබඳව තියෙන සඤ්ඤා 'විභූතයි'. ඒ වගේම දිට්ඨ සුත මුත විඤ්ඤාත ආදිය පිළිබඳවත්. ඒවා පිළිබඳ සංඥාවත් විභූතයි.

මේ 'විභූත' කියන වචනය අටුවාවෙ තෝරන්නෙ 'ප්‍රකටවීම' කියන අර්ථයෙන්. මෙතන එහෙමපිටින්ම සූත්‍රයෙ අර්ථය විකෘත වෙන විදියේ අර්ථකථනයක් තිබෙන්නෙ. ඇත්තවශයෙන්ම මේ විභූත අවිභූත කියන පද දෙක ප්‍රකටවීම අප්‍රකට වීම කියන අර්ථවලිනුත් යෙදෙන තැන් තිබෙනව. මක්නිසාද මේ විභව කියන වචනය එක්තරා අර්ථපරිනාමයක් ඇති වචනයක්. නමුත් මූලික අර්ථය සූත්‍රවල නිතර හමුවෙනව. දැන් භව විභව කිව්වහම පැවැත්මත් විනාශයත්, පැවැත්මත් නැතිවීමත් - එතකොට මෙතන ගන්න

තියෙන්නෙ ප්‍රකටවීම් අර්ථය නොවෙයි නැතිවීම් අර්ථය. නැති උනා කියන අදහසයි, මෙතනට ගැලපෙන්නෙ. ඒ බව වැඩියත් පැහැදිලි වෙනව සූත්‍රයෙ මුල්කොටසෙන්. දිගටම තියෙන්නෙ 'න' කාරය. 'නෙව පඨවිං නිස්සාය ඣායති න ආපං නිස්සාය ඣායති' ඔය ආදි වශයෙන් අර කියාපු එක සඤ්ඤාවක්වත් නැතිබවයි ප්‍රකාශ වෙන්නෙ. ඒව ප්‍රකට බවක් නොවෙයි. නමුත් මේ සූත්‍රයේ අර්ථය පිළිබඳ නොතැකීමෙන් දෝ අටුවාව අර ප්‍රකට වීම කියන අර්ථය මෙතන දීල තියෙනව. තවදුරටත් කෙනෙකුට මේක ගැන සැකයක් උපදිනවනම්, සූත්‍රවල 'විභූත' වචනය ඇත්ත වශයෙන්ම 'නැතිවූ' 'පහවූ' 'ඉක්ම ගියාවූ' කියන අර්ථයෙන් යෙදිල තිබෙන බවට අපට සාධක දක්වන්න පුළුවනි. කලින් අවස්ථාවක අර කලහවිවාද සූත්‍රයෙන් අපි ගාථා ප්‍රකාශ කරන කොටත් එක ගාථාවක කියැවුනා. - 'කිස්මිං විභූතෙ න ඵුසන්ති ඵස්සා' - කුමක් නැතිවූ කල්හිද ස්පර්ශයෝ ස්පර්ශ නොකරන්නෙ. ඊළඟට ඒකට පිළිතුරු වශයෙන් ඊළඟ ගාථාවෙ කියැවුනා. 'රූපෙ විභූතෙ න ඵුසන්ති ඵස්සා' - 'රූපය නැති වූ කල්හි ස්පර්ශයෝ ස්පර්ශ නොකරත්. එතනත් විභූත කියන එක යෙදිල තියෙන්නෙ නැතිවූ කියන අර්ථයෙන්. තවත් ඊටත් වඩා පැහැදිලි සාධකයක් තියෙනව. සුත්ත නිපාතයෙ පාරායණ වග්ගයෙ පොසාලමාණව පුච්ඡාවෙ එන ගාථා පදයක් තේරුම් කිරීමේදී අටුවාව නිතර උපකාර කර ගන්නා චූලනිද්දෙසයෙම ඒ ගාථාවෙ සඳහන් වෙන 'විභූතරූප සඤ්ඤිස්ස' කියන පදය විග්‍රහ කිරීමේදී එතන 'විභූත' කියන පදය තෝරන්නෙ 'විගතා අතික්කන්තා සමතික්කන්තා වීතිවත්තා' ආදී පදවලින් 'විගතා' කියන්නෙ පහවූ, ඉක්ම ගියාවූ හොඳින්ම ඉක්ම ගියාවූ' ඒ වගේම නොපවතින කියන අදහස දෙන විදියටයි තෝරන්නෙ. එයිනුත් අපට පේනව මෙතන 'විභූත' කියන වචනයයි ගන්න තියෙන්නෙ. අර කියාපු එකම සංඥාවක්වත් අර සමාධියෙ නැහැ. එයින් අපට පෙනෙන්නෙ මේක මහ අමුතු විදියෙ සමාධියක්. ලෝකයා සාමාන්‍යයෙන් සමාධියකට, ධ්‍යානයකට, අරමුණු කරගන්නා කිසිම අරමුණක් මේ සමාධිය තුළ නැති බවයි.

මේ අරුම පුදුම සමාධිය ගැන බුදුරජාණන් වහන්සේගෙනුත් අනෙකුත් සංඝයා වහන්සේලාගෙනුත් විටින් විට, යම් යම් අවස්ථාවල්වල, විමසූතැන්, සූත්‍ර දේශනාවල කොතෙකුත් හමුවෙනව. බොහෝවිට ආනන්ද ස්වාමීන් වහන්සේමත් ප්‍රශ්නයක් ඉදිරිපත් කරල තියෙනව. ඒ විදියෙ එක තැනක් තියෙනව අංගුත්තර නිකායෙ එකාදසම නිපාතයෙ එන සූත්‍රයක ආනන්ද ස්වාමීන් වහන්සේ, බුදුරජාණන් වහන්සේගෙන් මේ ධ්‍යානය ගැන විමසන්නෙ හරියට - අපි සිංහලට නැගුවොත් ඒ මුල් පාඨය - 'සියා නු ඛො භන්තෙ භික්ඛුනො තථාරූපො සමාධි පටිලාභො - 'ස්වාමීනි, භික්ෂුවකට මෙහෙමත් සමාධි ප්‍රතිලාභයක් තිබිය හැකිද? මෙහෙමත් සමාධි ලැබීමක් තිබිය හැකිද? අරුම පුදුම බව අඟවන විදියට ප්‍රශ්න කරන්නෙත්. 'සියා නු ඛො භන්තෙ

තථාරූපො සමාධිපටිලාභො යථා....' කියල ඒ විදියට පටන් ගන්නව, 'ස්වාමීනි භික්ෂුවකට මෙහෙමත් සමාධි ලැබීමක් තිබිය හැකිද, කෙබඳුද - 'යථා නෙව පඨවියං පඨවිසඤ්ඤී අස්ස න ආපස්මිං ආපොසඤ්ඤී අස්ස න තෙජස්මිං තෙජොසඤ්ඤී අස්ස න වායස්මිං වායොසඤ්ඤී අස්ස න ආකාසානඤ්චායතනෙ ආකාසානඤ්චායතනසඤ්ඤී අස්ස න විඤ්ඤාණඤ්චායතනෙ විඤ්ඤාණඤ්චායතනසඤ්ඤී අස්ස න ආකිඤ්චඤ්ඤායතනෙ ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤී අස්ස න නෙවසඤ්ඤානාසඤ්ඤායතනෙ නෙවසඤ්ඤානාසඤ්ඤායතනසඤ්ඤී අස්ස න ඉධ ලොකෙ ඉධලොකසඤ්ඤී අස්ස න පරලොකෙ පරලොකසඤ්ඤී අස්ස යම්පිදං දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං පත්තං පරියෙසිතං අනුවචරිතං මනසා තත්‍රාපි න සඤ්ඤී අස්ස සඤ්ඤීච පන අස්ස'[6] ඒ කියන්නෙ මෙන්න මෙහෙමත් සමාධි ලැබීමක් තිබිය හැකිද? ඒ කියන්නෙ කලින් අසාපු කාරණයක් පැහැදිලි කර ගැනීමට අහන්න වගේ. ඒ භික්ෂුවට පෘථිවියෙහි පෘථිවි සංඥවත්, ජලයෙහි ජලසංඥවත් නැහැ, ඔය විදියට හිතාගන්න පුළුවන් - අනිත් ඒව පිළිබඳවත් එහෙමයි. නමුත් අගදී කියැවෙනව 'සඤ්ඤීච පන අස්ස' - එසේද වුවත්, අර කියන ලද කිසිම සංඥවක් නැතත් 'සඤ්ඤී ද වෙයි. අර ඉස්සෙල්ල කියැවුනා ඒ විදියෙම පාඨයක් 'නෙව පඨවිං නිස්සාය ඣායති' කියල. නමුත් ඉවරඋනේ අවධාරණාත්මකව 'ඣායති ච පන' එහෙමඋනත් ධ්‍යාන කරනව. දැන් මෙතන කියැවෙන්නෙ ඒ වගේම' සඤ්ඤාවකුත් තියෙනව. අර කිසිම සඤ්ඤාවක් ගත්තෙ නැති උනාට සඤ්ඤීද වෙනව. එතකොට බුදුරජාණන් වහන්සේ ඒකට පිළිතුරු දෙන්නෙ' 'එහෙම තිබෙන්න පුළුවන් ආනන්ද' කියල.

'සියා ආනන්ද' - එහෙම සමාධියකුත් තිබෙන්න පුළුවන් කියල බුදුපියාණන් වහන්සේ ඒක ස්ථිර කරනව. ඊළඟට ආනන්ද ස්වාමීන් වහන්සේ 'කොහොමද එහෙම තියෙන්න පුළුවන් 'කියල, තවදුරටත් අහනව. එතකොට බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනව. 'ඉධානන්ද භික්ඛු එවං සඤ්ඤී හොති එතං සන්තං එතං පණීතං යදිදං සබ්බසංඛාර සමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානන්ති එවංසඤ්ඤීච' - කියල ඔය විදියට සම්බන්ධකරනව. ඒ කියන්නෙ මෙහිලා ආනන්ද යම්කිසි භික්ෂුවක් මෙන්න මෙබඳු සඤ්ඤාවක් ඇතිව වෙසේද - මොකක්ද. අපි මේ නිතර මාතෘකා වශයෙන් ඉදිරිපත් කරන පාඨයයි එතනදී ඉදිරිපත් කරන්නෙ. 'මෙය ශාන්තය, මෙය ප්‍රණීතය, එනම් සියලු සංස්කාරයන්ගේ සංසිඳීම, සියලු උපධීන් අතහැරීම තණ්හාව ක්ෂය කිරීම, නොඇල්ම නම්වූ විරාගය, නැවැත්ම නම් වූ නිරෝධය, නිවීම නම් වූ නිබ්බානය. ඔන්න ඕකයි සඤ්ඤාව එතකොට. ඊළඟට ඕක ප්‍රකාශ කළාට පස්සෙ ආනන්ද ස්වාමීන් වහන්සේ ඒක අනුමත කළා, හොඳට අනුමෝදන් උනා, සතුට ප්‍රකාශ කළා. නමුත් ඊළඟට සැරියුත් ස්වාමීන් වහනසේ ළඟටත් ගියා. ගිහිල්ල අර ප්‍රශනයම විමසුව. බුදුරජාණන් වහන්සේ ළඟට ගිය බවක් කියන්නෙ නැතිව. සැරියුත් ස්වාමීන් වහන්සෙත්

හරියටම වචනෙන් වචනෙ ගැලපෙන ආකාරයට ඒ විදියටම පිළිතුරු දුන්න. එතකොට ආනන්ද ස්වාමීන් වහන්සේ එක්තරා ප්‍රීති වාක්‍යයක් වැනි ප්‍රකාශයක් කළා - 'අච්ඡරියං ආවුසො අබ්භුතං ආවුසො යත්‍ර හි නාම සත්‍ථු ච සාවකස්ස ච අත්‍ථෙන අත්‍ථං ව්‍යංජනෙන ව්‍යංජනං සංසන්දිස්සති සමෙස්සති න විග්ගහිස්සති යදිදං අග්ගපදස්මිං' - ආනන්ද ස්වාමීන් වහන්සේ පළකළ ප්‍රීතිවාක්‍යය පරිවර්තනය කළොත් මෙහෙමයි' ඇවැත්නි, මේක ආශ්චර්ය කාරණයක්. මේක අද්භූත කාරණයක්. කුමක්ද යම් කරුණක් පිළිබඳව ශාස්තෲන් වහන්සේගේත් ශ්‍රාවකයාගේත් ප්‍රකාශන අර්ථයෙන් අර්ථය, ව්‍යංජනයෙන් ව්‍යංජනය සමවෙනව. එකිනෙකට විරුද්ධවෙන්නෙ නැහැ. කුමක් පිළිබඳවද - **'යදිදං අග්ගපදස්මිං** - අග්‍රපදය, නිර්වාණය පිළිබඳව. දැන් එතකොට අපට හොඳටම පැහැදිලියි මේ කියන මේ සමාධිය, අර්හත්ඵල සමාධියයි. නිවන් සමාධියයි. මේක එසේ මෙසේ දෙයක් නොවෙයි., සුළුපටුදෙයක් නොවෙයි. මේ සමාධිය ගැනම සූත්‍රරාශියක් තියෙනව. අපි ඒව ඔක්කොම ගන්නව නොවෙයි. නමුත් වැදගත් හැටියට සැළකෙන කීපයක් ඉදිරියට ගන්නව.

තවත් අවස්ථාවක ආනන්ද ස්වාමීන් වහන්සේ මේ ප්‍රශ්නයම වෙනත් ආකාරයකින් විමසනව. ඒත් අංගුත්තර නිකායෙ එකාදසක නිපාතයෙ එන සූත්‍රයකයි. 'සියා නු ඛො භන්තෙ තථාරූපො සමාධිපටිලාභො යථා න චක්ඛුං මනසිකරෙය්‍ය න රූපං මනසිකරෙය්‍ය න සොතං මනසිකරෙය්‍ය න සද්දං මනසිකරෙය්‍ය න ඝානං මනසිකරෙය්‍ය න ගන්ධං මනසිකරෙය්‍ය, න ජිව්හං මනසිකරෙය්‍ය න රසං මනසිකරෙය්‍ය න කායං මනසිකරෙය්‍ය, න ඵොට්ඨබ්බං මනසිකරෙය්‍ය න පඨවිං මනසිකරෙය්‍ය, න ආපං මනසිකරෙය්‍ය, න තෙජං මනසිකරෙය්‍ය න වායං මනසිකරෙය්‍ය නආකාසානඤ්චායතනං මනසිකරෙය්‍ය, න විඤ්ඤාණඤ්චායතනං මනසිකරෙය්‍ය, නආකිඤ්චඤ්ඤායතනං මනසිකරෙය්‍ය න නෙවසඤ්ඤානාසඤ්ඤායතනං මනසිකරෙය්‍ය න ඉධලොකං මනසිකරෙය්‍ය න පරලොකං මනසිකරෙය්‍ය යමපිදං දිට්ඨං සුතං මුත විඤ්ඤාතං පත්තං පරියෙසිතං අනුවිචරිතං මනසා තමපි න මනසිකරෙය්‍ය මනසි ච පන කරෙය්‍ය[7].

'ස්වාමීනි, මෙහෙමත් සමාධියක් තිබෙන්ට හැකිද භික්ෂුවකට, කෙබඳුද - මෙතන වෙනස්වෙන්නෙ -'මනසිකරෙය්‍ය' පදයයි. ඒ වාගේම මුලින් එන පද කීපයෙත් යම්කිසි වෙනසක් තියෙනව. 'න චක්ඛුං මනසිකරෙය්‍ය' ඇස මෙනෙහි කරන්නෙත් නැහැ. රූපය මෙනෙහි කරන්නෙත් නැහැ. කණ මෙනෙහි කරන්නෙත් නැහැ. ශබ්දය මෙනෙහි කරන්නෙත් නැහැ. නැහැය මෙනෙහි කරන්නෙත් නැහැ. ගඳසුවඳ මෙනෙහි කරන්නෙත් නැහැ. දිව මෙනෙහි කරන්නෙත් නැහැ. රස මෙනෙහි කරන්නෙත් නැහැ. කය මෙනෙහි කරන්නෙත් නැහැ. ඵොට්ඨබ්බ මෙනෙහි කරන්නෙත් නැහැ. ආකාසානඤ්චායතනය, විඤ්ඤාණඤ්චායතනය, ආකිඤ්චඤ්ඤායතනය, නෙවසඤ්ඤානාසඤ්ඤායතනය - ඒ එකක්වත් මෙනෙහි කරන්'නෙ නෑ. මෙලොව මෙනෙහි කරන්'නෙ නෑ. පරලොව, අර දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං පත්තං පරියෙසිතං අනුවිචරිතං මනසා

කියාපු ඒ සියල්ලම, - ඒ කිසිවක්ම, - මෙනෙහි කරන්නෙ නෑ. නමුත් මෙනෙහි කිරීමකුත් කරනව. එතකොටත් බුදුපියාණන් වහන්සේ සඵීර වශයෙන් ප්‍රකාශ කරනව. 'එහෙම තිබිය හැකියි'. ඊළඟට අහනව ආනන්ද ස්වාමීන් වහන්සේ 'කොහොමද එහෙම තිබෙන්නෙ' කියල එතකොට නැවතත් බුදුපියාණන් වහන්සේ ප්‍රකාශ කරනව. 'මෙන්න මෙහෙම මනසිකාරයක් ඇතැම් භික්‍ෂුවකට තියෙනව. මොකක්ද, 'එතං සනතං එතං පණීතං' -අර නිවන පිළිබඳ කාරණය. 'මෙය ශානතය මෙය ප්‍රණීතය එනම් සියලු සංස්කාරයන්ගේ සන්සිදීම, ආදි වශයෙන් ඒ පාඨයම නැවතත් ප්‍රකාශ කරනව. දැන් එතකොට අපට මේ ඉදිරිපත් වුන සාධක අනුව මේක හොඳ අවසථාවක් - අපි අර කලින් මීට දේශනා කීපයකට උඩදී කලහවිවාද සූත්‍රයෙ එන මහපුදුම විදියෙ, අමුතු විදියෙ, ගාථාවක් තේරුම් ගැනීමට සුළු ඉඟියක් විතරක් දීල, උපමාවකින් සුළු ඉඟියක් විතරක් දීල, තේරුම් නොකර ඉස්සරහට තල්ලු කළා. දැන් අන්න ඒක තේරුම් ගන්න සුදුසු සූත්‍ර ප්‍රදේශවලටයි අපි මේ ඇවිල්ල තිබෙන්නෙ. මොකක්ද ඒ ගාථාව?

'න සඤ්ඤසඤ්ඤී න විසඤ්ඤසඤ්ඤී
නොපි අසඤ්ඤී න විභූත සඤ්ඤී
එවං සමෙතසස විභොති රූපං
සඤ්ඤා නිදානා හි පපඤ්ච සංඛා [8]

ඒකෙ අර්ථය සාමාන්‍ය වශයෙන් ආයිත් සැළකුවොත්, - ලෝකයා හිතන්නෙ කෙනෙක් සඤ්ඤාව ඇතිව සිටින්න ඕන කියල. ඒ යම්කිසි සඤ්ඤාවකින් යුක්තව සිටිය යුතුයි කියල හිතනවනම්, මේ කියන තැනැත්තා 'න සඤ්ඤ සඤ්ඤී' එබඳු ඒ සඤ්ඤාවෙන් සඤ්ඤී වුනු පුද්ගලයෙකුත් නොවෙයි. 'න විසඤ්ඤ සඤ්ඤී' ඊළඟට අහන්න පුළුවන් එහෙනම් කලානත වෙලාද, විසංඥවෙලාද. එහෙමත් නොවෙයි. 'න විසඤ්ඤ සඤ්ඤී - ඊළඟට අහන්න පුළුවන් එහෙනම් සඤ්ඤාව කොහෙත්ම නැද්ද. ඔය අසඤ්ඤ තලය වගේ. ඒකත් නොවෙයි. 'නොපි අසඤ්ඤී' - ඊළඟට අහන්න පුළුවන් එහෙනම් සඤ්ඤා ඉක්මවලද, ඒක නැති කරලද, විනාශ කරලද. එහෙමත් නොවෙයි. 'න විභූත සඤ්ඤී, එවං සමෙතසස විභොති රූපං' අන්න එබඳු තත්ත්වයකින් සමන්විත වූවහුටයි රූපය නැති වෙන්නෙ. මක් නිසාද අවසාන පදයෙන් කියැවෙන්නෙ - 'සඤ්ඤා නිදානා හි පපඤ්චසංඛා' පපඤ්ච සංඛාවන් - අපි ඒව ගැන කලින් විස්තර කරල තියෙනව - පපඤ්ච සංඛාවන් සඤ්ඤාව නිදාන කොට ඇති හෙයිනි. ඇති නිසාය.

'දැන් එතකොට මෙතෙක් මේ ඉදිරිපත් කළ සූත්‍රවලින් කියැවෙන්නෙත් මේ විදියේ තත්ත්වයක්. අපි ඒක කෙටියෙන් සැළකුවොත් මේ සූත්‍රවල සඳහන් වුන අවධාරණාත්මක පාඨයම, ඒකට නිදසුන්. අර මුල්ම සූත්‍රයේ කියැවුනු අර එක එකක් පිළිබඳවත් 'න ඣායති න ඣායති' කියල කියාගෙන ගිහිල්ල

අන්තිමට කියැවෙනව - 'ඣායති ච පන' එසේද වුවත් ධ්‍යානයකුත් වඩනව. ඊළඟට අර සඤ්ඤා ගැනත් කියැවුනා. 'නෙව පඨවියා පඨවිසඤ්ඤී' ඔය විදියට කියාගෙන ගිහිල්ල අන්තිමට කියනව 'සඤ්ඤී ච පන අස්ස' - නමුත් සඤ්ඤීද වෙනව. ඊළඟට අර මනසිකාර ගැන. මෙනෙහි කිරීම ගැන කියාපු එකත්, ඒ විදියටමයි - 'මනසි ච පන කරෙය්‍ය' - මෙනෙහිද කරනව. ඔන්න ඔයින් අපට තේරෙනව එතකොට මෙතන 'න සඤ්ඤසඤ්ඤී න විසඤ්ඤසඤ්ඤී' ආදී වශයෙන් දැක් වූ මේ අවස්ථාව - මහ ගැටලු විදියට පෙනෙන, පරස්පර විරෝධී වගේ අවස්ථාව - තෝරගන්න ඕන ඔන්න ඔය අර්හත්ඵල සමාධිය ආශ්‍රයෙනුයි. එතකොට මෙතන මේ කියවිල තිබෙන්නෙ, කලහ විවාද සූත්‍රයෙ අර ගාථාවෙන් ප්‍රකාශවෙලා තියෙන්නෙ, අර්හත්ඵල සමාධියයි. අපිට ඒක නිසැකවම වගේ හිතාගන්න පුළුවනි එතකොට.

ඒක නිසාම තමයි අර අවසාන පදයෙ එන්නෙ 'පපඤ්චසංඛා' කියල කියන ඒ ගැඹුරු අර්ථවත් පදය. පපඤ්චයෙන් ඇතිකරගන්නා ලෝක ප්‍රඥප්ති. ඒව ඇතිවෙන්නෙ සංඥවන් මුල්කොටගෙනයි. ඒක නිසා තමයි මේ සඤ්ඤාව සමතික්‍රමණය කරන්න ඕන. අපි අර සළායතනයෙන් මිදෙන්න ඕන, ඵස්සයෙන් මිදෙන්න ඕන, ආදී වශයෙන් ප්‍රකාශ කළෙත් ඒකයි. ඒ පපඤ්ච සංඛා ප්‍රහාණය සැලසෙනව මෙන්න මේ කියපු අවස්ථාවේදී.

එතකොට මෙන්න මේ විදියට ඒ ඡේද ආශ්‍රයෙන් අපට තේරුම් ගන්න පුළුවනි මේ අර්හත්ඵල සමාධියෙ ඇති වැදගත්කම. මේක බුදුරජාණන් වහන්සේ නොයෙකුත් ආකාරයෙන් වර්ණනා කරල තිබෙන බව මේ සූත්‍රවලිනුත් අපට පැහැදිලි උනා, විශේෂයෙන්ම දැන් මෙතන කියවුන 'න සඤ්ඤසඤ්ඤී න විසඤ්ඤසඤ්ඤී' ආදී ගාථාවෙන්. අපි ඒකෙ මුල්පද දෙක කලින් අවස්ථාවක පොඩි නිදසුනකින් විතරයි. - අර සිනමාවෙන්මයි - අපි යන්තම් තේරුම් ගන්න උත්සාහ කළේ. ඒ කියන්නෙ අර සිනමා දර්ශනය නරඹමින් සිටින අවස්ථාවේදි හිටිගමන්ම සම්පූර්ණයෙන්ම ශාලාව ආලෝක උනාම අර තැනැත්තාට ඇතුළත සිදුවන වෙනස්වීම නිසා කෙනෙක් ඇසුවොත් මේ තැනැත්තා දැන් මේ චිත්‍රපටය බලනවද කියල. අන්න එතන ලොකු ප්‍රශ්නයක් තියෙනව. මක් නිසාද අර චිත්‍රපටි සංඥව ඔහු කෙරෙන් ඇත්වෙලා. දැන් ඒ සංඥව නෑ. නැතිකරලත් නෑ. මහපුදුම විදියෙ තත්ත්වයක් තියෙන්නෙ. ඒ තැනැත්ත ඇත්ත වශයෙන්ම බලාගෙන සිටින්නෙ එක්තරා විදියක **'හිස්බැල්මකින්'**. අන්න ඒ විදියෙ 'හිස්බැල්මක්' ප්‍රකාශ කරන ගාථාවක් තමයි මෙතනත්. රහතන් වහන්සේත් සළායතන නිරෝධයෙන් අර ප්‍රඥ ප්‍රභාව මතුවෙල, අර විදියට ලෝකයේ සියලුම උපධීන් ශුන්‍ය බව වටහා ගත්තාම ඒ අරහත්ඵල සමාධියෙ තිබෙන ඒ බැල්ම, ඒක **'හිස්බැල්මක්'** අර සිනමා දර්ශනය බලාගෙන ඉන්න පුද්ගලයාගෙ වගේ. ඒක සංඥවය කියල කියන්නත් බැහැ. විසංඥීය කියල කියන්නත් බැහැ. අසංඥී කියලත් කියන්න බෑ.

'විභූත සංඥී' කියලත් කියන්න බැහැ. අන්න එබඳු අවස්ථාවේදී වෙන එකක් තබා මේ රූප කය පවා අතහැරෙනව. 'අථ රූපා අරූපාච සුඛදුක්ඛා පමුච්චති කියල කලින් දවසක බාහිය සූත්‍රයෙ උදාන ගාථාවෙදී අපට හමුවුනු ඒවත් තවදුරටත් පැහැදිලි වෙනව මේ විස්තර වලින්. අර උපධීන් ආදිය අතහැරීම නිසා. වෙන එකක් තබා මේ කය, රූප, අරූප මේ සියල්ලම නැතිවෙනව. ඒ වගේම සැපදුක් පවා නැතිවෙනව, සපස්ශී නිරෝධයෙන්. නිවන 'අවෙදයිත සුඛයක්' කියල කියන්නෙත් ඔන්න ඕක නිසයි.

එතකොට දැන් අපි ඒ හිස් බැල්ම ගැන - 'හිස්බැල්ම' සමහරවිට කථා කරන්න තරම්වත් දෙයක් නොවෙයි කියල හිතන්න පුළුවනි. - නමුත් ඒක ගැන තමයි හුඟක් කියන්න වෙන්නෙ. හිස්බැල්මෙන් බලා ඉන්න කෙනෙක් කුමක් දිහාද බලාගෙන ඉන්නෙ? එහෙම ඇහුවොත් අප මොකක්ද කියන්නෙ? හිස් බැල්ම ඇත්ත වශයෙන්ම කොතැනකවත් පිහිටල නැහැ. 'අප්පතිට්ඨං' ඒකේ පැවැත්මක් නැහැ. 'අප්පවත්තං'. ඒකට අරමුණක් නැහැ. කොතනකවත් පිහිටල නැහැ. අරමුණක් නැහැ. 'අප්පතිට්ඨං, අප්පවත්තං, අනාරම්මණං' දැන් මේ වචන කියැවෙන කොටත් කෙනෙකුට සිහිවෙන්න පුළුවන් ඔය 'නිබ්බාන' කියන එක ගැන ලොකුවට තර්ක විතර්ක වලට හේතුවන සූත්‍ර. මේ රහතන් වහන්සේගේ බැල්ම හිස්බැල්මක් වන්නේ මක්නිසාද? අනිමිත්ත අප්පණිහිත සුඤ්ඤත කියන විමොක්ඛ, අනිත්‍ය දුඃඛ, අනාත්ම කියන ත්‍රිලක්ෂණයම ඉහළම කෙළවරට දියුණු කිරීමෙන් අරමුණ කෙරෙහි විනිවිද දකින බැල්මකින් දැන් බලාගෙන ඉන්නෙ. රහතන්වහන්සේල කොතැනද බලාගෙන ඉන්නෙ කියල කියන්න බැරි ඒකයි. අරමුණේ නිරෝධය දකින, අරමුණ විනිවිද දකින, බැල්මකින්. හරියට අර සිනමාවෙ - පූර්ණ ආලෝකය ආ වෙලාවෙ හිස්බැල්මෙන් බලා ඉන්න පුද්ගලයාට චිත්‍රපටියක් එකතු වෙන්නෙ නෑ. මක්නිසාද අර සිනමා සංස්කාර සමනය වෙලා. සිනමා උපධීන් අතහැරිල ගිහිල්ල. සිනමාව පිළිබඳ තණ්හාව ක්ෂය වෙලා ගිහිල්ල. සිනමාව පිළිබඳ ඒ විරාගය ඇතිවෙලා. සිනමාව නතරවෙලා. ඊළඟට නිවිල. ඇතුළ නිවිල. අන්න ඒක නිසා තමයි අර හිස් බැල්මකින් බලාගෙන ඉන්නෙ. ඒක අනුසාරයෙන් අපට හිතාගන්න පුළුවනි. ඇත්ත වශයෙන්ම මේ යෝගාවචරයන් වහන්සේල ආරම්භ කරන්නෙත් සංස්කාර වලින්නෙ. ඒක නිසාම තමයි සබ්බ සංඛාර සමථ කියල කියන්නෙ. මුලට දාලා තියෙන්නෙ ඒකයි. සංස්කාර වලින්මයි පටන් ගන්නෙ. සංස්කාරවල සමුදය පක්ෂය අතහැරල නිරෝධ පක්ෂය බලන්න පටන් ගන්නව. මේ සංස්කාර නිරෝධයෙ කෙළවර තමයි නිවන කියල කියන්නේ. ඒක තමයි නිරෝධ කියන වචනය කෙලින්ම නිවනට යොදල තියෙන්නෙ. එතකොට මෙතන කියැවෙන පද සමූහය මෙතැන කියැවුන නිසා මේ සූත්‍රවල නිවන අරමුණු කර ගන්නව කියල, කෙනෙක් හිතන්න පුළුවන්, මේකත් ඖළාරික අරමුණක් කියල. දැන් ඇත්ත වශයෙන්ම ඒකයි වෙලා තියෙන්නෙ. නමුත්

'එතං සනතං එතං පණීතං' ආදී පාඨයක් සංඥව හැටියට, මනසිකාරය හැටියට, ධ්‍යානය හැටියට, යොදා ගෙන තියෙනව කියල බුදුපියාණන් වහන්සේ ප්‍රකාශ කළේ ඒක අපි මේ දේශනා වලදී හැමදම කරන 'එතං සනතං එතං පණීතං' සජ්ඣායනාව වගේ එකක් නොවෙයි. අපි ඒකෙන් හිතන්න නරකයි අහීත්ඵල සමාධියේදී රහතන් වහන්සේලා වෙන මොකුත් කියන්නෙ නැතුව 'එතං සනතං එතං පණීතං' කිය කියා ඉන්නව කියල. එහෙම නොවෙයි මේක. මේක තමන් ලැබූ, අර ප්‍රඥ ආලෝකයෙන් ලැබූ, සියලු සංස්කාරයන්ගේ සන්සිඳීම පිළිබඳ ප්‍රත්‍යක්ෂයට, සියලු උපධීන් අතහැරීම, සම්පූර්ණයෙන්ම පංචස්කන්ධය අකහැරීම පිළිබඳ ප්‍රත්‍යක්ෂයට, තණ්හාව ක්ෂය කිරීම පිළිබඳ ප්‍රත්‍යක්ෂයට, විරාගයට, නිරෝධයට, නිවීමට, ඒකට සිත පමුණුවා ගන්න බවයි එතනින් කියැවෙන්නේ. නිවන් අරමුණු කරගන්නව කියන්නේ ඒකයි. නිරෝධය අරමුණු කිරීම. මේක මාරයට අල්ල ගන්න බැරි විදියෙ මහ පුදුම තත්ත්වයක්. ඒක නිසා තමයි අර නන්දිය ථෙරගාථාවෙ - ථෙරගාථා වල හොඳ ගාථාවක් - නන්දිය ථෙර ගාථාවේ නන්දිය ස්වාමීන් වහන්සේ ප්‍රකාශ කරන්නේ.එකම ගාථාවයි එතන තියෙන්නේ ඒකක නිපාතයෙ.

**'ඔභාසජාතං ඵලගං - චිත්තං යස්ස අභිණ්හසො**

**තාදිසං භික්ඛුං ආසජ්ජ - කණ්හ දුක්ඛං නිගච්ඡසි'.[9]**

යම්කිසි භික්ෂුවකගේ සිත නිතරම 'ඔභාසජාත'ද, ආලෝකවත් ද 'ඵලගං' - ඵලගං කියල කියන්නේ අරහත්ඵලයට ගිහිල්ල. නිතරම අරහත්ඵල සමාධියේම වැඩ සිටිනවද 'තාදිසං භික්ඛුං ආසජ්ජ' එබඳු භික්ෂුවකට විරුඬකම් කරන්න ගිහිල්ල, 'කණ්හ දුක්ඛං නිගච්ඡසි' කණ්හ කියල කියන්නේ මාරය. 'කලුව, ඔබ අමාරුවේ වැටෙයි'. මාරයාටවත් සොයා ගන්නට බැරි තත්ත්වයක්. දෙවියන්ට බ්‍රහ්මයන්ටවත් සොයා ගන්න බැහැ අරමුණ. මාරයාට කොහෙත්ම බැහැ. ඕක නිසා තමයි 'මාරසෙනං පමොහනං' කියල ප්‍රකාශ කළේ. මේ ඔක්කොම අහීත්ඵල සමාධියෙ තියෙන ආශචර්යය. 'අනිමිත්ත අප්පණිහිත සුඤ්ඤත' කියන මේ විමොක්ඛවල තියෙන ආශචර්යවත් ස්වභාවය. එතකොට මෙයින් අපට පෙනෙනව අර නිමිත්තක් නැති, අරමුණක් නැති, පිහිටීමක් නැති, පැවැත්මක් නැති මේ අහීත්ඵල සමාධිය ගැනයි ඔය 'න සඤ්ඤසඤ්ඤී' ආදී වශයෙන් දැක්වුයේ. ඒක අර රහතන් වහන්සේලාගේ හිස්බැල්ම. වෙනත් විදියකට තේරුම් කරනව නම්, සාමාන්‍යයෙන් කෙනෙකුගේ බැල්මක් ගිහින් පතිත වෙන තැනක්, අරමුණක් තිබෙනව. නමුත් මේක ඒ විදියට කල්පනා කරලා බලනවනම් ඇත්ත වශයෙන්ම හරියට කියන්න පුළුවන් 'ක්ෂතිජයක් නැති දර්ශන පථයක්' කියල. සාමාන්‍යයෙන් දර්ශන පථයෙ කෙළවර තියෙන්නේ ක්ෂිතිජයයි. මුහුදක් ළඟට ගිහිල්ල බලන කොට, තැනිතලාවක් ළඟට ගිහින් බලන කොට අහසත් පොළොවත් එකතුවෙන තැන තමයි ක්ෂිතිජය කියල කියන්නේ. ලෝකයාගේ දර්ශන

පථයෙ සාමාන්‍යයෙන් හැම තිස්සෙම ක්ෂිතිජයක් තියෙනව. රහතන් වහන්සේගේ මේ දර්ශන පථයෙ ක්ෂිතිජයක් නැහැ. ඒක නිසා තමයි අනන්තං කියන්නෙ. 'විඤ්ඤාණං අනිදස්සනං අනන්තං සබ්බතො පභං' මේ හිස්බැල්ම අන්න එබඳුවූ අනන්ත සංඥවක්. ඉතින් මේකෙ ඉන්න කොට සඤ්ඤී කියන්නත් බැහැ. ලෝක සංඥවෙන් මේකට විසඤ්ඤී කියන්නත් බෑ. අසඤ්ඤී කියල කියන්නත් බෑ. විභූතසඤ්ඤී කියල කියන්නත් බෑ.

අපි ප්‍රකාශ කළ කාරණාවලට තවදුරටත් එළිය වැටෙන, ඒවගේම තෝරන්න බලාපොරොත්තු වන යම් සූත්‍ර කොටස් තියෙනවනම් ඒවාටත් එළිය වැටෙන විදියේ ගාථා දෙකක් අපි ඉදිරියට ගනිමු. ධම්ම පදයෙ අරහන්ත වග්ගයෙ එන වටිනා ගාථා දෙකක්.

**'යෙසං සන්නිචයො නත්ථි - යෙ පරිඤ්ඤාතභොජනා**
**සුඤ්ඤතො අනිමිත්තො ච - විමොක්ඛො යෙස ගොචරො**
**ආකාසෙව සකුන්තානං - ගති තෙසං දුරන්නයා'.**

ඊළඟ ගාථාව -

**'යස්සාසවා පරික්ඛීණා - ආහාරෙ ච අනිස්සිතො**
**සුඤ්ඤතො අනිමිත්තො ච - විමොක්ඛො යස්ස ගොචරො**
**ආකාසෙව සකුන්තානං - පදං තස්ස දුරන්නයං'**[10]

බොහෝදුරට එකසමාන ගාථා දෙකක්. මුල් ගාථාවෙන් කියැවෙන්නේ 'යෙසං සන්නිචයො නත්ථි - යෙ පරිඤ්ඤාතභොජනා' - මේ ගාථා දෙකටම නිදාන වශයෙන් දැක්වෙන්නේ ඉතාම සුලභ සිද්ධියක්. ආහාර වැඩිපුර අහක යන විදියට රැස්කිරීම් පිළිබඳ ප්‍රශ්නයක්. නමුත් බුදුපියාණන් වහන්සේ මේකෙන් මතුකරන ධර්මය ඉතාම ගැඹුරු දෙයක්. 'යෙසං සන්නිචයො නත්ථි' - මේ කියන්නේ රහතන් වහන්සේලාට - යම් රහතන් වහන්සේලාට 'සන්නිචයො නත්ථි' - රැස් කිරීමක් නැත්ද, මෙතන රැස් කිරීම කියල කියන්නේ බඩු බාහිරාදිය ආහාර රැස්කිරීමක් නොවෙයි. එක පැත්තකින් කියන කොට කර්මරැස් කිරීමක් කියල කියන්න පුළුවන්. එහෙම නැත්නම් උපධි, උපාදාන රැස්කිරීමක්. උපචයක් සන්නිචයක් නැහැ. 'යෙ පරිඤ්ඤාත භොජනා' - ඒකත් සීමිත අර්ථයකින් සැළකුවොත් භෝජනය හොඳට අවබෝධ කරගෙන තිබෙනව. 'භෝජන' කියනව වෙනුවට ආහාර කියන අර්ථයෙන් ගත්තොත් වඩාත් පුලුල්. සතර ආකාරයේම ආහාර - කබලිංකාර, ඵස්ස මනොසංචෙතනා, විඤ්ඤාණ කියල කියන ආහාරයන් පිළිබඳව ගැඹුරින් අවබෝධ කරගෙන තිබෙනව. 'සුඤ්ඤතො අනිමිත්තො ච-විමොක්ඛො යෙස ගොචරො'. යම්බඳු ඒ රහතන් වහන්සේලාගේ ගොදුරු බිම, නියම ගොදුරුබිම කුමක්ද? සුඤ්ඤත අනිමිත්ත - සුඤ්ඤතයත් අනිමිත්තයත්. 'ආකාසෙව සකුන්තානං - ගති තෙසං දුරන්නයා - ඔවුන්ගේ 'ගතිය' අහසෙහි කුරුල්ලන් ගිය පාරවගේ සොයා ගන්න අමාරුයි. මෙතන මේ 'ගති' කියන එක

ගැනත් අපට විශේෂයෙන් කියන්න සිඬ වෙනව. අටුවාව මේව තෝරන්නෙ - 'ගති' කියන එක තෝරන්නේ රහතන් වහන්සේ - අපි කියමු, 'මැරුණ' කියල - මැරණට පස්සේ ගිහිල්ල උපදින තැන: නැවත ඉපදුන තැන හැටියටයි මේක විග්‍රහ කරන්නේ. නමුත් මෙතන තියෙන්නෙ 'ගිය පාර' කුරුල්ලන් ගිය පාරයි පෙනෙන්නෙ නැත්තෙ. කුරුල්ලා ගිහිල්ල නැවතුන තැනනම් සමහර විට සොයාගන්න පුළුවන් ටිකක් මහන්සි උනොත්. ගිහිල්ල කූඩුවක නවතින්න ඇති. නමුත් මෙතන කියවෙන්නේ 'ගති', 'ගති' කියල කියන්නේ ගිය මාර්ගය, ගිය පාර. එතකොට අහසෙහි කුරුල්ලන් යනකොට පාරක් ඉතුරු කරන්නෙ නැතුව වගේ රහතන් වහන්සේගේ මේ සමාධියේදී අරුම පුදුම සමාධියේදී, අරමුණක් නෑ. පැවැත්මක් පේන්නෙ නැහැ. ඉතින් මෙතන, ගිය පාරක් නැහැ. කුරුල්ලන් ගියා වගේ තමයි.

ඊළඟට අනිත් ගාථාවෙ කියන අදහසත් ඊට සමානයි. 'යස්සාසවා පරික්ඛීණා - ආහාරෙ ච අනිස්සිතො' - එතන ඒක වචනයෙන් තියෙන්නෙ. යම් රහතන් වහන්සේ කෙනෙකුගේ ආශ්‍රවයන් ක්‍ෂයවීද, ක්‍ෂය වී තිබේද? ආහාරය පිළිබඳ නොඇල්මක් වේද, ආහාරයේ ඇලිල නෑ. තෘෂ්ණා දෘෂ්ටිවශයෙන් ඇලිල නෑ. ඒකත් අපට ගන්න පුළුවන් සතර ආහාරය පිළිබඳවම හැටියට. 'සුඤ්ඤතො අනිමිත්තො ච - විමොක්ඛො යස්ස ගොචරො' - යම් රහතන් වහන්සේගේ නියම ගොදුරුබිම සුඤ්ඤත අනිමිත්තය වේද 'ආකාසෙව සකුන්තානං - පදං තස්ස දුරන්නයං - අහසෙහි කුරුල්ලන්ගේ පාසටහන් වගේ සොයාගන්න අමාරුයි. එතන පදං කියන එකේ මාර්ගය කියන අදහසක් තියෙනව. පාසටහන් කියල ගන්නත් පුළුවන්. එයිනුත් අපට පැහැදිලි වෙනව මෙතන කියවෙන්නෙ රහතන් වහන්සේ ගිහිල්ල නැවතුන තැන නොවන බව.

මේ ගාථා දෙකේදී අටුවාව තෝරන්නෙ - 'ගති' කියන වචනයත් 'පදං' කියන වචනයත් තෝරන්නෙ - රහතන් වහන්සේල ගිහිල්ල නැවත උපන්න තැන. මේවායින් ඉතුරු කරගන්නෙ මොකක්ද? රහතන් වහන්සේගේ අනුපාදිසෙස නිබ්බාන ධාතුව පිළිබඳ ප්‍රශ්නයකට ඉඩක් ඉතුරු කර ගැනීමක් මේ කරන්නෙ. නමුත් මේ ගාථාවෙ තියෙන්නේ ඉතාම ගැඹුරු රූපකාර්ථයක්. මෙතන මේ කියැවෙන්නේ අර සමාධිය පිළිබඳවයි. මෙතන මේ ගමන කියන්නේ සාමාන්‍ය ලෝකයා හිතන ගමනක් නොවෙයි. මේ අර සිතේ ගමනයි. වෙන අයගෙ නම් සිතේ ගමන අල්ලගන්න පුළුවන්. ඒ අරමුණ ඔස්සේ, නිමිත්ත ඔස්සේ. නමුත් මෙතන එහෙම කරන්න බැහැ. මේ ගාථාවෙ වටිනා අර්ථය මතුකරගන්න හොඳම මූලික පදය තමයි - යතුරු පදය තමයි - 'ගොචර' කියන එක. 'ගොචර' කියල කියන්නේ ගොදුරු බිම. අපි හිතමු ගවයින් ගොදුරුබිමක හැසිරෙන කොට ඒ ගවයින් ගියාද නැද්ද කියල දැනගන්න පුළුවන් වෙන්නේ උන් ගිය අඩිපාරෙන්. අන්න ඒ වගෙ

දැන් ඒ 'ගොචර' කියන පදය ගත්තොත්, ඒකත් එක්ක හොඳට ගැලපෙනව. රහතන් වහන්සේගෙ ගොදුරු බිම. රහතන් වහන්සේල ආහාර භුක්ති වින්දේ ශරීරයේ පැවැත්මට. උන්වහන්සේලගේ නියම ගොදුරු බිම අර්හත්ඵල සමාධියයි. යන්තම් ඉඩක් ලැබුනු හැටියෙ ඒ ගොදුරුබිමටයි වදින්නේ. අන්න ඒ ගොදුරු බිමට වැදුනාම දෙවියන්ට බ්‍රහමයන්ට තබා මාරයාටවත් සොයාගන්න බැහැ. අන්න ඒ නිසා තමයි අහසේ කුරුල්ලන් ගිය මාර්ගය වගේ අර්හත්ඵල සමාධියට සම වැදුන රහතන් වහන්සේගේ ගිය මාර්ගය අල්ල ගන්න බැරි. අනුපාදිසෙස නිබ්බාන ධාතු සඋපාදිසෙස නිබ්බාන ධාතු ගැන අපට තව ඉදිරියට කථාකරන්න තියෙනව. නමුත් මෙතනදී උනත් බොහෝදුරට කරුණු පැහැදිලි වෙන්න ඉඩ තියෙනව. මක් නිසාද? අපි කියමු රහතන් වහන්සේ මැරෙනව කියල. මැරෙන අවස්ථාවේදී කෙරෙන්නෙ, ආයුක්ෂය වෙන මොහොතෙදි, මෙන්න මේ අර්හත්ඵල සමාධියට හිතදමනව. ඒ දැම්මට පස්සේ මාරයාටවත් සොයාගන්න බැහැ. නැවත ඉපදීමකට ඉඩක් ඉතුරු වෙන්නේ නැහැ. සියල්ලම අවසානයි එතනම. මෙන්න මේ නිවීමයි එතකොට මෙතන මේ කියැවෙන්නෙ. මේ නිවීම, මේක පරලොවදී ලැබෙන දෙයක් නොවෙයි. මෙලොවදීම ප්‍රත්‍යක්ෂ වශයෙන් ලැබෙන නිවීමක්. රහතන් වහන්සේ එදිනෙදා දිට්ඨධම්ම සුඛවිහාර වශයෙන් 'දිට්ඨෙව ධම්මෙ' - අර්හත්ඵල සමාධියට සමවැදිල ඒ ලබාගත්තු අනුත්තර විමෝක්ෂය මගින් ලබා ගත්තු - ඒ උතුම් පරමශාන්ත නිර්වාණ සුඛය භුක්ති විඳිනව.

# අධෝලිපි

1. උදා. 152 පිට බු.නි I (බු.ජ.24)
2. අරියපරියෙසන සු.ම.නි. I 396 පිට (බු.ජ.10)
3. බු.නි I 8 පිට (බු.ජ.24)
4. ඉති. බු.නි. I 390 පිට (බු.ජ.)
5. අං.නි VI 610 සිට (බු.ජ.23)
6. අං.නි VI 600 පිට (බු.ජ.23)
7. අං.නි. 604 පිට (බු.ජ. 23)
8. සු.නි. 276 පිට (බු.ජ.25)
9. ථෙර. 12 පිට (බු.ජ.28)
10. බු.නි. I 44 පිට (බු.ජ.24)

# 17 වන
# දේශනය

# 17 වන දේශනය

**"නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස"**

"එතං සන්තං එතං පණීතං යදිදං සබ්බසංඛාරසමථො සබ්බූපධි පටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං."

"මෙය ශාන්තය මෙය ප්‍රණීතය එනම් සියලු සංස්කාරයන්ගේ සංසිඳීම, සියලු උපධීන් අතහැර දැමීම, තණ්හාව ක්‍ෂය කිරීම, නොඇල්ම නම් වූ විරාගය, නැවැත්ම නම් වූ නිරෝධය, නිවීම නම් වූ නිබ්බානය."

**අතිපූජනීය මහෝපාධ්‍යාය මාහිමිපාණන් වහන්සේ ප්‍රධාන ගරුතර යෝගාවචර මහා සංඝ රත්නයෙන් අවසරයි. නිබ්බාන යන මාතෘකාව යටතේ පවත්වනු ලබන දේශනා මාලාවේ දහහත් වන දේශනයයි මේ.**

අර්හත්ඵල සමාධියේදී රහතන්වහන්සේ ලබන භව නිරෝධය පිළිබඳ ප්‍රත්‍යක්‍ෂය කෙබඳු එකක්ද කියල වටහාගන්න උපකාරවන සූත්‍ර කීපයක් පසුගිය දේශනයේදී අප විග්‍රහ කළා. ක්‍ෂිතිජයක් නැති දර්‍ශනපථයක් වැනි විනිවිද යන ගැඹුරු හිස්බැල්මකින් රහතන්වහන්සේ ඒ භවනිරෝධය දකින බවත්, ඒ කාරණයම අපි කලින් අවස්ථාවක සඳහන් කළ 'අනන්ත සබ්බතොපභ අනිදස්සන විඤ්ඤාණය' කියන ඒ වචනවලිනුත් පැහැදිලි වන බවත් අපි එදා යන්තමින් සඳහන් කළා. අනිමිත්ත අප්පණිහිත සුඤ්ඤත යන විමෝක්‍ෂ ගොදුරුබිම් කරගත් රහතන් වහන්සේ සඤ්ඤා අනුසයෙන් මිදිල, රූප අරූප ද්වයතාව ඉක්මවල, මේ භව සාගරයෙන්, මේ භවයෙන් එතෙරවන හැටි - මාරයාට හසු නොවී, මේ භවයෙන් එතෙරවන හැටි - නොයෙකුත් සූත්‍ර දේශනාවල නොයෙකුත් ආකාරයෙන් විස්තර කරල තිබෙනව. 'ඉතිවුත්තක පාළියෙ ඉතාමත්ම වටිනා ගාථා තුනක් තිබෙනව. අපි ඒව ඉදිරියට ගනිමු මේ අවස්ථාවෙ.

1. යෙ ච රූපූපගා සත්තා - යෙ ච අරූපට්ඨායිනො
   නිරොධං අප්පජානන්තා - ආගන්තාරො පුනබ්භවං

2. යෙ ච රූපෙ පරිඤ්ඤාය - අරූපෙසු අසණ්ඨිතා
   නිරොධෙ යෙ විමුච්චන්ති - තෙ ජනා මච්චුහායිනො

3. කායෙන අමතං ධාතුං - ඵුසයිත්වා නිරූපධිං
   උපධිපටිනිස්සග්ගං - සච්ඡිකත්වා අනාසවො

### දෙසෙති සමමා සමබුදො - අසොකං විරජං පදං[1]

'යෙ ච රූපූපගා සත්තා යෙ ච අරූපට්ඨායිනො' - රූප භවයන්ට එළඹෙන යම්තාක් සත්ත්වයෝ වෙත්ද, අරූප භවයන්හි ස්ථාවරව සිටින යම්තාක් සත්ත්වයෝ වෙත්ද, ඒ හැම කෙනෙක්ම 'නිරොධං අප්පජානන්තා නිරෝධය, භව නිරෝධය තේරුම් නොගැනීම නිසා 'ආගන්තාරො පුනබ්භවං' නැවත නැවත භවයට එනව. 'යෙච රූපෙ පරිඤ්ඤාය අරූපෙසු අසණ්ඨිතා' - නමුත් යම් කෙනෙක් රූපය පිරිසිඳ දැනගෙන, හරියාකාර අවබෝධකරගෙන, 'අරූපෙසු අසණ්ඨිතා' - අරූප භවයන්හිද නොරඳා, නොපිහිටා, 'නිරොධ යෙ විමුච්චන්ති' - නිරොධයෙහි විමුක්ත වෙත්ද, 'තෙ ජනා මච්චුහායිනො' - ඔවුහු මාරයා පලවා හරින්නෝය. 'කායෙන අමතං ධාතුං ඵුසයිත්වා නිරූපධිං' - උපධිපටිනිස්සග්ගං සච්ඡිකත්වා අනාසවො' නිරුපධි නම් වූ අමෘත ධාතුව කයින් ස්පර්ශකොට, උපධීන් අතහැරීම සාක්ෂාත් කොට, ප්‍රත්‍යක්ෂ කරගෙන, අනාශ්‍රවව, ආශ්‍රවයන්ගෙන් මිදී, 'දෙසෙති සම්මා සම්බුදෙධා අසොකං විරජං පදං' - සම්මා සම්බුදුරජාණන්වහන්සේ නිඃශෝකී වූ නික්ලේශී වූ අමෘතපදය දේශනා කරති.

මේ ගාථා තුනෙන් මුල් ගාථාවෙන් කියැවෙන අදහස ඉතාමත් පැහැදිලියි. ඒ කියන්නෙ රූප භවයන්හි සිටින සත්ත්වයෝත් අරූප භවයන්හි ස්ථාවරව සිටින සත්ත්වයෝත් - රූප භවයන්ට එළඹෙන සහ අරූපභවයන්හි සිටින සත්ත්වයෝත් - නිරෝධය තේරුම් නොගැනීම නිසා, භව නිරෝධය ගැන නොදැනීම නිසා, නැවත නැවත භවයට එනව.

ඊළඟට දෙවන ගාථාව. මේ ගාථාවෙ එක්තරා පොඩි පටලැවිල්ලක් තියෙනව. ඒ කියන්නෙ, අපි කලිනුත් සඳහන් කළා. ගැඹුරු සූත්‍රවල පාඨාන්තර නිගමනය පවා ලොකු ප්‍රශ්නයක්. ඒ තරමටම පැහැදිලිව ඇවිල්ල නෑ. ඒවායේ අර්ථය පැහැදිලි වෙන්නෙ නැති වෙනකොට, ඒ එක්කම කටින්කට එන ධර්මයත් දූෂ්‍යවෙන ස්වභාවයක් නිසා වෙන්න ඕන. මෙතන 'අසණ්ඨිතා' කියන පාඨයයි අපි පිළිගත්තෙ. ඒ කියන්නෙ 'යෙ ච රූපෙ පරිඤ්ඤාය අරූපෙසු අසණ්ඨිතා' - ඒ කියන්නෙ රූප භවයන් පිරිසිඳ දැනගෙන, රූපය හරියට තේරුම් අරගෙන, ඒවගේම අරූපයන්හිද නොරඳා, නොපිහිටා. තව පාඨයක් තියෙනව 'සුසණ්ඨිතා' කියල. 'සුපිහිටි'. එතකොට මේ එහෙම පිටින්ම පරස්පරවිරෝධී පද දෙකක්. මෙයින් මොකක් තෝරගන්නවද කියන එකයි ප්‍රශ්නය. අටුවාව පිළිඅරගෙන තියෙන්නෙ 'අසණ්ඨිතා'. අපිත් දැන් මෙතන හේතු ඇතිවයි 'අසණ්ඨිතා' කියන පාඨය ගත්තෙ. අටුවාව කියන නිසාම නොවෙයි. නමුත් නවීන සංස්කරණ ගණනාවකම අසණ්ඨිතා කියන පාඨය ඉවත්කරල 'සුසණ්ඨිතා' කියල අරගෙන තියෙනව. ඒක සමහරවිට මතුපිට අර්ථය ගැන හිතලවෙන්න ඇති.

අරූපයන්හි හොඳින් පිහිටා, සුපිහිටා., නමුත් මෙතන ගන්න තියෙන්නෙ, අපි මේ දේශනා මාලාවෙම දැක්වුව මේ රූප අරූප දෙකේ ද්වයතාව. රූපයේ හෙවනැල්ලක් වගේ අරූපය. ඒක නිසා රූපය පිරිසිඳ දැන ගැනීම නිසාම කෙනෙක් තේරුම් ගන්නව අරූපයෙවත් රඳන්න වටින්නෙ නැහැ කියල. අන්න ඒ අර්ථයෙනුයි අපි 'අසණ්ඨිතා' කියන පාඨය මෙතෙන්ට ගත්තෙ. රූපය හරියට තේරුම් ගත්ත නම් යම්කිසි කෙනෙක්, ඒ තැනැත්ත අරූපයෙවත් පිහිටන්නෙ නැහැ. අන්න එබඳු පුද්ගලයින් නිරෝධයේ විමුක්ත වෙනව. එතකොට 'අසණ්ඨිතා' කියන පාඨයයි අපි එතෙන්දි පිළිගත්තෙ. රූප අරූප ද්වයතාව ඉක්මවල භවනිරෝධයට සිත එලැවීම නිසා ඒ අය විමුක්ත වෙනව කියන එකයි.

අවසාන ගාථාවෙන් කියැවෙනව බුදුරජාණන්වහන්සේ නිරුපධි නම් වූ උපධිපටිනිස්සග්ගය ප්‍රත්‍යක්ෂ කළා කියල. ප්‍රත්‍යක්ෂ කරල කයින් අමෘතධාතුව ස්පර්ශ කළ බවකුත් කියැවෙනව. කලින් දවසේ දේශනයක අපි සඳහන් කළ එක්තරා උදාන ගාථාවක 'ඵුසන්ති ඵස්සා උපධිං පටිච්ච - නිරූපධිං කෙන ඵුසෙය්‍යුං ඵස්සා' කියල තියෙනව. අපි ඒක තේරුම් කළේ 'උපධි තියෙන තාක් ස්පර්ශයෝ ස්පර්ශ කරත්, නිරූපධි තැනැත්තා කෙසේ නම් ස්පර්ශයෝ ස්පර්ශ කෙරෙත්ද' කියල. එතකොට එහෙම බලන කොට එතන ස්පර්ශයක් නැහැ. දැන් මෙතන කියාපු එක පරස්පර විරෝධී හැටියට යම්කිසි කෙනෙකුට පේන්න පුළුවන්. මෙතන කියනව කයින් අමෘත ධාතුව ස්පර්ශ කළා කියල. ස්පර්ශය නැත්නම් කොහොමද ස්පර්ශ කරන්නේ කියලත් අහන්න පුළුවන්. නමුත් මෙතන ඇත්ත වශයෙන්ම මහා ගැඹුරු අදහසක් තියෙන්නෙ. **ස්පර්ශයෙන් මිදීමමයි මේ අමෘත ධාතුව ස්පර්ශ කිරීම**. ඒ කියන්නෙ, මරණ භය පිළිබඳව කල්පනාකර බලන කොට, මරණ වේදනාවෙන් මිදීම, මරණය පිළිබඳ සංකල්පයෙන් මිදීම. රහතන්වහන්සේ, බුදුරජාණන් වහන්සේ එහෙම ඒ ප්‍රඥාවෙන්ම අර කියාපු 'අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං' ආදී වශයෙන් දක්වන, 'අකුප්පා චෙතොවිමුත්ති' ආදී වශයෙන් දක්වන, ඒ අර්හත්ඵල සමාධියේදී මුළු ශරීරයම අතහැරල, අර භවනිරෝධය ප්‍රත්‍යක්ෂ කරන කොට, ස්පර්ශයෙනුත් මිදෙනව, වේදනාවෙනුත් මිදෙනව. ඒක නිසා තමයි නිවන අවෙදයිත සුඛයක් කියල කියන්නෙ. ඒක ඉතාම සියුම් කාරණයක්. මාරය උදුර ගන්න එනකොට අතහැරීම. ඒ අතහැරීම, අමෘතත්වය ස්පර්ශ කිරීමක් වෙන්නෙ ඇත්ත වශයෙන්ම අර ස්පර්ශවලින්, වේදනා වලින් මිදීමයි. මේක බැලුබැල්මට පරස්පර විරෝධියි වගේ. ඒ තරම් සියුම් ධර්මයක් මෙතන. එතකොට නිරෝධය ප්‍රත්‍යක්ෂ කරන්නේ කොහොමද? සංස්කාර නිරෝධය අරමුණු කිරීමෙන්. සංස්කාරවල ස්වභාවය හටගැනීම් නැතිවීම් දෙක බව කලිනුත් සඳහන් කළා - එයින් නිරෝධය. සාමාන්‍ය ලෝකයා සමුදය පක්ෂයටයි හිත යොමු කරන්නෙ. ඒක විතරයි පේන්නෙ. බුදුරජාණන් වහන්සේලා සියුම් අන්දමින් දැක්ක භව

නිරෝධය. සංස්කාරයන්ගේ නිරෝධය අරමුණු කරගෙන ඒකෙ කෙළවරට ගියාම අන්න භව නිරෝධය ප්‍රත්‍යක්ෂ වෙනව. භවයයි මාරයාට අයිති. මාරයගෙ ග්‍රහණයෙන් මිදෙන්නෙ කොහොමද? මාරයාට දකින්න බැරි තැනකට යනව. ඒ කියන්නෙ 'භව නිරෝධයට' සිත දමනව. 'භවයෙ ඉන්න තාක් තමයි අර සියලු සැප දුක් විඳින ආදිය. අපි කලිනුත් අවස්ථාවල සඳහන් කළ ගාථාවක් - 'අථ රූපා අරූපා ච සුඛදුක්ඛා පමුච්චති' - සැප දුක්වලිනුත් රූප අරූප වලිනුත් මිදෙනව ඒ රහතන් වහන්සේ. අභීත්ඵල සමාධිය හැටියටයි අපි ඒක තේරුම් කළේ. දැන් මෙතනත් ඒකමයි. එතකොට මේ භව නිරෝධය කියන අදහස ඉතාම ගැඹුරු සංකල්පයක්, ගැඹුරුම අදහසක් මෙතන තියෙන්නෙ. දැන් භව නිරෝධය නිර්වාණයයි කිව්වාම මෙතන මොකක්ද තියෙන්නෙ කියලත් සමහර විට කෙනෙකුට හිතෙන්න පුළුවනි.

නමුත් ඇත්ත වශයෙන්ම නිවන භවනිරොධ නාමයෙන් හඳුන්වපු වටිනා සූත්‍රයක් අපට ලැබෙනව අංගුත්තර නිකායෙ දසක නිපාතයෙන්. ආනන්ද ස්වාමීන් වහන්සේත් සැරියුත් ස්වාමීන් වහන්සේත් අතර ධර්ම සංවාදයක ස්වරූපයෙනුයි ඒ සූත්‍රය විකාශනය වෙන්නෙ. අර සුපුරුදු ආකාරයටම ආනන්ද ස්වාමීන් වහන්සේ අහනව අර අරුම පුදුම සමාධිය ගැන.

**'සීයා නු ඛො ආවුසො සාරිපුත්ත භික්ඛුනො තථාරූපො සමාධිපටිලාභො. යථා නෙව පඨවියං පඨවිසඤ්ඤී අස්ස, න ආපස්මිං ආපොසඤ්ඤී අස්ස, න තෙජස්මිං තෙජොසඤ්ඤී අස්ස, න වායස්මිං වායොසඤ්ඤී අස්ස, න ආකාසානඤ්චායතනෙ ආකාසානඤ්චායතන සඤ්ඤී අස්ස, න විඤ්ඤාණඤ්චායතනෙ විඤ්ඤාණඤ්චායතනසඤ්ඤී අස්ස, න ආකිඤ්චඤ්ඤායතනෙ ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤී අස්ස, න නෙවසඤ්ඤානාසඤ්ඤායතනෙ නෙවසඤ්ඤානාසඤ්ඤායතනසඤ්ඤී අස්ස, න ඉධලොකෙ ඉධලොකසඤ්ඤී අස්ස, න පරලොකෙ පරලොක සඤ්ඤී අස්ස, සඤ්ඤී ච පන අස්ස'**[2]

මේකෙ අදහස, 'ඇවැත්නි සාරිපුත්‍රය මෙබඳු සමාධියක් භික්ෂුවකට තිබිය හැකිද? ඒ සමාධියේදී අර පඨවි ආපො තෙජො වායො පිළිබඳවත් සඤ්ඤාවක් නැහැ. ඒ වගේම ආකාසානඤ්චායතන ආදී අරූප භව පිළිබඳව සඤ්ඤාවකුත් නැහැ. ඉතින් මෙහෙම උනාට මොකද 'සඤ්ඤී ච පන අස්ස' එසේ නමුත් සඤ්ඤාවකුත් තිබෙනව. එතකොට සැරියුත් ස්වාමීන් වහන්සේ ප්‍රකාශ කරනව 'සියා ආවුසො ආනන්ද' - එහෙම වෙන්න පුළුවන් ආනන්ද. ඊළඟට ආයෙත් ආනන්ද ස්වාමීන් වහන්සේ අහනව 'යථා කථං පන ආවුසො සාරිපුත්ත සියා' කොහොමද එහෙම වෙන්නෙ? එතකොට සැරියුත් ස්වාමීන් වහන්සේ ප්‍රකාශ කරනව. - 'මම මෙබඳු සමාධියකට ඇත්ත වශයෙන්ම සමවැදිල හිටිය මේ සැවැත් නුවර අන්ධවනයේ වාසය කළ එක්

අවසථාවක. ඒ අවසථාවෙ මෙන්න මේ කියාපු ආකාරයටයි මගේ සිත පැවතුනේ, කියල එතකොට ආනන්ද සවාමීන් වහන්සේ අහනව ඒ අවසථාවේ ඔබ වහන්සේ කවර සඤ්ඤාවකින් යුක්තවද සිටියෙ. ඕන්න ඒකට දෙන පිළිතුර තමයි ඉතාමත්ම වැදගත් වෙන්නෙ.

**'භවනිරොධො නිබ්බානං භවනිරොධො නිබ්බානන්ති ඛො මෙ ආවුසො අඤ්ඤාව සඤ්ඤා උප්පජ්ජති අඤ්ඤාව සඤ්ඤා නිරුජ්ඣති සෙය්‍යථාපි ආවුසො සකලිකග්ගිස්ස ඣායමානස්ස අඤ්ඤාව අච්චි උප්පජ්ජති අඤ්ඤාව අච්චි නිරුජ්ඣති. එවමෙව ඛො මෙ ආවුසො. භවනිරොධො නිබ්බානං භව නිරොධො නිබ්බානන්ති අඤ්ඤාව සඤ්ඤා උප්පජ්ජති අඤ්ඤාව සඤ්ඤා නිරුජ්ඣති භවනිරොධො නිබ්බානන්ති සඤ්ඤීච පනාහං ආවුසො තස්මිං සමයෙ අහොසින්ති'**

ඒකෙ අදහස භවනිරොධො නිබ්බානං භවනිරොධො නිබ්බානං කියල මට ඒ අවස්ථාවෙ සංඥාවක් හට ගන්නව. වෙන සංඥාවක් නිරුඬ වෙනව කියල ඊළඟට ඒකට උපමාවක් දෙනව. යම් සේ ඇවැත්ති කෝටු කැබැල්ලක් දැල්වෙන කල්හි එහි ගිනිදැල්ල, එහි ගිනි සිල, පිළිබඳව හිතනවානම් එක ගිනිසිලක් හට ගන්නව. වෙන ගිනිසිලක් නැතිවෙලා යනව. නිරුඬ වෙනව. අන්න ඒ විදියටම මට භවනිරෝධය නිර්වාණයයි කියල එක සංඥවක් ඇතිවෙනව වෙන සංඥාවක් නැතිවෙනව. දැන් මෙතනත් අපට කියන්න තියෙන්නෙ අර 'එතං සන්තං එතං පණීතං' කිව්ව වගේ ඕක කිය කිය හිටිය නොවෙයි සැරියුත් සවාමීන් වහන්සේ. අර සංසකාර නිරෝධයට සිත යොමු කරල සිටිය. මෙතන විදර්ශකයින්ට ඉතාම පහසුවෙන් තේරුම් ගන්න පුළුවන් කාරණයක් මේ ගිනිදැල්ල. ගිනිදැල්ලක් දිහා සාමාන්‍ය ලෝකයා බලන කොට, එතන දකින්නෙ දැල්ලක්, දැල්වීමක්. ඒ වෙනුවට යෝගාවචරය දකින්නෙ එතන නිවීමක්, නිරෝධය. මේක ඉතාම සියුම් ගිනිදැල්ලේ පැවැත්ම විනිවිද දැකීමක්. අර විනිවිද යන බැල්මක් කිව්වෙ ඒකයි. මේ දැල්ල තුළින් නිවීම අරමුණු කළා ඉතාමත්ම ක්ෂණිකව. ඇත්ත වශයෙන්ම ගිනිදැල්ල පිළිබඳව තියෙන්නෙ උපමාව පමණයි. මෙතන භව නිරෝධයයි. භව නිරෝධය කියල කියන්නෙ - අපි කලිනුත් ප්‍රකාශකළා - සිතිවිලි වලිනුයි, සංස්කාරවලිනුයි, භවය ගොඩනැගෙන්නෙ මොහොතක් මොහොතක් පාසා. ඒකෙ සමුදය පක්ෂය විතරයි ලෝකයාට පෙනෙන්නෙ. ඒක නිසා ඝන සංඥාවෙන් මේ භවය දේවල් හැටියට හිතනව, කල්පනා කරනව.

නමුත් මේ හිතෙන් මේව හදන හැටි 'ඨිතං චිත්තං විප්පමුත්තං වයංචස්සානුපස්සති'[3] ආදී වශයෙන් අංගුත්තර ඡක්ක නිපාතයේ සූත්‍රයක සඳහන් වෙනව. නැවතුන සිත ඇති රහතන් වහන්සේ දකිනව - ඇත්ත

වශයෙන්ම හිත නවත්වාගත්තාමයි පේන්නෙ මේක - අර සංස්කාරයන්ගේ නිරෝධය. ඒ නිරෝධය ඊළඟට අරමුණු කරනව. ඒ නිරෝධය අරමුණු කරන කොට තමයි, ඒකේ කෙළවර තමයි ඉතින්, අර මුළු භවය හැදිල තියෙන්නෙ සංස්කාරවලින් නම් සංස්කාර නිරෝධය අරමුණු කරන කොට, අර ගිනි දැල්ල තුළින් ඒක විනිවිද දැක්කවගේ මාරයාගේ ග්‍රහණයෙනුත් මිදෙනව. ගින්න පිළිබඳ උපමාව ඉතාම පහසුවෙන් ගන්න පුළුවන් මේ භවය පිළිබඳ කාරණයට. මක් නිසාද? උපාදාන කියන වචනයට අපි කලිනුත් ප්‍රකාශ කළ හැටියට පාළියෙ අර්ථ දෙකක් දක්වනව. උපාදාන කියන්නේ අල්ලා ගැනීම පමණක් නොවෙයි. ඉන්ධන ද්‍රව්‍ය. ගින්නක් දැල්වීමට උපකාරවන දර ආදියටත් උපාදන කියනව. ඒවගේම භවයත් එකොළොස් ගින්නක් වශයෙන් දක්වනව. ගින්නක් හැටියට. එතකොට භව නමැති ගින්න පවතින්නෙ උපාදානය නිසයි. මේ තත්ත්වය අරමුණු කරගෙනයි එතකොට මේ ධ්‍යානය තියෙන්නෙ. භව නිරෝධය ප්‍රත්‍යක්ෂ කරන්නෙ ඒ ආකාරයෙන්. එතකොට 'භව නිරොධො නිබ්බානං' කියන එකෙන් නිබ්බානය භවනිරෝධයය කියලයි තේරුම්ගතයුත්තෙ. මෙතන නිරෝධ කියන වචනය බොහෝදුරට යෙදිල තියෙන්නෙත් ඒ අර්ථයෙන්. සමහර විට මේව කවලම්වන සවභාවයකුත් තියෙනව සඤ්ඤාවෙදයිතනිරොධ ආදී වශයෙන්.

ඊළඟට තවත් ඒවගේම වැදගත් සූත්‍රයක් තියෙනව අපට. අර සළායතන නිරෝධය නිර්වාණය යි කියන එක. මේ කොයි නාමයෙන් හැඳින්වුවත් එකම ප්‍රත්‍යක්ෂය තමයි කොයි පැත්තෙන් බැලුවත්. අපි කලිනුත් සඳහන් කළා මේ සළායතන නිරෝධයමයි නිර්වාණය කියල. ඒක හොඳට පැහැදිලිවන වටිනා සූත්‍රයක් එනව සංයුත්ත නිකායෙ සළායතන සංයුත්තයෙ. බුදුරජාණන්වහන්සේ එක්තරා අවස්ථාවක සංඝයා වහන්සේල අමතල, - ඒකට හේතුවන කිසිම ප්‍රශ්නයක් ඇතිව නොවෙයි, තමන් වහන්සේම එබඳු බොහොම ගැඹුරු සූත්‍ර දේශනා කරනව පශ්චිම ජනතාව ගැන හිතල වෙන්න ඇති - මෙන්න මෙහෙම දේශනාවක් කළා. ඒකත් ටිකක් ප්‍රහේලිකා විදියේ දේශනාවක්.

**'තස්මාතිහ භික්ඛවෙ සෙ ආයතනෙ වෙදිතබ්බෙ යත්‍ථ චක්ඛුඤ්ච නිරුජ්ඣති. රූප සඤ්ඤා ච විරජ්ජති**

**සෙ ආයතනෙ වෙදිතබ්බෙ යත්‍ථ සොතඤ්ච නිරුජ්ඣති සද්දසඤ්ඤාච විරජ්ජති**

**සෙ ආයතනෙ වෙදිතබ්බෙ යත්‍ථ ඝානඤ්ච නිරුජ්ඣති ගන්‍ධ සඤ්ඤාච විරජ්ජති**

**සෙ ආයතනෙ වෙදිතබ්බෙ යත්‍ථ ජිව්හා ච නිරුජ්ඣති රස සඤ්ඤාච විරජ්ජති**

**සෙ ආයතනෙ වෙදිතබ්බෙ යත්‍ථ කායොච නිරුජ්ඣති ඵොට්ඨබ්බ සඤ්ඤාච විරජ්ජති**

**සෙ ආයතනෙ වෙදිතබ්බෙ යත්‍ථ මනොච නිරුජ්ඣති ධම්ම සඤ්ඤා ච විරජ්ජති.**

**සෙ ආයතනෙ වෙදිතබ්බෙ සෙ ආයතනෙ වෙදිතබ්බෙ'**[4]

එතකොට මේකෙ අදහස මොකක්ද? 'එම නිසා මහණෙනි ඒ ආයතනය තේරුම් ගත යුතුයි. යම් තැනක ඇස නිරුද්ධ වේද රූප සඤ්ඤාව 'විරජ්ජ'වේද - මෙතන ඔන්න හොඳට ගැලපෙනව. අපි අර කලින් සඳහන් කළ විරාග කියන වචනයෙ එක්තරා අර්ථ භේදයක් තිබෙනව කියල. සාමාන්‍යයෙන්, විරාග කියන්නෙ නොඇල්ම. ඒ එක්කම අර සායමක් පාටක් හේදීයාම. ඒ අර්ථයත් මෙතන තියෙනව. විරාග, රාග කියන්නෙ පාටක් නම්, විශේෂයෙන් රතුපාට ආදිය, විරාග කියන්නෙ ගෙවීයාම මැකීයාම. අන්න දැන් මෙතන ඒ අර්ථය ඉතාමත්ම ප්‍රකටව තිබෙනව. චක්ඛුංච නිරුජ්ඣති ඇස නිරුද්ධ වෙනව. ඇස නිරුද්ධවීම නිසාම රූප සඤ්ඤාව මැකිලා වගේ යනව. විරජ්ජති' ඒ වගේම අනිත් ඒව ගැනත් කියනව. ඇස වගේම කණත්, යම්කිසි ආයතනයක - ආයතන කියන වචනය මොකක්ද කියල තෝරලවත් නැහැ - යම්කිසි තැනක, ආයතනයක අර කියාපු විදියට ඇසත් නිරුද්ධ වෙනව. රූප සඤ්ඤාවලුත් මැකීයනව. ගෙවී යනව. ඒ වගේම කණත් නිරුද්ධ වෙනව. ශබ්ද සඤ්ඤාවලුත් මැකීයනව. ඒ ආකාරයට අනිත් ඒවත් හිතාගන්න පුළුවන්, ඇස, කණ, නාසය, ගන්ධ සඤ්ඤාවත් මැකී යනව. ඊළඟට දිව නිරුද්ධ වෙනව. රස සඤ්ඤාව මැකී යනව. කය නිරුද්ධ වෙනව. ඵොට්ඨබ්බ සඤ්ඤාව මැකිල යනව. **සිතත් නිරුද්ධ වෙනව. ධම්ම සඤ්ඤාවනුත් මැකිල යනව**. මේකත් මතක තබා ගත යුතු විශේෂ කාරණයක් බවයි අපට පේන්නේ. සිතත් නිරුද්ධවෙනව ධම්ම සඤ්ඤත් මැකිල යනව. ධම්මසඤ්ඤා කියන්නෙ සිතිවිලි පිළිබඳව, සිතට අරමුණු වන ධර්ම පිළිබඳව, සඤ්ඤාවත් නැතිවෙල යනව. අන්න එබඳු ඒ ආයතනය තේරුම් ගත යුතුයි කියල බුදුරජාණන් වහන්සේ මේක දේශනාකරල - බුදුරජාණන් වහන්සේගේ විශේෂ උපායක් තමයි - මේක දේශනා කරල ආසනෙන් නැගිටල විහාරෙට ඇතුල් උනා. භික්ෂු සංඝයාවහන්සේලා මහා වික්ෂිප්ත තත්ත්වයකට පත්උනා. දැන් බුදුරජාණන් වහන්සේ මේ ඉතාමත් කෙටි මාතෘකා උද්දෙස වගේ පාඨයක් දේශනා කළේ සවිස්තරව විවරණය නොකර. දැන් අපි කොහොමද මේකෙ අර්ථය දැනගන්නෙ කියල සංඝයා වහන්සේල කථාකරල ඊළඟට ''ආයුෂමත් ආනන්ද තෙරුන් වහන්සේ ඉන්නව. සමහරවිට උන්වහන්සේට පුළුවන් මේව තේරුම් ගන්න'' කියල ආනන්ද ස්වාමීන් වහන්සේ ළඟට ගිහිල්ල ආරාධනා කළා බුදුරජාණන් වහන්සේ විසින් කෙටියෙන් උද්දෙස වශයෙන් දේශනා කරන ලද දේශනාවෙ අර්ථය සවිස්තරව අපට කියල දෙන්න කියල. ආනන්ද ස්වාමීන් වහන්සේ මුලින්ම මැලි වුනා, 'ඒ අවස්ථාවෙමයි ඔබවහන්සෙලට මේක අහගන්න තිබුනෙ. ඇයි මා ළඟට ආවෙ' කියල. නමුත් අවසානයේදී ඒ ඇවිටිල්ල නිසා ඊට එකඟවෙලා ආනන්දස්වාමීන් වහන්සේ ප්‍රකාශකළා. 'ඔන්න එහෙනම් මට තේරෙන හැටියට කියන්නම්. පස්සෙ බුදුරජාණන් වහන්සේගෙන් අහල සම්මත කරගන්න. මට තේරෙන හැටියට බුදුරජාණන්

වහන්සේ අර 'තස්මාතිහ භික්ඛවෙ සෙ ආයතනෙ වෙදිතබ්බෙ' ආදී වශයෙන් ප්‍රකාශ කළේ මෙන්න මේක නිසයි කියල එක පාඨයයි, එකම වාක්‍යයයි, ආනන්ද සවාමීන්වහන්සේ අටුවාව හැටියට ප්‍රකාශ කළේ. දැන් මේ කාලේ අටුවාව කියන කොට නම් එකපාරටම හිතට නැගෙන්නෙ මහ දිග අටුවාවක්. නමුත් මෙතන ආනන්ද සවාමීන් වහන්සේ දුන්නෙ එකම එක පාඨයයි අටුවාව හැටියට, මොකක්ද? 'සළායතන නිරොධං බො ආවුසො භගවතා සන්ධාය භාසිතං' - ඇවැත්නි සළායතන නිරෝධය සඳහා, සළායතන නිරෝධය සම්බන්ධයෙන් භාග්‍යවතුන්වහන්සේ මේ කියාපු පාඨය දේශනා කළා. ඒ කියන්නෙ මේ පාඨය දේශනා කළේ සළායතන නිරෝධය පිළිබඳවයි කියන එක. ඉතින් මෙතනින් හැඟෙනව අර ආයතන නමින් හඳුන්වල තියෙන්නෙ, බුදුරජාණන් වහන්සේ ආයතන කියල කිව්වෙ, අර එක් එක් ආයතනය නොවෙයි. මේ සළායතන නිරෝධනම් වූ නිවනයි. සාරත්ථප්පකාසිනී අටුවාවෙදි බුද්ධඝෝසාචාර්යයන්වහන්සේ ප්‍රකාශ කරනව - මෙතෙන්දිත් පිළිගන්නව සළායතන නිරෝධය නිබ්බානය බව අටුවාචාරීන් වහන්සේ පවා.

අටුවාවෙ සඳහන්වෙන්නෙ 'සළායතන නිරොධන්ති සළායතන නිරොධො වුච්චති නිබ්බානං තං සන්ධාය භාසිතනති අත්ථො [5]සළායතන නිරෝධය කියල මෙතන දේශනාවෙ තියෙන්නෙ, 'සළායතන නිරෝධ යයි කියනුයේ නිවනටය. ඒ සඳහා දේශනා කළා කියන එකයි මේකෙ අර්ථය. අටුවාචාරීන් වහන්සේත් මෙතෙන්දි පිළිගන්නව සළායතන නිරෝධයම තමයි නිර්වාණය කියල. දැන් මෙතනදීත් අපට වැදගත් කාරණා දෙකක්ම හෙළි උනා. එකක් අපි කලිනුත් සඳහන් කළ ආකාරයට නිවන සළායතන නිරෝධය වශයෙන් බුදුරජාණන් වහන්සේ හඳුන්වා දෙන ලද බව. ඊළඟට ඒවගේම බුදුරජාණන් වහන්සේ ළඟට සංඝයා වහන්සේල ගිහිල්ල මේ කාරණය ප්‍රකාශ කළා. ආනන්ද සවාමීන් වහන්සේ අපට මෙහෙම අටුවාවක් දුන්න කියල. අර අටුවාව සම්මත කළා. එතකොට මෙයින් අපට තේරෙනව සළායතන නිරෝධයම නිර්වාණයයි. ඒ වගේම දෙවෙනි කාරණය සමහර තැන්වල බුදුරජාණන් වහන්සේ මේ කියාපු තත්ත්වය ආයතන යන නාමයෙනුත් හඳුන්වල තියෙන බව.

ඊළඟට මේ සළායතන නිරෝධය 'ආයතන' නමින් හඳුන්වපු තවත් අවසථාවක්, එහෙම නැත්නම් නිවන 'ආයතන' නමින් හඳුන්වපු තවත් අවසථාවක්, අපට හමුවෙනව සළායතන විභංග සූත්‍ර දේශනාවෙ. බුදුරජාණන් වහන්සේ 'නෙක්ඛම්මසිත දොමනස්ස' නමැති ධර්ම කාරණය විස්තර කිරීමේදිත් ආයතන කියන නාමය යොදල තියෙනව. ඒ සූත්‍රයේ ගැඹුරු ධර්ම කොට්ඨාස රාශියක් සඳහන් වෙනව. 'නෙක්ඛම්මසිත දොමනස්ස' කියන වචන විතරක් තේරුම් ගන්න උපකාරවන සුළු විසතරයක්

කළොත් - මේ කියන්නෙ ඉන්ද්‍රිය ආරම්මණ ඇස් කන් නාසාදියට අරමුණු වන රූප ශබ්ද ආදී ඉන්ද්‍රිය ආරම්මණයන් 'අනිත්‍ය දුඃඛ විපරිණාම ධර්ම බව නුවණින් සළකල, යම්කිසි කෙනෙක් විදර්ශනා ප්‍රඥාවෙන් කල්පනා කරල නිවන පිළිබඳව යම්කිසි බලාපොරොත්තුවක් ආශාවක් - ආශාව කියන වචනය යෙදුවත් වරදක් නැහැ. 'රති' කියන වචනය සමහර විට ධර්මයේ යෙදිල තියෙනව' නිබ්බානරතො' ආදී වශයෙන් - ආශාවක් ඇතිකරගත්තොත් ඒ ආශාව නිසා සමහර විට දොම්නසක් ඇතිවෙනව. අන්න එබඳු දෙම්නසටයි 'නෙක්ඛම්මසිත දොමනස්ස' කියන්නෙ. ගෙහසිත දොමනස්සය තරම් නරක නැහැ - ඒක සම්පූර්ණයෙන්ම හොඳවට නොවෙයි. නමුත් නෙක්ඛම්මසිත දොමනස්සය හොඳ එකක් හැටියට - අරිට වඩා හොඳ එකක් හැටියට - බුදුරජාණන් වහන්සේ ඒ සූත්‍රයේ දක්වල තියෙනව. ඒ දොම්නස ඇතිවෙන ආකාරය උද්ධෘත පාඨයක් වශයෙන් ගත්තොත් මෙන්න මෙහෙමයි සඳහන් වෙන්නෙ. යම්කිසි භික්ෂුවක් කල්පනා කරනව-

**කුදස්සු නාමාහං තදායතනං උපසම්පජ්ජ විහරිස්සාමි යදරියා එතරහි ආයතනං උපසම්පජ්ජ විහරන්තීති ඉති අනුත්තරෙසු විමොක්ඛෙසු පිහං උපට්ඨාපයතො උප්පජ්ජති පිහා පච්චයා දොමනස්සං යං එවරූපං දොමනස්සං ඉදං වුච්චති නෙක්ඛම්මසිතදොමනස්සං**[6]

ඒ කියන්නෙ, 'කවදානම් මම ඒ ආයතනයට එළඹ වාසය කරන්නෙම්ද, කවර ආයතනයකටද - දැන් ආර්යයන් වහන්සේලා එළඹ වාසය කරන ආයතනයටය කියල ඊළඟට ඒ ආයතනය කියන්නේ මොකක්ද කියල හෙළි වෙන වචන කීපයකුත් කියැවෙනව. 'ඉති අනුත්තරෙසු විමොක්ඛෙසු පිහං උපට්ඨාපයතො' යන මේ විදියේ සිතිවිල්ලක්, අනුත්තර විමෝක්ෂයන් පිළිබඳව - අනුත්තර විමෝක්ෂ කියන්නෙ අනිමිත්ත අප්පණිහිත සුඤ්ඤත කියන විමෝක්ෂ තුනයි. එතකොට අනුත්තරෙසු විමොක්ඛෙසු පිහං උපට්ඨාපයතො' - ඒ අනුත්තර විමෝක්ෂයන් පිළිබඳව 'පිහා' කියල කියන ආසාව - බලාපොරොත්තුව - පිහිටුවන්නහුට 'උප්පජ්ජති පිහා පච්චයා දොමනස්සං' - ඒ ආශාව, බලාපොරොත්තුව, නිසා එක්තරා දෙම්නසක් ඇතිවෙනව. 'යං එවරූපං දෙමනස්සං' යම් එබඳු ඒ දෙම්නසක් වේද 'ඉදං වුච්චති නෙක්ඛම්මසිතදෙමනස්සං' - ඊට 'නෙක්ඛම්මසිත දෙමනස්ස' යයි කියල කියනව. එතකොට අපට මෙතනින් ඕන කරන කාරණය, අර අනුත්තර විමෝක්ෂවලින් හඳුන්වල තියෙන්නෙත් මේ නිවනමයි. මේ විමෝක්ෂ තුන පිළිබඳව ආශාව ඇතිකරගැනීම ගැන කියැවෙන්නෙ 'කවදානම් මම ඒ ආයතනයට එළඹ වාසය කරන්නෙම්ද, කියල. එතකොට මෙයින් අපට 'ආයතන' නාමයෙන් හඳුන්වපු අවස්ථා දෙකක්ම හමුඋනා. අපි තුන්වන අවස්ථාවකුත් ගනිමු මේ නිවන ආයතන නමින් හඳුන්වන.

'අත්ථි භික්ඛවෙ තදායතනං යත්ථ නෙව පඨවි න ආපො න තෙජො න වායො න ආකාසානඤ්චායතනං න විඤ්ඤාණඤ්චායතනං න ආකිඤ්චඤ්ඤායතනං න නෙවසඤ්ඤානාසඤ්ඤායතනං නායං ලොකො න පරලොකො න උභො චන්දිම සූරියා තත්‍රාපාහං භික්ඛවෙ නෙව ආගතිං වදාමි න ගතිං න ඨිතිං න චුතිං න උපපත්තිං අප්පතිට්ඨං අප්පවත්තං අනාරම්මණමෙවෙතං එසෙවන්තො දුක්ඛස්සාති'[7]

අපි මේ ප්‍රකාශ කළේ ඇත්තවශයෙන්ම නිර්වාණය පිළිබඳව ලොකු උගතුන් කවුරුත් - අටුවාචාරීන් වහන්සේලාත් ඇතුළු හැමකෙනෙක්ම - නිර්වාණය ගැන කරන හැම සාකච්ඡාවකම ඉදිරියට ගන්න ප්‍රබලතම සාධකයක් ඔවුන්ගේ යම් යම් නිගමන වලට.

අපි ඉස්සෙල්ල මේකෙ සාමාන්‍ය අර්ථය බලමු. 'අත්ථි භික්ඛවෙ තදායතනං' බුදුරජාණන් වහන්සේගේ බුද්ධ වචනයක් හැටියට මෙතන මේ උදානයේ පාටලිගාමීය වග්ගයේ එන නිබ්බාන පටිසංයුත්ත සූත්‍රයක් මේක. 'මහණෙනි එම ආයතනය ඇත. යම්බඳු ආයතනයක 'නෙව පඨවි' පොළොවත්' නැත පඨවි ධාතුවත්' නැත. ආපො තෙජො වායො ඒවගේම ආකාසානඤ්චායතනයත් නැත. විඤ්ඤාණඤ්චායතනයත් නැත. ආකිඤ්චඤ්ඤායතනයත් නැත. නෙවසඤ්ඤානාසඤ්ඤායතනයත් නැත. මෙලොවත් නැත. පරලොවත් නැත. සඳහිරු දෙකත් නැත. මහණෙනි, එහි මම 'නෙව ආගතිං වදාමි' - ඒමක් නැතැයි කියමි. 'න ගතිං' - යාමක් නැතැයි කියමි. 'න ඨිතිං' - සිටීමක් නැතැයි කියමි. 'න චුතිං' - චුතවීමක් නැතැයි කියමි. න උපපත්තිං' - උත්පත්තියක් නැතැයි කියමි. 'අප්පතිට්ඨං අප්පවත්තං අනාරම්මණං' - ප්‍රතිෂ්ඨාවක් නැති, පැවැත්මක් නැති අරමුණක් නැති එබඳු තත්ත්වයක් ඇති දෙයක්ය එය. 'එසෙවන්තො දුක්ඛස්ස' - මෙයම දුකෙහි කෙළවරයි.

එතකොට මේ සූත්‍ර දේශනාව තමයි නිර්වාණය ගැන හැම ප්‍රශ්නයකදීම බොහෝ දෙනෙක් ඉදිරියට ගන්නෙ. වැඩිදෙනෙක්ම නිර්වාණය පිළිබඳ සම්මත නිගමනය හැටියට සැලකෙන ඒ විවරණය තහවුරු කර ගැනීමට උපකාර කරගන්න ප්‍රබලම සාධකය තමයි මේක. අටුවා විවරණයත් අපි පසුවට දාල, මෙතෙක් අපි දියුණුකරගෙන ආපු යම්කිසි විවරණ මාර්ගයක් තුළින් මුලින්ම බලමු මේක තේරුම්ගන්න පුළුවන්ද කියල. මේ ආයතනය -ආයතන දෙකක් ගැන අපි ඉස්සෙල්ල සූත්‍රවල සඳහන් කළා. ඒ 'ආයතන' නිවන පිළිබඳවයි - දැන් මෙතනත් ඒ විදියෙ එකක් බවයි අපට කියන්න සිඬවෙන්නෙ. මේ කියන ආයතනය අර කියාපු අර සිත පිළිබඳ තත්ත්වයක්. අර්හත්ඵල සමාධිය පිළිබඳවයි මේ කියන්නෙ. ඒක අර්හත්ඵල සමාධිය පිළිබඳ විස්තරයක් නම්, දැන් මෙතන පළමුවෙන්ම කියනව පඨවි ආපො

තෙජො වායො ආදිය නැතිබව. මෙතෙක් අපි ඉදිරියට ගත්තු සූත්‍ර රාශියකම අහීත්ඵල සමාධිය, අනිදස්සන විඤ්ඤාණය ආදී ඒවා විග්‍රහ කරන අවස්ථා වල නිතරම ඉදිරිපත් වුන කියමන තමයි, එක්කො අනිදස්සන විඤ්ඤාණයෙ පඨවි ආපො තෙජො වායො පිහිටීමක් ලබන්නේ නැහැ කියනව. එහෙමත් නැතිනම් ඒ අහීත්ඵල සමාධියේදී පඨවිය පිළිබඳ පඨවි සඤ්ඤාවත්, ආපො පිළිබඳ ආපො සඤ්ඤාවත්, මනසිකාරයත්, ඒ කිසිවක් නැත කියල සඳහන් වෙනව. එයින්ම එතකොට පැහැදිලි වෙනව ඒ අහීත්ඵල සමාධියේදී පඨවි ආපො තෙජො වායො කියන ඒව ඒ සිතේ බලනොපාන බව හැඟවීමටයි මෙතන මේව නැතෙයි කියල තියෙන්නෙ. සාමාන්‍යයෙන් විස්තර කරන විදියට ඒව නැති තැනක්, අමුතු ලෝකයක්, හැටියට නොවෙයි. විශේෂයෙන්ම පිළිගත් විවරණය හැටියට තියෙන්නෙ රහතන් වහන්සේ මේ ජීවිතෙන් පස්සෙ, මරණයෙන් මතු - ඉතාම රහසිගතව වගෙයි ප්‍රකාශ කරන්නෙ. කෙළින් ප්‍රකාශ කිරීමෙන් සමහර විට වෙන දෘෂ්ටිවලට වැටෙන නිසාදෝ - ගිහිල්ල එකතුවෙන 'ආයතනය' හැටියටයි සාමාන්‍යයෙන් මේක තේරුම් ගන්නෙ. නමුත් මෙතන මේ කියැවෙන්නෙ ඇත්ත වශයෙන්ම ජීවමාන රහතන් වහන්සේ මේ ජීවිතයේදීම අත්දකින එක්තරා භවනිරෝධ තත්ත්වයක්. අර පඨවි ආපො තෙජො වායො ආදිය ඒකෙ නැහැ. ඒවගේම අර ආකාසානඤ්චායතනය විඤ්ඤාණඤ්චායතනය ආදිය නැති බවත් අපි මෙතෙක් ඉදිරියට ගත්තු ඒ සූත්‍රරාශියකම ප්‍රකාශ උනා. එතකොට රූපත් නැහැ අරූපත් නැහැ. රූප අරූප දෙකෙන්ම මිදිල. ඊළඟට කියවෙනව 'නායං ලොකො න පරලොකො' - මීට ටිකකට කලින් අපි සඳහන් කළ සූත්‍රයෙත් කියවුනා 'න ඉධලොකෙ ඉධලොකසඤ්ඤී න පරලොකෙ පරලොක සඤ්ඤී කියල. මෙලොව පිළිබඳ සඤ්ඤාවකුත් නැහැ පරලොව පිළිබඳ සඤ්ඤාවකුත් නැහැ කියල. ඒකයි මේ සූත්‍රයේ මෙතන කියල තියෙන්නෙ 'මෙලොවත් නැහැ පරලොවත් නැහැ' කියල. ඊළඟට කියනව, 'න උභො චන්දිමසුරියා' - සඳහිරු නැතිවීම. මේක තමයි හුඟක්ම ප්‍රබල සාධකයක් හැටියට දක්වන්නෙ නිවන යම්කිසි තැනක් කියල. තැනක්ය කියල නොකිය, යම්කිසි තැනක් හැටියට හිතාගන්නව. මක්නිසාද ඉරහඳ නැති තැනක්. නමුත් අපි කලින් ප්‍රකාශ කළා. අර අනිදස්සන විඤ්ඤාණය ගැන කියන කොට අර සිතේ ඇති සබ්බතොපහ ස්වභාවය නිසාම සළායතන නිරෝධය සැලසිලා ඇස් කන් ආදිය තිබුනට මොකද ඇත්ත වශයෙන්ම ඉරහඳ නිෂ්ප්‍රභා වෙනබව. ඒවායේ ආලෝකය මැකිල යනව. එතකොට 'න උභො චන්දිම සූරියා' සඳහිරු නැත කියල තියෙන්නෙ ඒ අර්ථයෙන්. ඊළඟට තත්‍රාපාහං භික්ඛවෙ නෙව ආගතිං වදාමි න ගතිං' ආදී වශයෙන් ප්‍රකාශ කරල තියෙන්නෙ 'ආගති ගති ඨිති චුති උපපත්ති' ආදී පද මීට කලින් දේශනාවල අපි ප්‍රකාශ කළා - මේව අර ලෝකයේ තියෙන සංඛත සාපේක්ෂක ධර්ම. ද්වයතාව හැටියට දැක්වූ ලෝකයේ තිබෙන සංඛත සංකල්ප, බොහෝ විට ද්වයතාවක් අනුවයි යන්නෙ. හැම එකක්ම දෙබිඩි හැටියට,

රූප අරූප ආදී වශයෙන් ඒවගේම යාම ඊම්. යාමක් තියෙනවනම් ඊමකුත් තියෙනව. දිග කොට ආදී වශයෙන්. දැන් එතකොට 'නෙව ආගතිං වදාමි' - එතන ආගති ඨිති ආදී ඒ කිසි සංකල්පයක් නැහැ. රහතන් වහන්සේගේ සිතේ ඒ අවස්ථාවෙ. යාම් ඊම් සිටීම චුතවීම් ඉපදීම් ආදී කිසිම සංකල්පයකින් කිලිටිවෙලා නැහැ ඒ තත්ත්වය. ඊළඟට 'අප්පතිට්ඨං අප්පවත්තං අනාරම්මණං' - 'අප්පතිට්ඨං' කියල කියන්නෙ අප්පණිහිත කියන අදහසමයි එතන, තෘෂ්ණාව ක්ෂය කිරීමෙන්, අප්පතිට්ඨං යන වචනයෙන් ඇඟවෙන්නෙ අප්පණිහිත විමොක්ඛයයි. ප්‍රතිෂ්ඨාවක් නැති බවයි. අප්පණිහිත කියන වචනයෙ තියෙන්නෙත් ඒ අර්ථයයි. ඒ විමෝක්ෂය ගැන කෙරුන සඳහනක් එතන. 'අප්පවත්තං' - කියල කියන්නෙ සුඤ්ඤත විමොක්ඛයයි. පැවැත්මක් නැති. ඊළඟට 'අනාරම්මණං' - ඒක ඉතාම පැහැදිලි නිසා තේරුම්ගන්න පුළුවන්. අනිමිත්ත සවභාවයයි. අරමුණක් නැති සවභාවය අනිමිත්ත සවභාවයයි. මෙයම දුකෙහි කෙළවරයි. එතකොට දුකෙහි කෙළවර මෙලොවම 'දිට්ඨෙව ධම්මෙ'. රහතන් වහන්සේ මරණින් මතු ලබන ලොකු නිවනක් නොවෙයි. මෙතන නිවනෙ භාගයක් ලබල එතන සම්පූර්ණ කරගන්න එකක් නොවෙයි. අන්න ඒ අදහසයි එතකොට මේ විවරණ මාර්ගය අනුව තේරුම් ගන්න පුළුවන් වෙන්නෙ. එහි යම් අඩුපාඩුවක් ඇතොත් හරිගස්සගන්න අටුවාවෙත් පිහිට සොයමු.

පරමත්ථදීපනී උදාන අටුවාවෙ[8] අපි මෙතෙක් තෝරපු කාරණාව තෝරන්නෙ මෙන්න මේ විදියටයි. මෙක ආයතනයක්ය කියල හඳුන්වල තියෙන්නෙ 'කාරණ' කියන අර්ථයෙන්ය. ඇසට රූප අරමුණු වෙන්න වගේ මේ කියාපු අසංඛත ධාතුව රහතන් වහන්සේගේ සිතට අරමුණු වෙනවය. ඒ අරමුණටයි මේ ආයතන නාමය යොදල තියෙන්නෙ. ඒ කියාපු ඒ යම්කිසි ස්ථානයක පඨවි ආපො තෙජො වායො නැත්තෙ මක් නිසාද. මේ පඨවි ආපො තෙජො වායො කියන ඒව සංඛත ධර්ම. එතකොට අපි මේ කථා කරන්න යන්නෙ අසංඛතය ගැනයි. සංඛත අසංඛත ධර්ම මිශ්‍රවීමක් නැහැ. එකට එක, එක ළඟ පැවතීමක් නැහැ. අන්න ඒ නිසයි මේ පඨවි ආපො තෙජො වායො ආදිය නැතිබව ප්‍රකාශ කරල තියෙන්නෙ. එහෙම තෝරල ඊළඟට කියනව ආකාසානඤ්චායතන, විඤ්ඤාණඤ්චායතන ආකිඤ්චඤ්ඤායතන නෙවසඤ්ඤානාසඤ්ඤායතන කියන අරූප තත්ත්ව නැත්තේ මක්නිසාද කියන එක තෝරන්නෙ කොහොමද? නිවන අරූපී සවභාවයක් නමුත් යම්කිසි හේතුවක් නිසා - මොකක්දෝ අවාසනාවක් නිසා - එතනත් නැහැ අර කියාපු අරූප භව. අරූපභවයේ තත්ත්වයක් එතන නැහැ. ඊළඟට 'නායං ලොකො න පරලොකො' ඒ කියන්නෙ නිවනෙහි කාමභවයත් නැහැ. කාමභවයක් නැත්නම් මෙලොවක් පරලොවකුත් නැහැ. ඒක නිසා අර කියාපු විදියට නිවනෙහි මෙලොවකුත් නැහැ. පරලොවකුත් නැහැ. ඊළඟට

ඉරහඳ නැත්තෙ මක්නිසාද? ඒක තෝරන්නෙ, රූප භවයක් තියෙනවනම්, රූප භවයක සාමාන්‍යයෙන් අඳුරක් තියෙන්න ඕන. අඳුර නැතිකරන්න ඉරක් හඳක් තියෙන්න ඕන. නිවනෙ රූප භවයක් නැහැ. එහෙනම් කොහෙද ඉරක් හඳක්? ඔන්න ඔය විදියටයි ඒක තෝරන්නෙ. ඊළඟට එහි යාමක් ඒමක් සිටීමක් චුතියක් උපපත්තියක් නැතෙයි කියන එක තෝරන්නෙ නිවනට කොතනකින්වත් කවුරුවත් එන්නෙ නැහැ. එතන ඉඳල කොහේටවත් යන්නෙත් නැහැ. එතන යන්න තැනකුත් නැහැ. එන්න තැනකුත් නැහැ. ඒ වගේම චුතවීමක් ඉපදීමක් මොකක්වත් එතන නැහැ. එතන සිටීමකුත් නැහැ. ඔන්න ඔහොම තත්ත්වයක්, ගූඪ දෙයක්, කියල හිතාගන්න එකයි, ඊට එහාට අපට තේරුම්ගන්න බැහැ කියන එකයි කියන්නෙ. ඊළඟට 'අප්පතිට්ඨං අප්පවත්තං අනාරම්මණං' කියන එක තෝරන්නෙ නිවන අරූපී සවභාව නිසා කොතනකවත් පිහිටල නැහැ. රූපී දෙයක් නම් තමයි පිහිටන්නෙ. එතකොට අරූපී නිසා නිවන කොහේවත් පිහිටල නැහැ. 'අපපවත්තං' කියන්නෙ නිවන පවතින්නෙත් නැහැ. 'අනාරමමණං' කියන්නෙ නිවන කොහේවත් එල්බගන්නෙ නැහැ. සමහරවිට අපට හිතුනොත් නිවනෙ එල්බ ගන්න පුළුවන්. නමුත් නිවන කොහේවත් එල්බගන්නෙ නැහැ. අන්න එතකොට නිවනටමයි මේ ඔක්කොම බාරදීල තියෙන්නෙ. ඔන්න ඔය විදියටයි සම්මත විවරණය හැටියට තියෙන්නෙ අටුවාවෙ. එතකොට අපි අර ප්‍රකාශකළ අදහස් වල යම් අඩුපාඩුවක් තියෙනවනම් මේකෙන් හරිගස්සගන්න ඇහැකි. නමුත් අපට සාමාන්‍ය නුවණින් කල්පනාකරල බලනකොට පේනව මෙතන මහව්‍යාකූලත්වයක්. අපි අර කලින් සඳහන් කළ භවනිරෝධය පිළිබඳ සංකල්පය, ඒ ගැඹුරු අදහස, ඒක තේරුම් ගැනීමට අපහසුවීම නිසාදෝ මේ තරම් ව්‍යාකූලත්වයක් ඇතිවෙලා තියෙනව. ඇත්ත වශයෙන්ම භව තෘෂ්ණාවකට ඉඩදෙන විදියේ විග්‍රහයකින් මේ නිවන පිළිබඳ විවරණය අවසානවෙන්නෙ. අටුවාචාරීන්වහන්සේලා ඉදිරිපත්කරන විවරණ ඉතා සියුම් භවතෘෂ්ණාවකට ඉඩතබනව. ඒ කියන්නෙ රහතන්වහන්සේලාගේ කය නැතිවුනාට පස්සෙ කොහේදෝ ගිහිල්ල රහතන්වහන්සේල එකතුවෙනව යම්කිසි ආයතනයක. ඒක කෙලින්ම කියන්නෙ නැහැ සමහර තැන්වල ඇහෙන්න ඉඩ අරිනව. එබඳු තැනක විස්තර තමයි ඔය කියන්නෙ. ඉර හඳ නැති අමුතු විදියෙ **තැනක් නොවන තැනක්**. මේවාගේ ව්‍යාකූලත්ව රාශියකට මූලික හේතුව හැටියට ගන්න තියෙන්නෙ මේ ධර්මයෙ තියෙන ගම්භීරත්වයමයි. ධර්මගාම්භීර්යයමයි. බුදුරජාණන් වහන්සේ එක්තරා අවසථාවක සාරිපුත්ත සවාමීන් වහන්සේට දේශනාකළ සූත්‍රයක් සඳහන්වෙනව අංගුත්තර නිකායෙ තික නිපාතයෙ. උන්වහන්සේ එක්තරා විදියක ධර්ම සංවේගයකින් ප්‍රකාශ කරන කාරණයක් වෙන්නත් පිළිවන්.

**- සංඛිත්තෙනපි ඛො අහං සාරිපුත්ත ධම්මං දෙසෙය්‍යං විත්ථාරෙන පි ඛො අහං සාරිපුත්ත ධම්මං දෙසෙය්‍යං සංඛිත්තවිත්ථාරෙනපි ඛො අහං සාරිපුත්ත ධම්මං දෙසෙය්‍යං අඤ්ඤාතාරොව දුල්ලභා'**

''සාරිපුත්‍රය මම සැකෙවින් මේ ධර්‍මය දේශනා කළත්, සවිස්තරව ධර්‍මය දේශනා කළත්, සැකවෙින් සහ සවිස්තරව ධර්‍මය දේශනා කළත්, තේරුම්ගන්න අය තමයි දුර්ලභ''. එතකොට සාරිපුත්ත ස්වාමීන් වහන්සේ එතනින් නවතින්නෙ නැතිව ආරාධනා කරනව බුදුරජාණන් වහන්සේට 'එතස්ස භගවා කාලො එතස්ස සුගත කාලො' 'ආදීවශයෙන් මෙන්න මේකයි කාලය, මේ දැන් කාලය ඇවිල්ල තියෙනව, භාග්‍යවතුන් වහන්ස සුගතයන් වහන්ස සැකෙවින් හෝ ධර්‍මය දේශනාකරන්න. සවිස්තරව හෝ දේශනාකරන්න. සැකෙවින් හා සවිස්තරව කියන දෙයාකාරයෙන්ම දේශනාකරන්න. 'භවිස්සන්ති ධම්මස්ස අඤ්ඤාතාරො' 'ධර්‍මය තේරුම් ගන්න අය ඉන්න පුළුවන්' කියල සැරියුත් ස්වාමීන්වහන්සේ ආරාධනා කළා. එතකොට බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනව -

**'තස්මාතිහ සාරිපුත්ත එවං සික්ඛිතබ්බං ඉමස්මිංච සවිඤ්ඤාණකෙ කායෙ අහිංකාරමමිංකාර මානානුසයා න භවිස්සන්ති බහිද්ධාච සබ්බ නිමිත්තෙසු අහිංකාර මමිංකාර මානානුසයා න භවිස්සන්ති යංච චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං උපසම්පජ්ජ විහරතො අහිංකාර මමිංකාර මානානුසයා න හොන්ති තංච චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං උපසම්පජ්ජ විහරිස්සාමාති එවං හි වො සාරිපුත්ත සික්ඛිතබ්බං**

''හොඳයි එහෙනම් සාරිපුත්ත මෙන්න මේ ආකාරයට හික්මිය යුතුයි. කොයි ආකාරයටද, මේ සවිඤ්ඤාණක කය - විඤ්ඤාණ සහිත මේ කය - පිළිබඳව අහංකාර මමංකාර මානානුසයන් නොවන්නේය. බැහැර සියලු නිමිති පිළිබඳවත් අහංකාර මමංකාර මානානුසයන් නොවන්නේය. යම් චෙතොවිමුත්තියකට පඤ්ඤාවිමුත්තියකට එළඹ වාසය කරන්නහුට අර කියාපු විදියට දෙආකාරයට අහංකාර මමංකාරමානානුසයෝ නොවෙත්ද අන්න එබඳු ඒ චෙතොවිමුත්තියට පඤ්ඤාවිමුත්තියට එළඹ වාසය කළ යුතුය. මෙසේය සාරිපුත්ත නුඹලා විසින් හික්මිය යුත්තේ කියල ඒ විදියට ප්‍රකාශ කරල බුදුපියාණන්වහන්සේ ඊළඟට ප්‍රකාශකරනව මෙහෙම හික්මෙන භික්ෂුව අවසානයේ ලබන තත්ත්වය -අයං වුච්චති සාරිපුත්ත භික්ඛු අච්ඡෙච්ජි තණ්හං වාවත්තයි සඤ්ඤොජනං සම්මාමානාභිසමයා අන්තමකාසි දුක්ඛස්ස - එබඳු භික්ෂුව තණ්හාව සිඳ දැම්ම සංයෝජන බැම්වල කොකු අනිත් පැත්තට හැරෙව්ව, මානයේ යථාස්වභාවය අවබෝධ කරගෙන දුක් කෙළවර කළා, කියල ඊළඟට ඒ දේශනාව අවසානයේ බුදුපියාණන් වහන්සේ තමන්වහන්සේම සුත්තනිපාතයේ පාරායණ වග්ගයේ දේශනාකළ, එක්තරා උදයපඤ්හා කියන සූත්‍රයක දේශනාකළ, ගාථාවක් තමන් වහන්සේම උපුටා

දක්වනව. මේ සූත්‍රනිපාතයට කොයිතරම් වැදගත් තැනක් දුන්නද කියල අපට හෙළිවෙනව. සූත්‍ර පිටකයෙ බොහෝතැන්වල බුදුරජාණන් වහන්සේ තමන් වහන්සේගේම දේශනාව උඬෘත වශයෙන් දක්වනව. මම අන්න පාරායණවග්ගයෙ අහවල් සූත්‍රයෙ මෙහෙම කියල තියෙනව. මම අටඨකවගගයෙ අහවල් තැන මෙහෙම දේශනාකරල තියෙනව. එයින් තේරුම් ගන්න පුළුවනි ඇත්ත වශයෙන්ම දැන් මේ කාලයේ උඬෘතපාඨ දක්වනකොට වෙන වෙන ග්‍රන්ථ සොයාගෙන යනව. නමුත් සුතත නිපාතය බුදුරජාණන්වහන්සේ පවා උඬෘතපාඨ දක්වපු වටිනා ග්‍රන්ථයක්. ඒ ටික අමතරවයි කිව්වෙ. පාරායණවගගයේ 'උදයපඤ්හ' සූත්‍රයෙන් දක්වපු ඒ ගාථාව මෙන්න මෙහෙමයි.

**පහාණං කාමසඤ්ඤානං දෙමනසසානවූභයං**
**ථිනසස ච පනූදනං කුකකුචචානං නිවාරණං**
**උපෙකඛා සති සංසුදධං ධමමතකක පුරෙජවං**
**අඤ්ඤා විමොකඛං පබ්‍රෑමි අවිජජායපපභෙදනං**

'පහාණං කාමසඤ්ඤානං දෙමනසසානවූභයං - කාමසඤ්ඤාවන් සහ දෙම්නස් කියන - දොම්නස් කියල කියන්නෙ අර ව්‍යාපාදයට ළඟ අදහසයි නීවරණ ගැනයි මේ ප්‍රකාශය - කාම සඤ්ඤා සහ දෙම්නස් කියන මේ දෙකේම ප්‍රහාණයෙන් යුක්තවූ, ප්‍රහාණය ඇති, ථිනසසව පනුදනං - ථීන මිද්ධය දුරලන, ථීන කියන වචනයෙන් ඒ අදහස් දෙකම ගන්න පුළුවන්. ථීනමිද්ධ කියන ඒ නීවරණය ඉවත්කරන්නාවූ, කුකකුච්චානං නිවාරණං - කුකුස් ආදිය නිවාරණය කරන්නාවූ. 'උපෙකඛාසති සංසුදධං' උපේක්ෂාවෙන් හා සතියෙන් පිරිසිදුවූ, මේ ඔක්කොම විශේෂණපද - ධමමතකකපුරෙජවං - ධමමතකක - සමමාදිටඨිය අනුව යන සමමා සංකල්ප. මේ මාර්ගීචිත්තයේ තත්ත්වයක් මේ ප්‍රකාශකරන්නෙ. 'සමමාදිටඨිපුරෙකඛාර' කියල ගන්නත් පුළුවන්. සමමා සංකපප කියල ගන්නත් පුළුවන්. එය පෙරටුකොට ඇත්තා වූ, ඒ අවිද්‍යාව බිඳින්නාවූ ඒ තත්ත්වයට - ඒ සමාධියට - මම 'අඤ්ඤාවිමොකඛය'යයි කියමි. එතකොට මේ අර්හත්ඵල සමාධිය අඤ්ඤාවිමොකඛ නමින් හැඳින්වූ බවටත් මෙතන හොඳ සාධකයක් අඤ්ඤාවිමොකඛං පබ්‍රෑමි අවිජජායපපභෙදනං'. ඊළඟට මේ සමාධිය පිළිබඳ තවත් දෘෂටිකෝණයකින්, තවත් පැත්තකින්, අපට තව විස්තර හෙළිවෙන සූත්‍රයක් තියෙනව අංගුත්තර නිකායෙ නවක නිපාතයෙ. ආනනද සවාමීන් වහන්සේ භික්ෂූන් වහන්සේලාට දේශනාකරන එක්තරා සූත්‍රයක් කොසඹෑනුවර ඝෝසිතාරාමයේදී -

**"අචජරියං ආවුසො අබ්භුතං ආවුසො යාවඤ්චිදං තෙන භගවතා ජානතා පසසතා අරහතා සමමා සමබුදෙධන සමබාධෙ ඔකාසාධිගමො අනුබුදෙධා සතතානං විසුදධියා සොකපරිදෙවානං සමතිකකමාය**

**දුක්ඛදොමනස්සානං අත්ථංගමාය ඤායස්ස අධිගමාය නිබ්බානස්ස සච්ඡිකිරියාය තදෙව නාම චක්ඛු භවිස්සති තෙ රූපා තඤ්චායතනං නො පටිසංවෙදිස්සති තදෙව නාම සොතං භවිස්සති තෙ සද්දා තඤ්චායතනං නො පටිසංවෙදිස්සති තදෙව නාම ඝානං භවිස්සති තෙ ගන්ධා තඤ්චායතනං නො පටිසංවෙදිස්සති සා එව නාම ජිව්හා භවිස්සති තෙ රසා තඤ්චායතනං නො පටිසංවෙදිස්සති සො යෙව නාම කායො භවිස්සති තෙ ඵොට්ඨබ්බා තඤ්චායතනං නො පටිසංවෙදිස්සති'**[10]

කියල ඔහොම දේශනාවක් ප්‍රකාශකරනව. ඒ කියන්නෙ ආනන්ද ස්වාමීන් වහන්සේ බුදුරජාණන් වහන්සේ පිළිබඳව වර්ණනාත්මකව ප්‍රකාශකරනව - 'ඇවැත්නි මේ කාරණය මහ ආශ්චර්යවත් දෙයක්, මේකෙ අද්භූත දෙයක්, මොකක්ද, ඒ දතයුතුවූ සියල්ල දත් භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ විසින් 'සම්බාධෙ ඔකාසාධිගමො අනුබුද්ධො' - සම්බාධ කියල කියන්නෙ ඉඩකඩ නැතිතැනක්. ඉඩකඩ නැති තැනක යම්කිසි ඉඩක් සොයාගත්ත. සම්බාධවූ තැනක, කොහෙත්ම ඉඩක් නැති මහ ගැටලුතැනක, යම්කිසි ඉඩක් හොයාගත්ත. කුමක් සඳහාද? සත්ත්වයින්ගේ විසුද්ධිය පිණිස - 'සත්තානං විසුද්ධියා' - සෝකවැළපුම් ඉක්මවීම පිණිස දුක් දොම්නස් කෙළවරකිරීම පිණිස, ආර්ය අෂ්ටාංගික මාර්ගය ලබාගැනීම පිණිස, නිවන ප්‍රත්‍යක්ෂකර ගැනීම පිණිස, මෙන්න මෙබඳු ඕකාසයක් ඇතිකරගත්ත. ඒ ඕකාසය පිළිබඳ විස්තරයයි ඊළඟට කියැවෙන්නෙ. 'තදෙව නාම චක්ඛු භවිස්සති තෙ රූපා තඤ්චායතනං නො පටිසංවෙදිස්සති'. ඒ ඇහැම තියෙනව, ඒ රූපයනුත් තියෙනව. නමුත් ඒ ආයතනයක් විඳින්නෙ නැහැ. දැනෙන්නෙ නැහැ. ඇහැක් තියෙනවනම් රූප තියෙනවනම් පේන්ට ඕන. නමුත් මෙතන තත්ත්වය කුමක්ද? එම ඇහැම තියෙනව, එම රූපම තියෙනව - නමුත් ආයතනයක් හැදෙන්නෙ නැතෙයි කියන එකයි මෙතන කියන්නෙ. ආයතනයක් හටගන්නෙ නැහැ. චක්ඛුසම්ඵස්සායතනය හට ගන්නෙ නැහැ මේ දෙක තිබුනට. ඒවාගේම කණත් තිබෙනව. ශබ්දත් තියෙනව. නමුත් ඇහෙන්නෙ නැහැ. ඒ ආයතනය පිළිබඳ පටිසංවේදනාවක් නැහැ. නැහැයත් ගන්ධ සඤ්ඤවත් පිළිබඳව වුනත් එහෙමයි. දිවත් රසත් පිළිබඳවත් එහෙමයි. කයත් ස්පර්ශයත් පිළිබඳවත් එහෙමයි කියල ඔහොම ප්‍රකාශ කළාම, උදායි ස්වාමීන් වහන්සේ ආනන්ද ස්වාමීන් වහන්සේගෙන් අහනව - 'සඤ්ඤී යෙව නුඛො ආවුසො තදායතනං නො පටිසංවෙදිස්සති උදාහු අසඤ්ඤී - ඇවැත්නි එහෙම ආයතනයක ප්‍රතිසංවේදනයක් නැත්තෙ, විඳින්නෙ නැත්තෙ, සඤ්ඤව තිබෙද්දිද? සඤ්ඤව නැති නිසාද? කෙනෙකුට ඇතිවන ගැටළුවක් ඒ අහන්නෙ. සඤ්ඤව නැති නිසාද ඒක වෙන්නෙ සඤ්ඤව තිබෙද්දිද? එතකොට ආනන්ද ස්වාමීන් වහන්සේ ප්‍රකාශ කරනව 'සඤ්ඤීයෙව ආවුසො' සඤ්ඤවක් තිබෙද්දීය අරම තත්ත්වයක් ඇතිවෙන්නෙ. දැන් අපට හිතාගන්න පුළුවන් අර කලින්

අවසථාවක 'න සඤ්ඤසඤ්ඤී න විසඤ්ඤසඤ්ඤී ආදී ප්‍රහේලිකා ගාථාවත් මෙන්න මේ ප්‍රශ්න නිසාමය ඇති වෙලා තියෙන්නෙ කියල. අර විදියෙ තත්ත්වයක් උනත්, සඤ්ඤව තිබුනත්, අර ආයතනය පිළිබඳ ප්‍රත්‍යක්ෂ වේදනාවක් නැහැ. එහෙම ප්‍රකාශකරල, තවදුරටත් පොඩි විස්තරයක් හැටියට මේකටම අදාළ කාරණයක් - තවත් කාරණා ප්‍රකාශකරනවා අනෙකුත් සමාධි පිළිබඳව - නමුත් ඇත්ත වශයෙන්ම අපට අදාළවන නිවන පිළිබඳ කාරණය අවසානයේ ආනන්ද ස්වාමීන් වහන්සෙ ප්‍රකාශ කරනව. එක් අවසථාවක සාකේතයෙ අඤ්ජනවනයෙ මිගදායේ මා සිටින අවස්ථාවක ජටිලාගාහියා භික්ෂුණිය මා ළඟට ඇවිල්ල මෙන්න මෙහෙම ප්‍රශ්නයක් මගෙන් ඇසුව.

**'යායං භන්තෙ ආනන්ද සමාධි නචාභිනතො නචාපනතො න සසංඛාරනිග්ගය්හවාරිතවතො විමුත්තත්තා ඨිතො ඨිතත්තා සන්තුසිතො සන්තුසිතත්තා න පරිතස්සති අයං භන්තෙ සමාධි කිංඵලො වුත්තො භගවතා'**

ඒ කියන්නෙ ස්වාමීනි ආනන්ද, ආනන්දස්වාමීන් වහන්ස, යම් සමාධියක් මේ ලක්ෂණවලින් යුක්තද - න ච අභිනතො' - අභිනතො කියන්නෙ යමක් දෙසට හැරුනු, 'අපනතො' කියන්නෙ එයින් ඉවතට හැරුනු. මේ වචන දෙක යොදන්නෙ රාග ද්වේෂ කියන දෙකටයි. අභිනත කියන්නෙ රාග වශයෙන් ඉදිරියට නැමුනු, නැත්නම් වෙතට නැමුනු 'අපනත' කියන්නෙ ඉවතට නැමනු - ද්වේෂයෙන්. ඒ රාග ද්වේෂ තත්ත්ව මෙතන නෑ. ඒවගේම 'න සසංඛාර නිග්ගය්හවාරිතවතො' සංස්කාරබලයෙන් නිග්‍රහකරල යටපත් කරල බලහත්කාරයෙන් නවත්වල ඇතිකරගත්තු ව්‍රත ස්වභාව තත්ත්වයකුත් නොවෙයි මේක. සාමාන්‍ය ධ්‍යානසමාධි ආදිය හැම එකක්ම සංඛත දේවල් නම්, සංස්කාර බලයෙන් පවතින දේවල් නම්, ඒ හැම එකකම අර කියාපු ලක්ෂණය තියෙනව. මොකක්ද? සංස්කාර බලයෙන් ඒව මැඩපවත්වල ගලාගෙන එන දේවල් තාවකාලිකව නවත්වල. ඒක තමයි 'වික්ඛම්භන' කියල කියන්නෙ. එතකොට සාමාන්‍ය සමාධියක්, ධ්‍යානයක්, නම් විෂ්කම්භන අවසථාවක්. නමුත් මෙතන තියෙන්නෙ 'න සසංඛාරනිග්ගය්හවාරිතවතො' - නමුත් මේක නම් සංස්කාර බලයෙන් නිග්‍රහකරල නවත්වපු තත්ත්වයක් නොවෙයි. විමුත්තත්තා ඨිතො - එය ඨිතයි. එය ඨිත සවභාවයි සාමාන්‍යයෙන් සමාධියක ඨිත, සඨිත, සඨිර, ස්වභාවය තියෙන්නෙ, උපමාවක් කියනව නම් - ධර්මයෙ එන උපමාවක් නොවෙයි ගොඩේ උපමාවක් - බමරයක් එහෙම ගහනකොට ඒක කරකැවි කරකැවි තිබීමම කෙලින් සිටීමට උපකාර වෙනව. අන්න ඒ වගේ සංස්කාර බලය නිසයි සමාධිය පවතින්නෙ, සමාධියෙ ඨිත තත්ත්වය තියෙන්නෙ. නමුත් මෙතන කියන ඨිත තත්ත්වය සංස්කාර බලයෙන් නොවෙයි. 'විමුත්තත්තා

ඨිතො - සංස්කාරවලින් විමුක්ත නිසාම ඨිත ස්‍වභාවය. ඒක අරිට වඩා ස්‍ථාවර ස්ථිතියක්. ඊළගට - 'ඨිතත්තා සනතුසිතො' එහි ඨිත ස්‍වභාවය නිසාම සන්තුසිත - සන්තොෂ ස්‍වභාවය තිබෙනව. සාමාන්‍ය ධ්‍යාන සමාධි තත්ත්‍වය හඳුන්වල තියෙන්නෙ සූත්‍රවල, කුප්පපටිච්ච සන්ති' හැටියට. ඒක කොප්‍යයි. කුපිතවෙනව. සැලෙනව. මේක' අකුප්පා.' ඒකයි මෙතනින් හැඟෙන්නෙ. 'අකුප්පාචෙතොවිමුත්ති, ගැන කියන බව මෙතනින් හිතාගන්න පුළුවන්. 'විමුත්තතතා ඨිතො ඨිතතතා සනතුසිතො' ස්ථිත නිසාම සන්තුෂ්ට, සතුටු ස්වභාවයක්. ඊළඟට 'සනතුසිතතතා න පරිතස්සති' එහි සතුටු ස්‍වභාවය තිබෙන නිසාම උද්ධච්ච ආදී කිසිවක් නැහැ. ඒක නිසා පරිතස්සනාවක්, පරිතෘෂ්ණාවක් (ඒ වචනයත් බොහොම අර්ථරාශියක් ඇති එකක්) අපට කියන්න පුළුවන් තැති ගැනීම් ආදියක් නැහැ. අන්න එබඳු සමාධිය - 'අයං සමාධි කිංඵලො වුත්තො භගවතා' එබඳු සමාධිය කුමක් ඵලය කොට ඇත්දැයි භාග්‍යවතුන් වහන්සේ විසින් දේශනාකරන ලදද' කියල ආනන්ද ස්වාමීන් වහන්සේගෙන් මේ ජටිලාගාහිය, භික්ෂුණිය ඇසුවාම - ආනන්ද ස්වාමීන් වහන්සේ තාම භික්ෂුන් වහන්සේලාටයි මේ කියන්නෙ අතීත සිද්ධියක් ගැන -මම එතකොට මෙන්න මේ විදියට ප්‍රකාශ කළයි, කොහොමද - 'යායං භගිනි සමාධි නචාභිනතො නචාපනතො න සසංඛාරනිගගය්හවාරිතවතො විමුතතතතා ඨිතො ඨිතතතා සනතුසිතො සනතුසිතතතා න පරිතසසති අයං භගිනි සමාධි 'අඤ්ඤඵලො වුත්තො භගවතා.

අර කියාපු ලක්ෂණවලින් යුක්ත සමාධියට බුදුරජාණන්වහන්සේ ප්‍රකාශ කළේ 'අඤ්ඤඵලො' කියල. අඤ්ඤව ඵලය කොට ඇති සමාධිය. අඤ්ඤව කියන වචනය ගැන අපි කලින් ප්‍රකාශ කළා. පූර්ණ අවබෝධය, ප්‍රත්‍යක්ෂ අවබෝධය, සහතිකව දැනගැනීම. ඒ අතීත ප්‍රවෘත්තිය කියල ඊළඟට නැවතත් සංඝයා වහන්සේලා අමතල ආනන්දස්වාමීන්වහන්සේ ප්‍රකාශකරනව - 'එවං සඤ්ඤීපි බො ආවුසො තදායතනං නො පටිසංවෙදෙති'. ඉහළම අර්ථයෙන් ගත්තොත් අන්න එබඳු අභිත්ඵල සමාධියෙත් අර විදියටම ආයතන පිළිබඳව විඳීමක් නැත. 'තදායතනං නො පටිසංවෙදෙති'. දැන් එතකොට අභිත්ඵල සමාධිය ගැන පුළුල් අවබෝධයක් ලබාගැනීමට ඒ ඒ අංශවලින් අපට කාරණා දැනගන්නට ලැබුනා. ඒවගේම සමහර තැන්වල දක්වල තියෙන 'අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්‍වා උපසම්පජ්ජ පවෙදෙති 'ආදි වාක්‍ය වලින් අනාසව චෙතොවිමුත්ති පඤ්ඤාවිමුත්ති කියන පද දෙකමත් යොදල තියෙනව මේ රහතන් වහන්සේ ලබන ප්‍රත්‍යක්ෂය පිළිබඳව.

ඒ වගේම තවත් වැදගත් සූත්‍රයක් අපට හමුවෙනව. රහතන්වහන්සේ මේ අභිත්ඵල සමාධියට සමවැදිල ඉන්නකොට ඒ ලෝකොත්තර තත්ත්‍වය

කොයි ආකාරයටද වටහාගත යුත්තෙ කියන එක පිළිබඳව යම්කිසි අදහසක් දෙන සූත්‍රයක් එනව අංගුත්තරනිකායෙ චතුක්කනිපාතයෙ භණ්ඩගාම වගගයෙ.[11] හතරෙ ඒව එන සූත්‍රයක්, ඒකෙ සඳහන් වෙනව පුද්ගලයින් හතරදෙනෙක් ගැන. අනුසොතගාමී පුද්ගලයෙක්, පටිසොතගාමී පුද්ගලයෙක්, ඨිතත්ත පුද්ගලයෙක්, හතරවෙනි පුද්ගලය 'තිණ්ණො පාරගතො ථලෙ තිට්ඨති බ්‍රාහ්මණො' කියල. පළමුවෙනි අනුසොතගාමී පුද්ගලය හඳුන්වන්නෙ ඒ පුද්ගලය 'කාමෙ ච පටිසෙවති පාපකඤ්ච කම්මං කරොති' 'කාමයන් සේවනය කරනව. පාපකර්ම කරනව. අන්න එබඳු පුද්ගලය අර සංසාරසෝතයට අනුවම ඔහේ ඇදිල යනව. පටිසොතගාමී පුද්ගලය ගැන දක්වන්නෙ, කාමයන් සේවනය කරන්නෙ නැහැ. පාපකර්ම කරන්නෙ නැහැ. ඊළඟට තවත් විශේෂයෙන් ප්‍රකාශකරනව, 'සහාපි දුක්ඛෙන, සහාපිදොමනස්සෙන අස්සුමුඛො රුදමානො පරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං චරති'. භික්ෂුන්වහන්සේ පිළිබඳවයි එතන සඳහන්වෙන්නෙ. දුක්දොම්නස් සහිතව හෝ ඇඬූ කඳුලින් යුක්තව, අඬමින් හෝ කඳුලු වැකි මුහුණින් හෝ යුක්තව පිරිපුන් පිරිසිදු බ්‍රහ්මචරිය වාසයකරනව. එතකොට එතන අර පටිසොතගාමී පුද්ගලයයි. ඨිතත්තො' පුද්ගලය හඳුන්වල තියෙන්නෙ අනාගාමි පුද්ගලය හැටියට. අනාගාමි පුද්ගලය බ්‍රහ්මලෝකෙ ඉපදිලා ආයිත් මෙලොවට එන්නෙ නැහැ. එහෙදිම කෙළවරකරනව. හතරවෙනි පුද්ගලය තමයි හඳුන්වන්නෙ 'තිණ්ණො' එතරව, 'පාරගතො' පරතෙරට ගොස්, එගොඩට ගොස්, 'ථලෙ තිට්ඨති බ්‍රාහ්මණො' එගොඩට ගිහිල්ල එගොඩ හිටගෙන ඉන්නව. බ්‍රාහමණ කියන පදය යොදන්නෙ රහතන් වහන්සේටයි. එතකොට ඒක තෝරන්නෙ 'ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං උපසම්පජ්ජ විහරති' - යම්කිසි භික්ෂුවක් ආශ්‍රවයන් ක්ෂයකිරීමෙන් අනාශ්‍රව වූ චෙතොවිමුත්තියට පඤ්ඤාවිමුත්තියට ඒ අරහත්ඵල සමාධියට සමවැදිල ඉන්නවනම් එබඳු පුද්ගලය හැඳින්විය යුත්තේ එගොඩට ගිහිල්ල එගොඩ හිටගෙන ඉන්න තැනැත්තා හැටියටයි. එතකොට අපි දැන් ඇවිල්ල තියෙන්නෙ නිර්වාණය පිළිබඳ සාකච්ඡාවෙ ඉතාම ගැඹුරු තැනකටයි. රහතන්වහන්සේ ඒ අර්හත්ඵල සමාධියේදි එගොඩ ගිහිල්ල එගොඩ හිටගෙන ඉන්නවනම්, එදිනෙදා ජීවිතයේ රහතන් වහන්සේ ආහාරගැනීම් ධර්මදේශනාකිරීම් ආදියෙ තත්ත්වය කුමක්ද? ඉඳහිටල තාවකාලිකව මෙගොඩට එනවද? ඒක ලොකු ප්‍රශ්නයක්. එගොඩට ගිහිල්ල එනවද නැද්ද කියන එක. ඉඳහිටල ඇවිල්ල ඉන්න ඉඳීමක්ද මේක? අන්න ඒ ප්‍රශ්නය ඇත්තවශයෙන්ම ගැඹුරු ප්‍රශ්නයක් බව හෙළිවෙනව ඒකට අදාළවන යම් යම් සූත්‍රදේශනාවලින්. සුත්ත නිපාතයෙ පරමට්ඨක සූත්‍රයෙ අග ගාථාවෙ මෙහෙම සඳහන් වෙනව.

**'න කපපයනති න පුරෙකඛරොනති - ධමමාපි තෙසං න පටිච්ඡිතාසෙ න බ්‍රාහමණො සීලවතෙන නෙයෙයා - පාරංගතො න පචෙචති තාදී'[12]**

මෙතන මුල් පද කීපය තියෙන්නෙ බහුවචනයෙන්. රහතන් වහන්සේලාගේ ස්වභාවය කුමක්ද? දෘෂ්ටි ප්‍රකල්පනය කරන්නෙ නැහැ. දෘෂ්ටි ගොතන්නෙ නෑ. තනන්නෙ නෑ. 'න පුරෙක්ඛරොන්ති' දෘෂ්ටි ඉදිරිපත් කරන්නෙ නැහැ. අනෙකුත් ශ්‍රමණ බ්‍රාහමණයින් වගේ. 'ධමමාපි තෙසං න පටිච්ඡිතාසෙ' ලෝකයේ පිළිගත් යම් යම් දෘෂ්ටි ආදිය, ඒ කිසිවක් පිළිගන්නෙත් නැහැ. 'න බ්‍රාහමණො සීලවතෙන නෙයෙයා' සීලව්‍රත ආදියට ඇදිල යන්නෙ නැහැ. අවසාන පදයයි අපට අවශ්‍ය. 'පාරං ගතො න පචෙචති තාදී' - පරතෙරට ගිය ඒ තාදී පුද්ගලය ආපසු එන්නෙ නැහැ. මෙතන අපි ඉතාමත් වැදගත් වචනයක් හැටියට සැළකිය යුත්තේ 'තාදී' කියන වචනයයි. මේ තාදී කියන වචනය අපට කලිනුත් අහුවෙලා තියෙනව. මේකට ඇත්තවශයෙන්ම හොඳම සිංහල වචනය 'එහෙවු පුද්ගලය'. එහෙවු පුද්ගලය කියන එක දැන් කාලෙ යොදන්නෙ නරක පුද්ගලයින් පිළිබඳවයි. නමුත් රහතන්වහන්සේ තමයි නියම අර්ථයෙන් 'එහෙවු පුද්ගලය. 'එහෙවු කියල කියන්නෙ අර ස්ථිරසාර ගුණය. 'එසේමෙසේ' නොවෙයි. 'එසේ - මෙසේ පුද්ගලයෙක් තමයි ගියොත් ආපහු එන්නෙ. මේ රහතන්වහන්සේ ගියොත් ගියාමයි. ඒකයි, පාරංගතො න පචෙචති තාදී' කියන්නෙ. අර ඒක නිසාම තමයි ධමමපද ගාථාවල තාදී කියන පදයත් එක්කම අල්ලල දක්වල තියෙන්නෙ 'ඉන්දඛීලූපමො තාදි සුබ්බතො' ආදි වශයෙන්, ඉන්ද්‍රඛීලයක් වගේ රහතන්වහන්සේ. ඒ ලෝකෝත්තර විමුක්තිය ලැබුවට පස්සෙ ඒ තාදී පුද්ගලය ආපසු එන්නෙ නැහැ.

# අධෝලිපි

| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | බු.නි. | I | 402 | පිට | (බු.ජ.24) |
| 2. | අං.නි. | VI | 14 | පිට | (බු.ජ.23) |
| 3. | අං.නි. | IV | 158 | පිට | (බු.ජ.21) |
| 4. | සං.නි. | IV | 206 | පිට | (බු.ජ.16) |
| 5. | සා.ප. | III | 25 | පිට | (හේ.මු.) |
| 6. | ම.නි. | III | 462 | පිට | (බු.ජ.12) |
| 7. | උද.බු.නි | I | 290 | පිට | (බු.ජ.24) |
| 8. | ප.දී (හේ.මු) 272 | | පිටුව | | |
| 9. | අං.නි. | I | 246 | පිටුව | (බු.ජ.18) |
| 10. | අං.නි. | V | 494 | පිටුව | (බු.ජ.22) |
| 11. | අං.නි. | II | 12 | පිටුව | (බු.ජ.19) |
| 12. | සු.නි. | | 254 | පිටුව | (බු.ජ.25) |

# 18 වන

# දේශනය

# 18 වන දේශනය

**"නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස"**

"එතං සන්තං එතං පණීතං යදිදං සබ්බසංඛාරසමථො සබ්බූපධි පටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං."

"මෙය ශාන්තය මෙය ප්‍රණීතය එනම් සියලු සංස්කාරයන්ගේ සංසිඳීම, සියලු උපධීන් අතහැර දැමීම, තණ්හාව ක්ෂය කිරීම, නොඇල්ම නම් වූ විරාගය, නැවැත්ම නම් වූ නිරෝධය, නිවීම නම් වූ නිබ්බානය."

**අතිපූජනීය මහෝපාධ්‍යාය මාහිමිපාණන් වහන්සේ ප්‍රධාන ගරුතර යෝගාවචර මහා සංඝ රත්නයෙන් අවසරයි. නිබ්බාන යන මාතෘකාව යටතේ පවත්වනු ලබන දේශනා මාලාවේ දහඅටවන දේශනයයි මේ.**

ලෝකයෙන් එතෙරවීම, භවයෙන් එතෙරවීම, සිත පිළිබඳම තත්ත්වයක් බව වටහානොගැනීම නිසා නිර්වාණ ප්‍රතිසංයුක්ත සූත්‍ර රාශියක්ම විපරීත අන්දමින් විවරණය කර ඇති බව පසුගිය දේශනයේදී අපි ප්‍රකාශ කළා, රහතන් වහන්සේගේ ජීවිතය අවසන්වීමෙන් පසුව පරමාර්ථ වශයෙන් ඇති යම්කිසි අසංඛත ධාතුවකට පත්වෙන බව පිළිබඳ මතයක් අටුවායුගයේදි මුල්බැසගෙන තිබෙන බව පේනව. ඒ මතය සනාථ කිරීමට, ඔප්පුකිරීමට, අටුවාවල් ගෙනහැර දක්වන සූත්‍ර දේශනා කීපයක්ම ඇත්තවශයෙන්ම භවනිරෝධය පිළිබඳව, සළායතන නිරෝධය පිළිබඳව, මෙලොවදීම, මේ ජීවිතයේදිම රහතන්වහන්සේ ලබන ප්‍රත්‍යක්ෂයක් පිළිබඳ සූත්‍ර බව පසුගිය දේශනාවේදි අප පැහැදිලි කළා. වෙනෙකක් තබා, එතෙරට ගොස්, මෙගොඩින් එගොඩට ගොස්, එහෙම නැත්නම් පරතෙරට ගොස්, එගොඩට වී සිටින බ්‍රාහ්මණයා හැටියට බුදුරජාණන්වහන්සේ දැක්වූයෙත්, ආශ්‍රවයන් ක්ෂයකරල අනාශ්‍රවවූ චෙතොවිමුත්තිය පඤ්ඤාවිමුත්තිය මේ ජීවිතයේදීම ප්‍රත්‍යක්ෂකරගෙන ඉන්න රහතන්වහන්සේ - ඵලසමාපත්තියෙන් ඒ තත්ත්වයට පත්වුන රහතන්වහන්සේ - පිළිබඳවයි. එතකොට මේ නිදසුන් අනුව, මේ කාරණා අනුව, අපට සිදුවෙනව එගොඩත් මෙගොඩත්, එතෙරත් මෙතෙරත්, පිළිබඳ ලෝකසම්මත මතයට වඩා සියුම් අදහසක් මේ නිර්වාණ ප්‍රතිසංයුක්ත සූත්‍ර තුළින් මතුකර ගැනීමට. අද මේ දේශනාව විශේෂයෙන්ම ඒ සඳහායි. අපි කලිනුත් ප්‍රකාශකළා මේ නිර්වාණය පිළිබඳව, ඒ ප්‍රශ්නය පිළිබඳව, යම්කිසි විසඳුමක් බලාපොරොත්තු වෙනවනම්, ඒ විසඳුමේ ඉතාම සියුම් කොටසයි ඉදිරියට එන සූත්‍රවල තියෙන්නෙ.

පසුගිය දේශනය අවසානවනවිට අප සුත්තනිපාතයේ පරමට්ඨක සූත්‍රයේ අවසාන ගාථාවෙ අවසාන පදය වන 'පාරංගතො න පවෙචති තාදී' - කියන පදය විග්‍රහ කරමිනුයි සිටියෙ. 'තාදී' 'පුද්ගලය' පරතෙරට ගියේ නැවත නොඑන්ට බව ඒ ගාථාපදය අනුව අප තේරුම් කළා. ඒ කියන්නෙ, සර්‍වාරසාරවූ, 'එහෙවූ' කෙනෙක් වූ, ඒ රහතන්වහන්සේ එගොඩට ගියෙ ආපහු මෙගොඩට නොඑන්ට බව. අපි එහෙම ප්‍රකාශකළාට මොකද සුත්ත නිපාතයේම නාලක සූත්‍රයේ එන එක්තරා ගාථාවක - පැරැන්නන්ගේ නොයෙකුත් වාද විවාදවලට භාජනයවූ එක්තරා ගාථාවක - මීට වඩා තරමක් වෙනස් අදහසක් ප්‍රකාශ වෙනව.

**'උච්චාවචා හි පටිපදා - සමණෙන පකාසිතා**

**න පාරං දිගුණං යන්ති - න ඉදං එකගුණං මුතං'**[1]

ඒ ගාථාවෙ අදහස ඉස්සෙල්ල බලමු. 'උච්චාවචා හි පටිපදා සමණෙන පකාසිතා' බුද්ධ ශ්‍රමණයන්වහන්සේ විසින් උත්කෘෂ්ට සහ හීන ප්‍රතිපදා ප්‍රකාශකරල තිබෙනව. 'න පාරං දිගුණං යන්ති' - ඒ කියන්නෙ විමුක්ත පුද්ගලයෝ දෙවරක් පරතෙරට නොයත්. 'න ඉදං එකගුණං මුතං' - 'මෙය එක්වරක් හැටියටද සළකනු නොලැබේ'. මෙතන පරස්පර විරෝධී කියමනක් වගේ පෙනෙන්නෙ මේ අගදෙපදයෙන්. 'න පාරං දිගුණං යන්ති' - එතෙරට දෙවරක් නොයත්. එක් වරක් වශයෙන්ද සළකනු නොලැබේ. මේ ගාථාවේ 'උච්චාවචා පටිපදා' කියන පද දෙක අපි කෙටියෙන් සලකාගත්තොත්, උත්කෘෂ්ට හීන ප්‍රතිපදා කියල ප්‍රකාශකළේ ඒ ඒ පුද්ගලයගෙ ශක්තිය අනුව බුදුරජාණන්වහන්සේ ප්‍රතිපදාවෙ විවිධ ප්‍රභේද දක්වල තියෙනව. දැන් නිදසුනක් හැටියට ගත්තොත් 'සුඛාපටිපදා ඛිප්පාභිඤ්ඤා' කියල ඉහළම ගණයේ, උත්කෘෂ්ටම ගණයේ, පුද්ගලයින් ඉතාමත්ම පහසුවෙන් කෙලෙස් සමනයකරල වහා වැටහීම් ඇති මාර්‍ගයකින් නිවනට කිට්ටුවෙනව. ඊළඟට හීන ප්‍රතිපදාවට අපි නිදසුනක් හැටියට දැක්වුවොත් දුක්ඛාපටිපදා දන්ධාභිඤ්ඤා වශයෙන් ඉතාමත්ම දුකසේ කෙලෙස් ජයගෙන ඉතාමත්ම හෙමින් අවබෝධය ලබන පුද්ගලයිනුත් නිවනට ළං වෙනව. අන්න ඒකයි ඒ පද දෙකේ අර්‍ථය. නමුත් අපට මෙතන ගැටලු වශයෙන් තියෙන්නෙ අගදෙපදයයි. 'න පාරං දිගුණං යන්ති - න ඉදං එකගුණං මුතං', අටුවාව මේ ගැටලුව විසඳන්න උත්සාහ කරන්නෙ මෙහෙමයි. 'න පාරං දිගුණං යන්ති' කියන එක තෝරන්නෙ' එක මග්ගෙන ද්වික්ඛත්තුං නිබ්බානං න යන්ති'[2] ඒ කියන්නෙ සෝවාන් සකදාගාමි අනාගාමි එක් එක් මාර්‍ගයකින් එකවරක්මයි යැවෙන්නෙ. දෙවරක් යන්නෙ නැත කියන අදහසයි, තුන්වෙනි පදයට අර්‍ථය හැටියට දෙන්නෙ. ඒ කියන්නෙ 'න පාරං දිගුණං යන්ති' කියන්නෙ සෝවාන් සකදාගාමී ආදී එක් එක් මාර්‍ගයකින් යන්නෙ එකසැරයයි එක මාර්‍ගයකින් දෙවරක් යන්නෙ නැහැ. ඊළඟට 'න ඉදං

එකගුණං මුතං' කියන එක තෝරන්නෙ 'එක මාර්ගයකින්ම සියලුම කෙලෙස් නැතිකරන්න බැහැ සියලුම කෙලෙස් නැතිකරල රහත් වෙන්න බැහැ කියන අදහසයි. ඒ කියන්නෙ රහත්වීම සඳහා මාර්ගහතරක්ම ඕන වෙනව. එක්වරටම රහත්වෙන්න බැරිය කියන අදහසයි අටුවාව ඉදිරිපත්කරන්නෙ.

නමුත් ඇත්තවශයෙන්ම අපි මේ ගාථාව ගැන ගැඹුරින් සළකල බැලුවොත් මෙතන දක්වල තියෙන්නෙ පරස්පරවිරෝධී කියමනක් විදියෙ ප්‍රකාශයක්. අටුවාව මෙතන ගැටලු දෙකක් මතුකර ගැනීමෙනුයි මේ එක ගැටලුව විසඳන්නෙ. එකම ගැටලුවෙ දෙපැත්තක් මේ ගාථා දෙපදයෙ තියෙන්නෙ. එකම ගැටලුවක දෙපැත්තක්. ඒ කියන්නෙ 'න පාරං දිගුණං යනති' දෙවරක් එගොඩට නොයෙත්. 'න ඉදං' කියල කිව්වෙ මේ දෙවරක් නොයාමම. අටුවාව තෝරන හැටියට එතන 'ඉදං' කියන්නෙ, මෙය කියල කියන්නෙ, පරතෙරට. නමුත් මෙතන ගන්න තියෙන්නෙ අර මුල් පදයෙන් කියන මුළු අදහසම 'න ඉදං එක ගුණං මුතං' ඒ දෙවරක් නොයාමම එක වරක් හැටියටද ගණන් ගන්නෙ නැත. එතකොටයි ඒ පරස්පරවිරෝධී බව හොඳට සම්පූර්ණ වෙන්නෙත්. එකම මාතෘකාවට අදාළ කියමනක්. මෙයින් එතකොට අපට තේරුම් ගන්න වෙන්නෙ, මේ ගාථාවෙන් කියැවෙන්නෙ, සෝවාන් සකදාගාමී අනාගාමී යන සෙඛ පුද්ගලයින් පිළිබඳව නොවෙයි. මේ ගාථාව ඇත්තවශයෙන්ම රහතන්වහන්සේ - 'තාදී' පුද්ගලයා පිළිබඳවයි. පරමට්ඨක සූත්‍රයෙන් අපි දැක්වූ 'පාරං ගතො න පච්චෙති තාදී' කියන ඒ ගාථාපදයෙම ප්‍රතිරාවයක් - දෝංකාරයක් - තමයි මේ ගාථාවෙ තිබෙන්නෙ. 'පාරංගතො න පච්චෙති තාදී' කියන එකේ තේරුම් පරතෙරට ගිය තාදී පුදගලය, විමුක්තපුද්ගලය නැවත නොඑයි. ඒ කියමනමයි මේ තුන්වෙනි පදයෙන් කියන්නෙ. 'න පාරං දිගුණං යනති' පරතරෙට දෙවරක් නොයෙත්. රහත් පුදගලයෝ පරතෙරට දෙවරක් නොයෙත්. නමුත් අවසාන පදයයි මෙතන ප්‍රශ්නය වෙන්නෙ. 'මේ දෙවරක් නොයාමම එක්වරක් හැටියටද සැළකෙන්නෙ නැත'. මොකක් නමුත් සැඟවුන අර්ථයක් මෙතන තිබෙනව.

මේක එතකොට අපට තේරුම්ගන්න වෙන්නෙ, දැන් සාමාන්‍යයෙන් ලෝකයේ යම්කිසි කෙනෙක් කිව්වොත් ''මම අහවල් තැනට දෙවරක් යන්නෙ නැහැ'' කියල, ඒකෙන් අධ්‍යාහාර නිගමනය මොකක්ද? ඉබේම හැඟෙන නිගමනය මොකක්ද? යන්නෙ එකවරයි. 'මම දෙවරක් කියන්නෙ නැහැ' කිව්වොත් ඒකෙ තේරුම මම එකවරයි කියන්නෙ''. නමුත් මෙතන මේ අවසාන පදයෙන් ප්‍රතික්ෂේප කරනව දෙවරක් යන්නෙත් නැහැ. එක්වරක් කියල කියන්නෙත් නැහැ. මෙතනින් කියවෙන අදහස ආශ්‍රවයන් ක්ෂයකරල නියම විදියටම එගොඩට ගිය, නියම විදියටම ලොකෝත්තර වූ, රහතන්වහන්සේ, 'තාදී' පුදගලය, නැවත මෙගොඩට එන්නෙ නැහැ. එන්නෙ

නැතත් මෙගොඩට ආවාක් මෙන් - මෙගොඩට ආවාක් මෙන් - ඒ අහීත්ඵල සමාධියෙන් නැගිටල පංචේන්ද්‍රියයන්ගෙන් ලැබෙන අරමුණු අනුව මනාප අමනාප දේ භුක්ති විඳිනව' සැපදුක් විඳිනව ලෝකයාට පෙනෙනව. ලෝකයාගේ දෘෂ්ටිකෝණයෙන් බලනකොට මේ රහතන්වහන්සේ ඒ අහීත්ඵල සමාධියෙන් මිදිල දැන් ඔන්න ලෝකෙට ඇවිල්ල ඉන්නව. මෙන්න මෙතනයි මේ ගැටලුව තියෙන්නෙ. එතකොට 'න ඉදං එකගුණං මුතං' - එකවරක් පමණක් හැටියට සළකන්නෙ නැත්තෙ මක්නිසාද? අර ලෝකෙට ආව වගේ ඉඳල නැවත නැවතත් අහීත්ඵල සමාධියට කැමති විටෙක සමවදින්න පුළුවන් රහතන්වහන්සේට. බාහිර ඉන්ද්‍රියයන්ගෙන් ලැබෙන අරමුණු භුක්තිවිඳිනව. නමුත් විටින්විට අර එගොඩටම වී සිටින තත්ත්වයවන අහීත්ඵල සමාධියටත් සමවැදිල තමන් ඒ ලබාගත්තු ප්‍රත්‍යක්‍ෂයට සිත පමුණුවාගෙන නිර්වාණසුඛයත් භුක්තිවිඳිනව. මෙන්න මේක ඉතාමත්ම සියුම් ගැටලුවක්. ලෝකයට ඇවිල්ල ඉන්ද්‍රියයන්ගෙන් ආරම්මණ ගන්නකොට කෙනෙකුට හිතෙනව ඇත්තවශයෙන්ම මේ පුද්ගලය දැන් ලෝකයේය ඉන්නෙ කියල. නමුත් බැලුබැල්මට මේ ගැටලු විදියෙ අවස්ථාව බුදුරජාණන්වහන්සේ ඉතාමත්ම සවාභාවික උපමාවක් - කෙනෙකුට තේරුම් ගන්න පුළුවන් විදියෙ උපමාවක් - ආශ්‍රයෙන් මේ මහා ගැටලුව, ඒ කියන්නෙ ලෝකොත්තර පුද්ගලයන් ආශ්‍රවයන් ක්‍ෂයකරල, එහෙම පිටින්ම ලෝකෝත්තර තත්ත්වයට පත්වෙලා, එගොඩට ගිහිල්ල, එගොඩට වී සිටින පුද්ගලය, මෙගොඩට ඇවිල්ල කොහොමද මේ ඉන්ද්‍රියයන්ගෙන් අරමුණු ගන්නෙ කියන ප්‍රශ්නයට පිළිතුරු සපයනව එක්තරා උපමාවකින්. එක නිදසුනක් අපි ගත්තොත් සුත්ත නිපාතයේ ජරා සූත්‍රයෙන්.

**'උදබින්දු යථාපි පොක්ඛරෙ - පදුමෙ වාරි යථා න ලිප්පති**
**එවං මුනි නොපලිප්පති - යදිදං දිට්ඨසුතමමුතෙසු වා'**[3]

'යම්සේ පියුම් පතෙහි දිය බිඳුව නොඇලෙන්නේද, යම්සේ පියුම් පෙත්තෙහි ජලය නොඇලෙන්නේද, එසේම මේ විමුක්ත මුනිවරයා දිට්ඨ සුතමුත - දුටු දෙයෙහි ඇසුනු දෙයෙහි දැනුන දෙයෙහි, ඉන්ද්‍රියාරම්මණවල නොඇලෙයි. අන්න එතන කියන හැටියට එතකොට මේ නෙලුම් මලේත් නෙලුම් කොළේත් උපමාවයි බුදුරජාණන්වහන්සේ මේ ඉතාමත්ම ගැඹුරු ලෝකොත්තර ලෞකික තත්ත්ව පිළිබඳ ප්‍රශ්නය තෝරන්න ඉදිරිපත් කරගන්නෙ. අපි තවත් නිදසුනක් ගනිමු. සුත්ත නිපාතයෙ මාගන්දිය සූත්‍රයෙ සඳහන් වෙනව ගාථාවක්.

**යෙහි විවිත්තො විචරෙය්‍ය ලොකෙ-න තානි උග්ගය්හ වදෙය්‍ය නාගො**
**එලම්බුජං කණ්ටකං වාරිජං යථා- ජලෙන පඞ්කෙන අනූපලිත්තං**
**එවං මුනි සන්තිවදෙ අගිද්ධො - කාමෙ ච ලොකෙ ච අනූපලිත්තො**[4]

''යෙහි විවිත්තො විචරෙය්‍ය ලොකෙ, න තානි උග්ගය්හ වදෙය්‍ය නාගො'. නාගො කියල කියන්නෙ රහතන් වහන්සේටමයි. මේ ශ්‍රේෂ්ඨ විමුක්ත පුද්ගලයා යම් දෘෂ්ටි ආදියකින් වෙන්ව ලෝකයෙහි හැසිරෙන්නේද 'න තානි උග්ගය්හ වදෙය්‍ය' - ඒවා දැඩිව ගෙන ව්‍යවහාර නොකරන්නේය. 'එලම්බුජං කණ්ටකං වාරිජං යථා, ජලෙන පඞ්කෙන අනූපලිත්තං' - යම් සේ ජලයෙහි හටගත් කටු සහිත, කටුවක් ඇති, හෙළපියුම, ජලයෙන්ද මඩින්ද නොකිලිටිව නොකැලැල්ව පවතීද, 'එවං මුනි සන්තිවදෙ අගිද්ධො' - එසේම අධ්‍යාත්ම ශාන්තිය ප්‍රකාශ කරන ගිජු නොවූ මුනිවරය 'කාමෙච ලොකෙ ච අනූපලිත්තො' - කාමයෙහිත් ලෝකයේත් නොඇලී වාසයකරයි.

බුදුරජාණන්වහන්සේ චම්පා නුවර ගග්ගරා පොකුණු තෙර වාසය කරන අවසථාවක බාහුන සවාමීන්වහන්සේ උන්වහන්සේගෙන් ඇසූ ප්‍රශ්නයකුත් ඊට බුදුරජාණන්වහන්සේ දුන්න පිළිතුරත් අංගුත්තර නිකායෙ දසක නිපාතයේ සඳහන්වෙනව. බාහුන සවාමීන් වහන්සේ ඇසූ ප්‍රශ්නය :

''කති හි නු ඛො භන්තෙ ධම්මෙහි තථාගතො නිස්සටො, විසංයුත්තො විප්පමුත්තො විමරියාදිකතෙන චෙතසා විහරති'', - 'සවාමීනි තථාගතයන්වහන්සේ කවර ධර්‍මයන්ගෙන් ඉවත්ව, නොබැඳී, මිදී, විමුක්තව මායිම්කර නොගත් සිතකින් යුක්තව වැඩ වාසය කරත්ද? ඒකට බුදුරජාණන්වහන්සේ පිළිතුරු දෙන්නෙ ඒ පොකුණෙන්ම ගත්තු හැටියෙ උපමාවකින්.

**දසහි ඛො බාහුන ධම්මෙහි තථාගතො නිස්සටෙටා විසංයුත්තො විප්පමුත්තො විමරියාදිකතෙන චෙතසා විහරති - කතමෙහි දසහි රූපෙන ඛො බාහුන තථාගතො නිස්සටෙටා විසංයුත්තො විප්පමුත්තො විමරියාදිකතෙන චෙතසා විහරති වෙදනාය.. සඤ්ඤාය ..සංඛාරෙහි ..විඤ්ඤාණෙන...ජාතියා...ජරාය...මරණෙන...දුක්ඛෙහි... කිලෙසෙහි ඛො බාහුන තථාගතො නිස්සටෙටා, විසංයුත්තො විප්පමුත්තො විමරියාදිකතෙන චෙතසා විහරති. සෙය්‍යථාපි බාහුන උප්පලංවා පදුමං ව පුණ්ඩරීකංවා උදකෙ ජාතං උදකෙ සංවඩ්ඪං උදකා අච්චුග්ගම්ම තිට්ඨති අනූපලිත්තං උදකෙන, එවමෙව ඛො බාහුන තථාගතො ඉමෙහි දසහි ධම්මෙහි නිස්සටෙටා විසංයුත්තො විප්පමුත්තො විමරියාදිකතෙන චෙතසා විහරති.**[5]

බුදුරජාණන්වහන්සේගේ පිළිතුර එතකොට, ''බාහුන ධර්‍ම දහයකින් තථාගතතෙම ඉවත්ව නොබැඳී මිදී මායිම් කරනොගත් සිතකින් යුක්තව වාසයකරයි. කවර දසයකින්ද? රූපයෙන් - රූපස්කන්ධයෙන්, වේදනාවෙන්, සඤ්ඤාවෙන්, සංස්කාරයන්ගෙන්, විඤ්ඤාණයෙන්, ජාතියෙන්, ජරාවෙන්, මරණයෙන්, දුක්වලින්, කෙලෙස්වලින්, කියන මේ දහයෙන්ම වෙන්වෙලා තථාගතයන්වහන්සේ ලෝකයෙහි වාසය කරන්නෙ. ඊළඟට උපමාව. යම්සේ

බාහුන නිලුපුලක් හෝ රත්පියුමක් හෝ හෙළපියුමක් හෝ ජලයෙහි හටගත්තේ ජලයෙහි වැඩුණේ, ජලයෙන් පැන නැගී, ජලයෙන් නොතෙත්ව නොකිලිටිව පවතීද, එසේම තථාගතතෙම මේ දසධර්මයන්ගෙන් ඉවත්ව නොබැඳී, මිදී, මායිම් කරනොගත් සිතකින් වාසය කරයි''. 'එතකොට මේ සූත්‍රයෙන් විශේෂයෙන්ම අපට පේනව තථාගතයන්වහන්සේ සර්වප්‍රකාරයෙන්ම ලෝකෝත්තර බව, ඉන්ද්‍රියයන්ගෙන් ලෝකයේ අරමුණු ගත්තත්. වෙනෙකක් තබා මේ සකන්ධයන්ගෙන් ලැබුනු මිදීම, ඒක එහෙමමයි. රූපයෙන් වේදනාවෙන් ඒවායින් සිත මැත්කරගෙනයි වැඩ වාසය කරන්නෙ. එපමණක් නොවෙයි දැන් මේ කාලෙ අර්ථවිවරණ අනුව කෙනෙකුට පුදුම හිතෙන්න පුළුවන් බුදුරජාණන්වහන්සේ ජරාවට පත්වුනා නේද. මරණයට පත්වුනා නේද කියල. ඔහොම හිතනකොට මෙතන කියනව ජාතියා, ජරාය, මරණෙන - උපතින් ජරාවෙන් මරණයෙන් මේ කියන්නෙ අනාගත භවයක් පිළිබඳව නොවෙයි. මේ ජීවිතයේදීම මේ සංකල්පවලින් මිදිල. අපි කලින් මේ පිළිබඳව ප්‍රපංච ගැන කථාකරන අවසථාවල ප්‍රකාශකරල තියෙනව. ලෝකයාට ඒ ජාති ජරා මරණ ආදිය පිළිබඳව සංකල්ප වලින් යම් භීතියක් උපදිනව නම් තථාගතයන්වහන්සේට ඒ කිසිවක් නැහැ කියන එකයි මේ ප්‍රකාශ කරන්නෙ. ඒ වගේම කෙලෙස්වලින්. මේ කියාපු දසධර්මයන්ගෙන්ම තථාගතයන් වහන්සේ විමුක්තව වැඩවාසය කරන බවයි මේ සූත්‍රයෙන් එතකොට අපට පෙනීයන්නෙ. මේ එක්කම අපට පෙනීයනවා තථාගතයන්වහන්සේගේ එදිනෙදා ජීවිතයේ මේ ඉන්ද්‍රියක්‍රියාකාරීත්වය පිළිබඳවත් යම්කිසි පුදුම අන්දමේ විමුක්ත බවක්, නොබැඳුනු බවක්, තිබෙන්ට ඕනෙයි කියල. ඒක සැරියුත් සවාමීන්වහන්සේ ප්‍රකාශකරනව සංයුත්ත නිකායෙ සළායතන සංයුත්තයෙ.

'**පස්සති භගවා චක්ඛුනා රූපං ඡන්දරාගො භගවතො නත්‍ථි සුවිමුත්තචිත්තො භගවා**'[6] භාග්‍යවතුන් වහන්සේ ඇසින් රූප දකිනව. නමුත් ඒ පිළිබඳව ඡන්දරාගයක් නැහැ. සිත විමුක්තයි. ඒ වගේම අර බ්‍රහමායු සූත්‍රයෙ මජ්ඣිම නිකායෙ උත්තර නමැති බ්‍රාහමණ මාණවකයා බුදුරජාණන්වහන්සේ පස්සෙන් ගිහිල්ලම බුදුරජාණන්වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය පරීක්ෂාකරල කාලයක් තිස්සෙ, ප්‍රකාශකළ වාක්‍යයක් තියෙනව.

'**රස පටිසංවෙදී ඛො පන සො භවං ගොතමො ආහාරං ආහාරෙති නො ච රසරාග පටිසංවෙදී**'[7] - ඒ භවත් ගෞතමයන් රසය විඳිමින් ආහාර ගන්නව. නමුත් රසරාගයක් විඳිනය කරන්නෙ නැහැ. ඒක මහ පුදුම වැඩක්. දිවට දැනෙන දේවල් පිළිබඳව ඒ තරම් විමුක්ත බවක් ඒ ඉන්ද්‍රියවලින් අරමුණු ගන්න අවසථාවලත් පවතිනවාය කියන එකයි එයින් ප්‍රකාශ කරන්නෙ. රස පටිසංවේදී රසරාග පටිසංවේදි කියන දෙක අතරෙ ඇති වෙනස කල්පනාකරන විටත් ලෞකික ලෝකෝත්තර දෙක අතර ඇති

වෙනස තේරුම් ගන්න පුළුවනි. ඒ වගේම මේ පංචේන්ද්‍රියයන් පිළිබඳව පමණක් නොවෙයි. සිතට එන අරමුණු - ධම්මාරම්මණ - පිළිබඳවත් ඒ විමුක්ත පුද්ගලය එදිනෙදා ජීවිතයේදී සිත මැත් කරගෙනයි ජීවත් වෙන්නෙ. මේවායේ විතථ ස්වභාවය, අසත්‍ය ස්වභාවය, රහතන්වහන්සේට ප්‍රත්‍යක්ෂ නිසා. සිතට අරමුණු එනව. සිතට ගන්නව සංකල්ප. මමය කියලත් පාවිච්චිකරනව. නමුත් ඒ සංකල්පවල අසත්‍ය ස්වභාවය දන්නව. ව්‍යවහාර - අර බබාගෙ භාෂාව පාවිච්චිකරන්න වගේ. ඒ කාරණයත් පැහැදිලි වෙන හොඳ සූත්‍රයක් තියෙනව අංගුත්තර නිකායෙ නවක නිපාතයෙ.

සැරියුත් ස්වාමීන්වහන්සේ චන්දිකාපුත්ත කියන ස්වාමීන්වහන්සේ කෙනෙකුගෙ වැරදි මතයක් ඉවත්කරන්න දේශනා කළ සූත්‍රයක් ඒක. එතන සඳහන් වෙනව

**එවං සම්මා විමුත්තස්ස ඛො ආවුසො භික්ඛුනො භුසාවෙපි චක්ඛු විඤ්ඤෙය්‍යා රූපා චක්ඛුස්ස ආපාථං ආගච්ඡන්ති නෙවස්ස චිත්තං පරියාදියන්ති අමිස්සීකතමෙවස්ස චිත්තං හොති ඨිතං ආනෙඤ්ජප්පත්තං භුසා වෙපි සොත විඤ්ඤෙය්‍යා සද්ද...භුසා වෙපි ඝාන විඤ්ඤෙය්‍යා ගන්ධා...භුසා වෙපි ජිව්හා විඤ්ඤෙය්‍යා රසා ...භුසා වෙපි කාය විඤ්ඤෙය්‍යා ඵොට්ඨබ්බා...භුසා වෙපි මනො විඤ්ඤෙය්‍යා ධම්මා ආපාථං ආගච්ඡන්ති නෙවස්ස චිත්තං පරියාදියන්ති. අමිස්සීකතමෙවස්ස චිත්තං හොති ඨිතං ආනෙඤ්ජප්පත්තං වයඤ්චස්සානුපස්සති**[8]

'ඇවැත්ති මෙසේ හොඳින්ම විමුක්තවූ ඒ භික්ෂුවගේ දර්ශනපථයට බොහෝ ඇසින් දැකියයුතු රූප ආවේ වී නමුත් ඒ රූප ඒ භික්ෂුවගේ සිත දැඩිකොට ග්‍රහණය නොකරත්. ඒ සිත ඒවායින් අමිශ්‍රව පවතිනව ස්ථාවරව නොකැළඹෙන අන්දමින් පවතිනව කියන එකයි ප්‍රකාශ වෙන්නෙ. ඇස පිළිබඳව වගේ තමයි ඊළඟට කණ පිළිබඳවත්, කණට ඇසෙන ශබ්ද පිළිබඳවත්, නැහැයට දැනෙන ගඳ සුවඳ පිළිබඳවත්, දිවට දැනෙන රස පිළිබඳවත්, කයට දැනෙන ස්පර්ශ පිළිබඳවත් ඊළඟට මනසට දැනෙන ධර්ම පිළිබඳවත්, මනසට හැඟෙන ධර්ම, ධර්මාරම්මණ, ඒව පිළිබඳවත් එතන ප්‍රකාශවෙනව. ඒ එකකින්වත් ඒ සිත දැඩිව ග්‍රහණය කරන්නෙ නැහැ. 'න පරියාදියන්ති' ඒ වගේම 'අමිස්සීකත' ඒවා සමග මිශ්‍රවන්නෙ නැහැ සිත. අර ලෝකෝත්තර බව මිශ්‍ර වන්නෙ නැහැ ලෞකිකයට ආවට පස්සෙ නෙළුම් කොළේ තිබෙන පිනිබින්දුව වගේ තමයි. ඒ වගේම 'ඨිතං ආනෙඤ්ජප්පත්තං' - ස්ථිරසාර ස්වභාවයයි කියන එකයි.

එතකොට මේ සූත්‍ර හැම එකකින්ම අපට පෙනෙනව මේ විමුක්ත පුද්ගලයා පිළිබඳ සංකල්පයයි මෙතන තියෙන්නෙ. සාමාන්‍යයෙන් නෙලුම් කොළයක ස්වභාවය තේරුම් නොගත්ත කෙනෙකුට, ඒ නෙලුම් කොළයක හෝ නෙලුම්

පෙත්තක වතුර බින්දුවක් තියෙන කොට කල්පනා වෙනව මේ නෙලුම් කොළය මේ නෙලුම් පෙත්ත තෙමෙන්න ඕන කියල. අපි කලින් ප්‍රකාශකළා ලෞකික තත්ත්වයත් ලොකොත්තර තත්ත්වයත් අතර විශාල පරතරයක්, මහා පරතරයක්, තියෙනව කියල. එහෙම ප්‍රකාශ කළාම සමහරවිට කෙනෙකුට හිතෙන්න පුළුවන් මේක මේ කාලය පිළිබඳ පරතරයක් එහෙම නැත්නම් අවකාශය පිළිබඳ පරතරයක් කියල. ඇත්ත වශයෙන්ම බොහෝවිට නිවන පිළිබඳ විවරණ මාර්ග නොපිටට ගියෙත් ඒ අදහස උඩයි. 'ලෞකික' කියන එකට ඉතාමත්ම ඈතයි 'ලෝකෝත්තර'. ඉතින් මේක කාලය අනුව වෙන්න ඕන. එක්කො මේ මරණයෙන් මතු සිදුවන දෙයක්. එහෙම නැත්නම් අවකාශය අනුව. මේක බොහොම ඈතයි. රහතන්වහන්සේට කිට්ටු කරන්න බැහැ. අන්න ඒ විදියේ දෙයක්. නමුත් මේ පරතරයට උපමාව වශයෙන් ගත්තොත් අර නෙලුම් කොළේ තියන දියබින්දුව, **නෙලුම් කොළේ ඉඳල දියබින්දුවට තිබෙන දුරමයි මෙතන තියෙන්නෙ - ලෞකිකයෙ ඉඳල ලෝකෝත්තරයට තියෙන්නෙ.** ඔන්න ඔය විදියෙ තත්ත්වයක් එතකොට මෙතනින් හෙළිවෙන්නෙ.

එගොඩ මෙගොඩ පිළිබඳ ප්‍රශ්නයමයි මේ තාම යන්නෙ. ලෞකික ලෝකෝත්තර පිළිබඳ මේ කාරණයෙදිත් අපට පැහැදිලිවෙන්නෙ එගොඩ මෙගොඩ පිළිබඳ ප්‍රශ්නයමයි. එතෙරත් මෙතෙරත් පිළිබඳව සාමාන්‍ය ලෝකයා හිතන ආකාරයට නොවෙයි රහතන්වහන්සේ කල්පනා කරන්නෙ. දැන් මේ රටේ ඉන්න කෙනෙක් පිටරටකට ගියා නම්, ඒ පිටරට පදිංචි උනාට පස්සෙ සමහරවිට මේ රට ගැන හිතන්නෙ එගොඩයි කියල. එතෙරයි කියල. ඒ වගේ මේ විමුක්ත පුද්ගලය පිළිබඳවත් සමහරවිට කෙනෙකුට හිතෙන්න පුළුවනි එතෙරට ගිහිල්ල එගොඩම සිටිනවනම් ඒ තැනැත්තා එගොඩ හැටියට කල්පනාකරන්න ඕන මෙතෙරයි, මේ ලෝකයයි කියල. නමුත් රහතන්වහන්සේට ඒ දෙකම නෑ. ඇත්ත වශයෙන්ම මෙතෙරක් එතෙරක් කියන දෙකම නැති බවක් ධම්මපදයෙ එක්තරා ගාථාවක සඳහන් වෙනව.

**'යස්ස පාරං අපාරංවා - පාරාපාරං න විජ්ජති**

**විතද්දරං විසංයුත්තං - තමහං බ්‍රෑමි බ්‍රාහමණං'**[9]

මේ ගාථාව අපි කලිනුත් සඳහන් කළා අර ද්වයතාව ගැන ප්‍රකාශකරන අවස්ථාවෙදී. 'යස්ස පාරං අපාරං වා පාරාපාරං න විජ්ජති' - 'යම් කෙනෙකුට පරතෙරක් හෝ මෙතෙරක් හෝ පරතෙරක් හා මෙතෙරක් කියන දෙකම හෝ නැත්තේද. දෙවෙනිවර මේක සඳහන් වෙලා තියෙන්නෙ පරතෙර මෙතෙර කියන භේදයක්වත් නෑ. පරතෙරක්වත් නෑ. මෙතෙරක්වත් නෑ. පරතෙර මෙතෙර කියන භේදයක්වත් නෑ කොටින්ම. 'වීතද්දරං විසංයුත්තං

සෝකයන් ඉවත්කළ නොබැඳී වාසය කරන, 'තමහං බ්‍රෑමි බ්‍රාහමණං' - එබඳු ඒ පුද්ගලයාට මම බ්‍රාහමණයෙකැයි කියමි. ඒ ධම්මපදයෙ බ්‍රාහමණ වග්ගයෙ ගාථාවක්. මේ කියන්නෙ රහතන්වහන්සේ අර ද්වයතාව අනුව ගිය ප්‍රඥප්තිවලින් එහෙම පිටින්ම මිදිලයි ඉන්නෙ. එතෙර මෙතෙර කියන එක ද්වයතාවයක්. මේ ද්වයතාව තියෙන්නෙ ලෝකයාට පමණයි. රහතන්වහන්සේට එගොඩට ගියාට පස්සෙ මේ සංකල්ප අවශ්‍ය නැහැ. මෙන්න මෙතන තමයි අර අලගද්දූපම සූත්‍රයෙ අර පහුරු උපමාව පිළිබඳ බුදුරජාණන්වහන්සේගේ උපදේශය හොඳටම අර්ථවත්වෙන තැන. ඒ කියන්නෙ එතෙරවීම සඳහා පමණයි අපි මේ එගොඩත් මෙගොඩත් කියන ව්‍යවහාරය පවා ප්‍රයෝජනයට ගන්නෙ. දැන් යම්කිසි විදියකින් රහතන්වහන්සේ එතෙර උනාට පස්සෙ කල්පනාකරනවනම් 'ආ දැන් මගේ ඉඩම මේකයි' කියල එතෙන්දි වෙන්නෙ අල්ලාගැනීමක්. එතන 'අතම්මයතාව' නොවෙයි 'තම්මයතාවක් වෙනව. අපි මේ වචනය කලින් ප්‍රකාශ කළා. 'අතම්මයතා' කියන පුදුම ගුණයක් රහතන් වහන්සේට තියෙනව. අර මැණිකක් ගැන එහෙම උපමාවක් දක්වපු අවසථාවල අපි ප්‍රකාශකළා, ලෝකයේ තියෙන සාමාන්‍ය ධර්මතාව, **අපි යමක් අයත්කර ගත්තොත් අප ඊට අයත්වෙනව. අපි යමක් අල්ලගත්තොත් අප ඊට අහුවෙනව.** අර මැණික ගැන උපමාවෙත් කියවෙනව. අන්න ඒ ධර්මතාව හරියට වටහාගත්තු නිසා තමයි රහතන්වහන්සේ එගොඩට ගියත් එගොඩ අල්ලගන්නෙත් නැහැ. එගොඩට වෙලා හිටියත්. අන්න ඒක නිසා තමයි දැන් මේක තෝරන්න වෙන්නෙ. 'යස්ස පාරං'... රහත්වුනාට පස්සෙ මෙතෙරත් නෑ එතෙරත් නෑ. මේව සංකල්ප, හුදු සංකල්ප පමණයි. මේවායේ යම්කිසි ප්‍රායෝගික වටිනාකමක් තියෙනව, මෙගොඩ ඉන්න අයට. ඒක නිසා තමයි අර අලගද්දූපම සූත්‍රයෙත් - මෙතෙර ඉඳල එතෙරට යන්න නැවක්වත් පාලමක්වත් නැහැ. නමුත් මෙගොඩම තිබෙන ලී කැබලි දරකෝටු කැලි එකතු කරල තව වැල්වලින් එහෙම බැඳල තමයි පහුරක් හදගන්නෙ. ඊ ළඟට ඒ පහුරෙන් එතරවුනාට පස්සෙ පහුර කරගහගෙන යන්නෙ නැහැ. 'කුල්ලූපමො මයා ධම්මො දෙසිතො' ඊළඟට 'ආජානන්තෙහි ධම්මා පි වො පහාතබ්බා පගෙව අධම්මා'[10] - ආදීවශයෙන් අන්න ඒ අදහසයි මෙතන තියෙන්නෙ. 'මේ ධර්මය මම පහුරකට උපමා කරමි. ධර්මය අභීත්වයෙන් තේරුම් ගත්තට පස්සෙ' මේ ධර්මයන්වත් අල්ලන්නෙ නැත' අධර්මයන් පමණක් නොවේ, කියල ඔය විදියට ප්‍රකාශවන්නෙත් මේ කාරණයමයි. මෙයින් අපට වැඩියත් පැහැදිලි වෙන්නෙ රහතන්වහන්සේ කාමලෝකයට එන්නෙත් නැහැ. දැන් කෙනෙක් හිතන්න පුළුවන් ඒ ආහාර ගැනීම් ආදියෙදි රහතන් වහන්සේ කාමලෝකයෙයි ඉන්නෙ කියල. ඒකත් නොවෙයි. ඒ වගේ තමයි රූප අරූප ධ්‍යානවලට සමවැදුනත් රූප අරූප ලෝකවලට අයිති නැහැ. රහතන්වහන්සේටත් පුළුවන් රූප අරූප

ධ්‍යානවලට සමවදින්න. නමුත් ඒ භවයට අයිති වෙන්නෙ නැහැ. අර 'අතම්මයතාව' නිසා. ඒවා දැඩිව අල්ලගන්නෙ නැහැ මමය මාගේය කියල. මමත්වයක් නැතිනිසා. මේක පුදුම ධර්මතාවක්. අර භාෂාව පිළිබඳව ලෝකයා දැඩිවගන්න මත දෘෂ්ටි එහෙම පිටින්ම නැතිවෙල යනව රහතන් වහන්සේට. මේක වඩාත් අපට ප්‍රකට වෙනව කලිනුත් අපි බොහොම අවධාරණය කළ සූත්‍රයකින්. සුතත නිපාතයෙ උරග සූත්‍රයෙන්. ඒ සූත්‍රයෙ ගාථා 17 කම ධ්‍රැව පද වශයෙන් අවසාන පද දෙකක් සඳහන් වෙන බව අපි ප්‍රකාශකළා කලින් අවස්ථාවෙ. සර්පයෙකුගෙ හැව පිළිබඳව. හැම ගාථාවක්ම ඉවරවෙන්නෙ, ඒ ගාථා 17ම ඉවරවෙන්නෙ, 'සො භික්ඛු ජහාති ඔරපාරං උරගො ජිණ්ණමිව තචං පුරාණං' කියල, එබඳු ඒ භික්ෂුව 'ඔරපාරං' අන්න මෙතෙන්දි හොඳටම අර්ථවත් ඒ ඔරපාරං කියන එක. 'ඔරං' කියල කියන්නෙ මෙගොඩ. 'පාරං' කියන්නෙ එගොඩ. ඒ භික්ෂුව මෙගොඩත් අතහරිනව එගොඩත් අතහරිනව. යම්සේ සර්පයෙක් දිරාගිය හැවක් අතහරිනවද ඒ වගේ. ඒ හැවෙන් වැඩගත්ත. ඊළඟට ඉතින් අතහරිනව. දැන් මේ ගාථා දෙපදයම අඩංගු උරග සූත්‍රයෙ තව එක ගාථාවක් අපි මේ අවස්ථාවෙ ඉදිරියට ගනිමු. මක්නිසාද අර ප්‍රපංච පදයටත් සම්බන්ධ නිසා ඒක. රහතන්වහන්සේ ඇත්තවශයෙන්ම මේ කියාපු තත්ත්වයට පැමිණෙන්නෙ අර ද්වයතාව අනුවගිය - එතෙර මෙතෙර ආදි වශයෙන්, හොඳ නරක, පව් පින් ආදී වශයෙන් ගන්න ද්වයතාව අනුවගිය - ලෞකික සංකල්ප පිළිබඳ ද්වයතාවෙන් මිදුනු නිසයි. ඒ වගේම සාපේක්ෂතාවෙන් මිදිල. දෙකක් හැටියට ගත්තාම මේවයෙ තියෙන්නෙ සාපේක්ෂක බවක්. 'පරස්පරාපේක්ෂක, - එකක් අනිකට සම්බන්ධ, .එගොඩක් තියෙනවනම් මෙගොඩක් තියෙන්නෙ ඕන. මෙගොඩක් තියෙනවනම් එගොඩක් තියෙන්න ඕන. ඔන්න ඔය විදියෙ සාපේක්ෂතාවක් තියෙනව. ද්වයතාව අනුව, සාපේක්ෂතාව අනුව, ගිය ඒ ලෞකික ප්‍රපංචයන්ගෙන්, සංකල්පයන්ගෙන්, මිදුනබවයි මෙතෙක් ප්‍රකාශ කළ කරුණු වලින් පැහැදිලි වෙන්නෙ. විශේෂ ගාථාවක් හැටියට අප ඉදිරියට ගන්න බලාපොරොත්තු වෙන්නෙ ඒ උරග සූත්‍රයෙම එන -

**යො නාච්චසාරී න පච්චසාරී - සබ්බං අච්චගමා ඉමං පපඤ්චං**

**සො භික්ඛු ජහාති ඔරපාරං - උරගො ජිණ්ණමිව තචං පුරාණං**

'යමෙක් අතිධාවනයද නොකරන්නේ වේද, පසුබැස්මක්ද නොකරන්නේ වේද' ඒ කියන්නේ ඉස්සරහට දුවන්නෙත් නැහැ පස්සට දුවන්නෙත් නැහැ - 'සබ්බං අච්චගමා ඉමං පපඤ්චං' - මේ සියලු ප්‍රපංචය ඉක්මවා ගියේද 'සමතික්‍රමණය' කළේද 'සො භික්ඛු ජහාති ඔරපාරං' ඒ භික්ෂුව මෙතෙරත් අතහරිනව, එතෙරත් අතහරිනව, හරියට අර සර්පයා දිරාගිය හැව අතහරින්න වගේ.

එතකොට මේ ගාථාව විශේෂයෙන්ම එළියට ගත්තෙ මේකෙ වටිනා අදහස් කීපයක්ම තිබෙන නිසා. අර 'යො න පච්චසාරී' කියල කෙටියෙන් සඳහන් කළ ඒ පද දෙක වඩාත් තේරුම් කළාට වරදක් නැහැ. මෙතන අතිධාවනයත් පසුබැසීමත් කියන එකත් අර ද්වයතාව අනුව ගිය සංකල්ප පෙන්නුම් කරන එකක්. නිදසුන් වශයෙන් කිව්වොත් උච්ඡේද දෘෂ්ටිය අතිධාවනයක්, ශාස්වත දෘෂ්ටිය පසුබැසීමක්. ඊළඟට තවත් විදියකට වඩාත් පහසුවෙන් තේරුම් ගන්න නිදසුනක් කිව්වොත් අනාගතය ගැන හිතීම අතිධාවනයක් අතීතය ගැන දුක්වීම පසුබැසීමක්. ලෝකයෙ තියෙන සංකල්ප ඔය විදියෙ රටාවක් අනුවත් යනව. අන්න ඒක නිසා රහතන්වහන්සේට ඒ විදියට අතිධාවනයකුත් නැහැ. පසුබැසීමකුත් නැහැ. 'සබ්බං අච්චගමා ඉමං පපඤ්චං' - මේ පපඤ්ච කියන වචනය අපි කලින් අවස්ථාවක සඳහන් කළා. වෙන කාරණයක් සම්බන්ධයෙනුයි ඒක සඳහන් කළේ. අර මුදල් නෝට්ටු අවලංගු වුන අවස්ථාවක්. ඇත්ත වශයෙන්ම මේ මුළුමහත් ලෝකයේම තියෙන ලෞකික ව්‍යවහාර එහෙම පිටින්ම මුදල්නෝට්ටු ගොඩක්. කාසි ගොඩක්. ඒව හුවමාරු කරගෙන ඒවායින් ප්‍රයෝජන ගන්නා අය අතරෙයි ඒවායේ වටිනාකම තියෙන්නෙ. යම්කිසි අවස්ථාවක මුදල් නෝට්ටුවක් අවලංගු වුනොත් ඒක පිළිබඳව තිබුණු තණ්හාවත් නැහැ මාන්නයත් නැහැ දෘෂ්ටියත් නැහැ. එතකොට මේ පපඤ්ච කියන එක අපි තේරුවෙ තණ්හා මාන දිට්ඨි ආශ්‍රයෙන්. අටුවාවල පවා ඒ වචන ඒ විදියට තෝරනව. 'තණ්හාපපඤ්ච දිට්ඨිපපඤ්ච මානපපඤ්ච'. ඒක මුදල් නෝට්ටුවකම තියෙනව මේව. රහතන්වහන්සේට තණ්හාව නැතිකරල නිසා ඔක්කොම කෙලෙස්වලින් මිදිල නිසා මේ මුදල් නෝට්ටු අවලංගුවෙලා. අන්න ඒක නිසා තමයි 'සබ්බං අච්චගමා ඉමං පපඤ්චං' මේ මුළු පපඤ්චයම එහෙම පිටින්ම ඉක්මවලා ගියා. සමතික්‍රමණය කළා, රහතන්වහන්සේ, 'සො භික්ඛු ජහාති ඔරපාරං' මේ 'ඔරපාරං' කියන එකත් පුළුල් අර්ථ තියෙන වචනයක්. අපි කලින් අවස්ථාවල ඒ පුළුල් අර්ථ දැක්වුව. 'ඇතුළත - පිටත, 'තමා - අනුන්' ආදි වශයෙන්. මේ ද්වයතාවත් තේරුම් ගන්න පුළුවන්. නමුත් මෙතන විශේෂයෙන්ම - ඔරපාරං' - මෙතෙරත් එතෙරත්. මෙතෙර - එතෙර පිළිබඳ සංකල්ප පැහැදිලිවම පෙනෙනව මේ දක්වපු උපමාවලින්. 'උරගො ජිණ්ණමිව තචං පුරාණං' දිරාගිය හැව තමයි එහෙම පිටින්ම මේ භාෂාව්‍යවහාරය. මේ භාෂාව්‍යවහාරයේ තිබුන එතෙර - මෙතෙර ව්‍යවහාරය රහත්වහන්සේට නිරර්ථකයි. ලෝකයාට මේ ධර්මය තේරුම්කරන්න අමාරුකම නිසාම වෙන්න ඇති - මේ විදියේ මේ වාග්ව්‍යවහාර පාවිච්චි කරලම තෝරන්න ගියොත් මුළාවෙ වැටෙන්න ඉඩ තියෙනව කියන අදහසින් වෙන්න ඇති - සමහරවිට බුදුරජාණන්වහන්සේ ධර්මය දේශනාකිරීමට මන්දෝත්සාහී උනෙත්. ඒ තරමම සියුම් කාරණයක් මේ ධර්මය පිළිබඳව මෙතන තියෙන්නෙ. මේ හැම එකක්ම අපි ප්‍රකාශකළේ

අපි තවම යන්නෙ 'එගොඩ - මෙගොඩ' 'එතෙර - මෙතෙර' කියන පදදෙක ඔස්සෙ නිසයි. ඒ දෙකේ තියෙන සාපේක්ෂතාවත්, ඒ දෙක යටින් තිබෙන මේ නිවන පිළිබඳ යම්කිසි ගැඹුරු අදහසකුත් මතුකර දීමටයි.

එතකොට මේකටම අදාළ - මේ එතෙර මෙතෙර ප්‍රශ්නයටම අදාළ තවත් එක්තරා ගැටලු සහිත සූත්‍රයක් තමයි ඉතිවුත්තක දුක නිපාතයේ සඳහන් වෙන 'සඋපාදිසෙසා නිබ්බානධාතු අනුපාදිසෙසා නිබ්බානධාතු කියන මාතෘකාව ඉදිරිපත් කරන එක්තරා සූත්‍රයක්. මෙන්න මේ විදියටයි ඉතිවුත්තකයෙ ඒ කාරණය සඳහන් වෙන්නෙ. අපි උඩෘතවශයෙන් ඒ කොටස එහෙම පිටින්ම දක්වන්න බලාපොරොත්තු වෙනව. මක්නිසාද කාරණා ගණනාවක්ම ඒකෙන් මතුකර ගන්න තිබෙන නිසා. ඒ ප්‍රශ්න පිළිබඳව සාවධානව කල්පනාකරල බැලුවොත් සමහරවිට කෙනෙකුට ඒ පිළිබඳව පැහැදිලි නිගමනයකට එන්න පුළුවන්.

වුත්තං හෙතං භගවතා වුත්තං අරහතාති මෙ සුතං ද්වෙමා භික්ඛවෙ නිබ්බාන ධාතුයො. කතමා ද්වෙ? සඋපාදිසෙසා ච නිබ්බානධාතු අනුපාදිසෙසා ච නිබ්බානධාතු. කතමා ච භික්ඛවෙ සඋපාදිසෙසා නිබ්බාන ධාතු? ඉධ භික්ඛවෙ භික්ඛු අරහං හොති ඛීණාසවො වුසිතවා කතකරණීයො ඔහිතභාරො අනුප්පත්ත සදත්ථො පරික්ඛීණභව සඤ්ඤොජනො සම්මදඤ්ඤා විමුත්තො. තස්ස තිට්ඨන්තෙව පඤ්චින්‍ද්‍රියානි යෙසං අවිඝාතත්තා මනාපාමනාපංපච්චනුභොති සුඛදුක්ඛං පටිසංවෙදෙති. තස්ස යො රාගක්ඛයො දොසක්ඛයො මොහක්ඛයො අයං වුච්චති භික්ඛවෙ සඋපාදිසෙසා නිබ්බාන ධාතු.
කතමාච භික්ඛවෙ අනුපාදිසෙසා නිබ්බානධාතු? ඉධ භික්ඛවෙ භික්ඛු අරහං හොති ඛීණාසවො වුසිතවා කතකරණීයො ඔහිතභාරො අනුප්පත්ත සදත්ථො පරික්ඛීණභව සඤ්ඤොජනො සම්මදඤ්ඤා විමුත්තො තස්ස ඉධෙව සබ්බවෙදයිතානි අනභිනන්දිතානි සීතිභවිස්සන්ති අයං වුච්චති භික්ඛවෙ. අනුපාදිසෙසානිබ්බානධාතු.

එතමත්ථං භගවා අවොච තත්ථෙතං ඉතිවුච්චති.
ද්වෙ ඉමා චක්ඛුමතා පකාසිතා
නිබ්බාන ධාතු අනිස්සිතෙන තාදිනා
එකාහි ධාතු ඉධ දිට්ඨධම්මිකා
සඋපාදිසෙසා භවනෙත්ති සඞ්ඛයා
අනුපාදිසෙසා පන සම්පරායිකා
යම්හි නිරුජ්ඣන්ති භවානි සබ්බසො
යෙ එතදඤ්ඤාය පදං අසඞ්ඛතං
විමුත්තචිත්තා භවනෙත්ති සඞ්ඛයා
තෙ ධම්මසාරාධිගමා ඛයෙ රතා
පහංසු තෙ සබ්බභවානි තාදිනො
අයම්පි අත්ථො වුත්තො භගවතා ඉති මෙ සුතං,[11]

මේ සම්පූර්ණ සූත්‍රයයි. මේකෙ අදහස ඉස්සෙල්ල ප්‍රකාශ කරන්ට සිද්ධ වෙනව - වුත්තං හෙතං භගවතා වුත්තං අරහතාති මෙ සුතං' ඉතිවුත්තක සූත්‍ර සාමාන්‍යයෙන් ඉදිරිපත්කරන්නෙ ඒ ආකාරයටයි ඉතිවුත්තක පාළියෙ 'මෙන්න මේ කාරණය අර්හත් වූ භාග්‍යවතුන්වහන්සේ විසින් ප්‍රකාශකරන ලද්දේ යයි මාවිසින් අසන ලදී'. 'ද්වෙමා භික්ඛවෙ නිබ්බානධාතුයො' - මහණෙනි මේ නිබ්බාන ධාතු දෙකක් ඇත'. සඋපාදිසෙසා ච නිබ්බානධාතු අනුපාදිසෙසා ච නිබ්බානධාතු' - 'සඋපාදිසෙස නිබබානධාතුවයි අනුපාදිසෙස නිබ්බාන ධාතුවයි'. 'කතමාච භික්ඛවෙ සඋපාදිසෙසා නිබ්බානධාතු' - 'කුමක්ද මහණෙනි සඋපාදිසෙස නිබ්බානධාතුව? 'ඉධ භික්ඛවෙ භික්ඛු අරහං හොති ඛීණාසවො වුසිතවා කතකරණීයො ඔහිතභාරො අනුප්පත්තසදත්ථො පරික්ඛීණ භවසඤ්ඤොජනො සම්මදඤ්ඤා විමුත්තො' - 'මෙහිලා මහණෙනි යම්කිසි භික්ෂුවක් අර්හත්‍ය. සියලු ආශ්‍රවයන් ක්ෂය කරලය. බ්‍රහ්මචර්යාව වැස නිමකරලය. කළයුතුදේ කර නිමවා තිබෙනවය. පඤ්චස්කන්ධභාරය බහා තබලය. තමා බලාපොරොත්තුවන අර්ථයට පැමිණිලය. සියලු භව බැඳුම් ක්ෂයකරලය. නියම 'අඤ්ඤා විමුත්තිය' ප්‍රත්‍යක්ෂ ඥානයෙන් විමුත්තිය, ලබාගෙනයි සිටින්නෙ' - 'තස්ස තිට්ඨන්තෙව පඤ්චින්ද්‍රියානි යෙසං අවිඝාතත්තා මනාපාමනාපං පච්චනුභොති සුඛදුක්ඛං පටිසංවෙදෙති' - 'ඒ භික්ෂුවගේ ඒ පඤ්චේන්ද්‍රියයන් තවම තිබෙනව. ඒවා විනාශනොකර තිබෙන නිසා මනාප අමනාප දේ භුක්ති විඳිනව. සැපදුක් ආදියත් විඳිනව'. 'තස්ස යො රාගක්ඛයො දොසක්ඛයො මොහක්ඛයො අයං වුච්චති භික්ඛවෙ සඋපාදිසෙසා නිබ්බානධාතු' - එබඳු ඒ භික්ෂුවගේ යම් රාග ද්වෙෂ මොහ ක්ෂය කිරීමක්වේද. අන්න එයටයි සඋපාදිසෙස නිබ්බානධාතුවය කියන්නෙ'. 'කතමාච භික්ඛවෙ අනුපාදිසෙසා නිබ්බානධාතු' - ඊළඟට බුදුරජාණන්වහන්සේ ප්‍රකාශකරනව 'මොකක්ද මේ අනුපාදිසෙස නිබ්බානධාතුව'. එතෙන්දිත් අර කලින් කියාපු විදියටම ඒ භික්ෂුවගේ අර්හත්වය සම්පූර්ණයි. ඒ කියන්නේ 'ඉධ භික්ඛවෙ භික්ඛු අරහං හොති ඛීණාසවො වුසිතවා කතකරණීයො ඔහිතභාරො අනුප්පත්තසදත්ථො පරික්ඛීණ භවසඤ්ඤොජනො සම්මදඤ්ඤා විමුත්තො' කියල ඒ අර කලින් දක්වපු අර්හත්වය පිළිබඳ සම්පූර්ණ පාඨය මෙතනත් දක්වනව අනුපාදිසෙස නිබ්බානධාතුව පිළිබඳව. දක්වල, මෙන්න මෙච්චරයි එතකොට අනුපාදිසෙසනිබ්බාන ධාතුවට ආවේණික කොටස හැටියට දක්වන්නේ. එක වාක්‍යයයි එතන බුදුරජාණන්වහන්සේ දක්වන්නෙ. 'තස්ස ඉධෙව සබ්බවෙදයිතානි අනභිනන්දිතානි සීතිභවිස්සන්ති'. 'මහණෙනි ඒ භික්ෂුවගේ වේදයිතයෝ **මෙහිදීම** - මෙලොවදීම - සතුටු නොවීම නිසා අභිනන්දනයක්, සතුටක් ඇතිකර නොගැනීම නිසා - 'සීතිභවිස්සන්ති' - සිසිල් වන්නාහ. අනාගතකාලිකවයි තියෙන්නෙ. 'අයං වුච්චති භික්ඛවෙ අනුපාදිසෙසා නිබ්බාන ධාතු' -මෙන්න මේකයි මහණෙනි අනුපාදිසෙස නිබ්බාන ධාතුව. අපි අර

සාමාන්‍යයෙන් බලාපොරොත්තුවන විදියෙ අසංඛත ධාතු ලෝකයක් නොවෙයි. ඉර හඳ තාරකා නැති ලෝකයක් නොවෙයි. මේ වාක්‍යය විතරයි තියෙන්න. එහෙම ප්‍රකාශකරල ඊළඟට 'තදෙථතං ඉති වුච්චති' කියල ඒකෙම අදහස ඉදිරිපත්කරනව ගාථා වලින්.

'දුවෙ ඉමා චක්ඛුමතා පකාසිතා - නිබ්බානධාතු අනිස්සිතෙන තාදිනා' - ඒ තාදී ගුණ ඇති. ඇලුම් බැඳුම් නැති, ඒ බුදුරජාණන්වහන්සේ විසින් මෙන්න මේ නිර්වාණ ධාතු දෙක ප්‍රකාශකරල තියෙනව. 'එකා හි ධාතු ඉධ දිට්ඨධම්මිකා - සඋපාදිසෙසා භවනෙත්ති සඞ්ඛයා' - ඒ දෙක අතුරෙන් එකක් 'දිට්ඨධම්මිකයි'. මේ ජීවිතය පිළිබඳව. 'සඋපාදිසෙසා භවනෙත්ති සඞ්ඛයා - එය සඋපාදිසෙස නමින් හැඳින්වෙනව. එහි විශේෂ කාරණය මොකක්ද? 'භවනෙත්ති සඞ්ඛයා' - භවනෙත්ති කියල කියන්නෙ තෘෂ්ණාව. තෘෂ්ණාව ක්‍ෂයකිරීම හා සම්බන්ධ වූ ඒ සඋපාදිසෙස තත්ත්වයයි සඋපාදිසෙස නිබ්බානධාතුව. 'අනුපාදිසෙසා පන සම්පරායිකා යම්හි නිරුජ්ඣන්ති භවානි සබ්බසො' - අනුපාදිසෙස නිබ්බානධාතුව වනාහි සම්පරායිකය. සම්පරායික කියන්නෙ මරණින්මතු කියන අදහසයි. දිට්ඨධම්මික සම්පරායික කියන ඔය වචන යෙදෙනව මෙලොවත් පරලොවත් පිළිබඳව. ඒ තත්ත්වයේදී සියලුම භව සර්වප්‍රකාරයෙන්ම නිරුද්ධ වෙනව. ඒකයි අනුපාදිසේසයේ විශේෂ ලක්‍ෂණය. 'යෙ එතදඤ්ඤාය පදං අසඞ්ඛතං විමුත්තචිත්තා භවනෙත්ති සඞ්ඛයා' - යම් කෙනෙක් මේ අසංඛත පදය මැනැවින් තේරුම් අරගෙන භවනෙත්ති නම් වූ ඒ තෘෂ්ණාව ක්‍ෂයකිරීමෙන් විමුක්ත වූ සිත් ඇත්තාහු ද, 'තෙ ධම්මසාරාධිගමා ඛයෙ රතා' - ඔවුහු - ධම්මසාර නමින් හැඳින්වෙන්නෙ අකුප්පා චෙතොවිමුත්තියයි. අර්හත්ඵල සමාධියයි. අපි මේ ගැන කලින් ප්‍රකාශකරල තිබෙනව. ඒකටමයි ධම්මසාරය කියල කියන්නෙ. ධර්මය විමුත්තිසාරයි කියල කියන්නෙ. මේ මුළු මහත් ධර්මයෙ සාරයම ඒකයි. ඒ රහතන්වහන්සේලා 'ධම්මසාර' නම්වූ 'අකුප්පාචෙතොවිමුත්තිය' ලබාගෙන 'ඛයෙ රතා' මෙතන මේ ක්‍ෂයකිරීමක් ගැන කියනව. ක්‍ෂය කියන වචනය නිකම් තියෙනකොට නොයෙකුත් අර්ථ දෙන්න පුළුවන්. නමුත් මෙතන විශේෂයෙන්ම කියැවෙන්නෙ වේදනා ක්‍ෂයයි. අපි ඒකට හේතුව පසුව දක්වනව. මෙතන ගතයුත්තෙ වේදනාවන්ගේ ක්‍ෂයකිරීමයි. 'ඛයෙ රතා' - වේදනාවන්ගේ ක්‍ෂයකිරීම පිළිබඳව ඇල්ම ඇත්තාහු, 'පහංසු තෙ සබ්බභවානි තාදිනො' - ඒ විමුක්ත පුද්ගලයෝ සියලුම භවයන් අතහැරියාහ.

දැන් එතකොට මේ සූත්‍රයෙන් පැන නගින ගැටලු එකින් එක අරගෙන අපට ටිකක් විස්තර කරන්න සිද්දවෙනව. පළමුවෙන්ම අපි මේ 'දිට්ඨධම්මික' 'සම්පරායික' කියන පද දෙකයි ඉස්සරහට ගන්න ඕන. මේ පද දෙක නිසා තමයි මහ අවුල්ජාලයක් ඇතිවෙලා තිබෙන්නෙ. 'දිට්ඨධම්මික' කියන එක

අටුවාවෙ සාමාන්‍යයෙන් තෝරන්නෙ 'ඉමස්මිං අත්තභාවෙ භවා වත්තමානා' - මේ ආත්ම භාවයට අදාළ, වර්තමාන කියන එකයි. ඒක හරි. ඊළඟට 'සම්පරායික' කියන්නෙ 'සම්පරායෙති බන්ධභෙදතො පරභාගෙ' - රහතන්වහන්සේගේ පඤ්චස්කන්ධය බිඳිල ගියාට පස්සෙ, මරණින් මතු කියන අදහසයි එතන. 'දිට්ඨධම්මික' 'සම්පරායික' කියන පද දෙක මේ විදියට තේරුම් ගත්තොත් අපට මේ සූත්‍රය තෝරන්න වෙන්නෙ රහතන්වහන්සේ මෙලොවදී නිවනෙ කොටසක් ලබනව. පරලොවදී, මරණින් මතු, තව කොටසක් ලබනව. එහෙම හිතන්නත් පුළුවනි. නමුත් හැමතැනම වගේ මේ ධර්මය ගැන කියනකොට, මේ ධර්මයේ විශේෂත්වය, බුදුරජාණන්වහන්සේගේ ධර්මයේ විශේෂත්වය - අනන්‍යලබ්ධිකයින් පවා මේ ධර්මය වැළඳගත්තට පස්සෙ ඒක ප්‍රකාශ කරනව - 'දිට්ඨෙව ධම්මෙ' කියන වචනයට සම්බන්ධයි. එහෙමත් නැත්නම් 'සන්දිට්ඨිකං අකාලිකං'. ධර්මගුණ කියවෙන තැන්වල දැක්වෙන්නෙ සන්දිට්ඨිකයි' ඒ කියන්නෙ මේ නිර්වාණ ධර්මය, මේ ශාසනයේ පරමාර්ථය මෙලොවදීම, මේ ජීවිතය තුළදීම කල්නොයවාම සම්පූර්ණයෙන්ම අංග සම්පූර්ණවශයෙන් ප්‍රත්‍යක්ෂකරගන්න පුළුවන්. 'මේකෙ කොටසක් දැන්, අනික් කොටස පසුව' නොවෙයි. එහෙම දෙයක් මේ 'සන්දිට්ඨික අකාලික' දිට්ඨෙව ධම්මෙ' ආදී පදවලින් දැක්වෙන්නෙ. එහෙම නැත්නම් මේ සූත්‍රය ඊට විරුද්ධව යනවද කියන එකයි ඊළඟට ගැටළුව. මෙතන මේ කියන 'දිට්ඨධම්ම සම්පරායික' කියන එක මොකක්ද? මේක තෝරාගන්නෙ කොහොමද? කර්මය පිළිබඳව කථාකරනකොට නම් මේ වචනදෙක බොහොම ලේසියෙන් තේරුම්ගන්න පුළුවන්. 'දිට්ඨධම්ම වෙදනීය කම්ම' කියල කියන්නෙ මේ ජීවිතයේදීම ඒවායේ විපාක විඳින්න වෙන සමහර කර්මවලට. 'සම්පරායික' කියන එකත් ඉතින් 'සම්පරායෙව දුග්ගති' කිව්වොත් කියන්නෙ මරණින් මතු දුගතියට යනව කියන එකයි. කර්මය පිළිබඳව නම් මේ කාරණය හරි. ඒ කියන්නෙ මෙලොව විඳින දේත්, පරලොව මරණින් මතු විඳින දේත්. නමුත් නිවන්සුව පිළිබඳවත් ඒ වගේ එකක් කියන්න පුළුවන්ද? රහතන්වහන්සේල නිවන් සුවය මෙහෙත් කොටසක් විඳිනව. පරලොවත් විඳිනව කියල. දැන් මේක තව ටිකක් මතුකරගන්න මෙතන මේ දිට්ඨධම්මික සම්පරායික කියන පදදෙකත් එක්කම සම්බන්ධවෙච්ච සඋපාදිසෙස අනුපාදිසෙස කියන පද දෙකත් මෙතෙන්ට කිට්ටු කරගන්න සිද්දවෙනව. ඒ එක්කම තවත් මතක තබාගතයුතු කාරණයක් තමයි. 'භව නිරොධො නිබ්බානං' කියල නිවන හඳුන්වපු බවත් අපි කලින් අවස්ථාවල ප්‍රකාශකළා. එතකොට නිවන කියන්නෙ භවනිරෝධය නම් රහතන්වහන්සේගේ මරණින් මත්තෙ විඳින්න දෙයක් ඉතුරුවෙන්නෙ නැහැ. භවනිරෝධය පිළිබඳ ප්‍රත්‍යක්ෂයමයි නිවන කියන්නෙ. එතකොට රහතන්වහන්සේගේ මරණින් මත්තෙ මොකක්වත් නැහැ. ශරීරයක් තිබුන, නැතිවුනා එච්චරයි. එතකොට මේ කාරණය තේරුම් ගැනීමට නිබ්බාන කියන පදයෙ මූලික අර්ථය ඉදිරියට ගන්න සිද්ද වෙනව. 'නිබ්බාන' කියල කියන්නෙ, අපි ප්‍රකාශකළා

- අර 'වාණසංඛාත තණ්හා' කථාවල් මොකක්වත් නැහැ - නිවීමයි. **'නිබ්බාන කියන්නෙ නිවීමයි.** එතකොට මේ නිවීම කියන අර්ථය ඉදිරියට ගත්තොත් මේ සූත්‍රයෙ තිබෙන මහා ගැටලුව විසඳගන්න පුළුවන්. මහ ගින්නක් දැල්වෙමින් තිබුන තැනකට අමුතුවෙන් දර ආදිය දැම්මෙ නැත්නම් ඒ ගින්නේ අර ගිනිදැල් එහෙම සංසිඳිල අර කලින් දැල්වුන දරකොටන් පමණක් නිවෙමින් පවතිනව. ගිනි අඟුරු හැටියට නිවෙමින් පවතිනව. ඒකයි සාමාන්‍ය ධර්මතාව. මේක අපේම උපමාවක් නොවෙයි. අඞ්ගුත්තර නිකායෙ ඡක්ක නිපාතයෙ නාගසූත්‍රයෙ බුදුරජාණන්වහන්සේ ඇතෙකුට උපමාකරපු ගාථාමාලාවක් තියෙනව. ඒ ගාථාම උදායිථෙරගාථාවෙත් සඳහන්වෙනව. අන්න ඒව අතරෙ තියෙන එක්තරා වටිනා ගාථාවක් අපි මේ අවස්ථාවෙ ඉදිරියට ගනිමු.

**මහා ගිනි පජ්ජලිතො - අනාහාරොපසමමති**
**අඞ්ගාරෙසු ච සන්තෙසු - නිබ්බුතොති පවුච්චති**[12]

මහා ගින්නක් දැල්වෙමින් තිබිල ආහාර නොලබා - දර නොලබා සංසිඳෙනව. 'අංගාරෙසු ච සන්තෙසු' - ගිනි අඟුරු ඇති කල්හිම, නිබ්බුතොති පවුච්චති - නිවුනේය යන ව්‍යවහාරය යෙදෙනව. නිවුනේයයි කියනව. අපි මේ විදියට මේ ගාථාව තේරුවට මොකද මේ ගාථාවෙත් තියෙනව පාඨානතර තරහයක්. අපි කිව්ව අර ගැඹුරු සූත්‍ර කොටස් පිළිබඳව තව අමතර ප්‍රශ්නයකුත් විසඳන්න සිද්දවෙනව කියල. මේවයෙ නිරුක්ති සොයන්නත් සිද්දවෙනව. ඒ වගේ මෙතන කියවෙන තුන්වෙනි පදය පිළිබඳ පාඨාන්තර නොපැහැදිලිකමක් තියෙනව. ඒ කියන්නෙ සමහර සංස්කරණවල, අපි මේ 'අංගාරෙසු ච සන්තෙසු' කිව්ව වෙනුවට සමහර ඒවයි තියෙන්නෙ 'සංඛාරෙසු උපසන්තෙසු' කියල. බොහොම සංස්කරණවල ඇත්ත වශයෙන් ඒ පාඨාන්තර තරහයෙන් ජයගෙන තිබෙන හැටියට පේන්නෙ අර 'සංඛාරෙසු උපසන්තෙසු' කියන එකයි. ඒකේ වෙනමම අර්ථයක්. එහෙමපිටින්ම වෙනස් අර්ථයක්. එහෙම ගත්තොත් අපට ඒ ගාථාව තෝරන්න වෙන්නෙ 'මහ ගින්නක් දැල්වෙමින් තිබිල දර නොලබා නිවීයනව. සංස්කාරයන් සංසිඳුනුකල්හි නිවුනේයයි කියනව' කියලයි. දැන් මේ ටිකක් කල්පනා කරනකොට පේනව අර මුල්පද දෙකේ කියාපු උපමාවට ගැලපෙනවද මේ සංස්කාරකථාවක් මෙතනට කිට්ටුකිරිම කියල. මේ විදියෙ පාඨාන්තර දෝෂ ඇතිවීම ස්වාභාවිකයි. පුස්කොළ පොත් ලිවීමේදී ලේඛ්‍ය දෝෂත් ඇතිවෙනව. ඒ කියන්නෙ එක්කෙනෙක් ලියාපු අකුරු වැරදියට කියවීමෙන් නොයෙක් විදියෙ පාඨාන්තර සම්මිශ්‍රණතාවල් ඇතිවෙනව. ඒ වගේම සමහර අවස්ථාවල පුස්කොල පොත් ලියනකොට වෙන කෙනෙක් කියවනවනෙ. ඒ කියවන එක්කෙනා කියන දේ අහන එක්කෙනා වෙන අදහසකින් ඇහුවොත් ඔන්න එතනත් පටලැවිල්ලක්.

මේක එහෙම එකක් වෙන්න ඉඩ තිබෙනව. දැන් ශබ්ද වශයෙන් බැලුවත් අංගාරෙසු ච සන්තෙසු කියන එක 'සංඛාරෙසු උපසන්තෙසු' වගේ. අන්න එහෙම වුන පටලැවිල්ලක්ද දන්නෙ නැහැ. කොයිහැටි හෝ වේවා අපට මෙතන අර්ථාන්විත හැටියට ගන්න වෙන්නෙ මෙන්න මේ 'අංගාරෙසු ච සන්තෙසු' කියන පාඨයයි. ඒ පාඨය අරගෙනයි අපි ඉදිරියට මේ විග්‍රහය කරන්න බලාපොරොත්තු වෙන්නෙ.

'අංගාරෙසු ච සන්තෙසු නිබ්බුතොති පවුච්චති' - එතකොට ගිනි අඟුරු තිබුනත් ඒ ගින්න නිවුනයි කියලයි කියන්නෙ. අර මහ ගින්නක් දැල්වෙමින්නේ තිබුනෙ. එතකොට ගිනිඅඟුරු තිබුනට ඒක නිවුනයි කියල කියන්න පුළුවන්. මක්නිසාද අමුතුවෙන් දර එකතුවීමක් නෑ. ගිනිදැල් නැඟීමක් නෑ. එතකොට සාමාන්‍යයෙන් ඒකට නිවුනයි කියල කිව්වට වරදක් නැහැ. දැන් මේ සූත්‍රයේ ප්‍රකාශ කෙරුන අදහස් ඔන්න මතුකරගන්න පුළුවන්. සඋපාදිසෙස නිබ්බාන ධාතුව පිළිබඳව ප්‍රකාශඋනා අර කියාපු අර්ථය අතින් සම්පූර්ණ වූ ඒ භික්ෂුවගේ - 'තස්ස තිට්ඨන්තෙව පඤ්චින්ද්‍රියානි යෙසං අවිඝාතත්තා මනාපාමනාපං පච්චනුභොති සුඛදුක්ඛං පටිසංවෙදෙති' කියල ඒ භික්ෂුවගේ පඤ්ච ඉන්ද්‍රියයන් තාම තිබෙනව. 'තිට්ඨන්ති එව' කියන්නෙ තවමත් තිබෙනව. ඉතිරිවෙලා තියෙනව. හරියට අර දර කොටන් තවම දැල්වෙනව වගේ. 'යෙසං අවිඝාතත්තා' ඒව තවම 'අළු' උනේ නැතිනිසා, ඒව තවම ඉතිරිවෙලා තිබෙන නිසා - මනාප අමනාප දේ භුක්ති විඳිනව සැපදුක් විඳිනව. ඔන්න එතකොට අර ගිනිදැල් නොනැඟෙන දරකොටන් වගේ. තවත් ඒක පැහැදිලිවෙනව, ඒ භික්ෂුවගේ සඋපාදිසෙස නිබ්බානධාතුව 'නියම අඳුමින් ප්‍රකාශ කෙරෙන පාඨය ඊළඟට බුදුරජාණන්වහන්සේ ඉදිරිපත්කරන විදියෙන්. 'තස්ස යො රාගක්ඛයො දොසක්ඛයො මොහක්ඛයො අයං වුච්චති භික්ඛවෙ සඋපාදිසෙසා නිබ්බානධාතු' - ඒ භික්ෂුවගේ යම් රාගක්ෂයක් වෙයිද, ද්වේෂක්ෂයක් වෙයිද, මෝහක්ෂයක් වෙයිද, මෙයයි මහණෙනි සඋපාදිසෙස නිබ්බානධාතුව. දැන් එතකොට මේ ගිනි අඟුරු අමුතු දර පතන්නෙ නැහැ. අමුතු උපාදාන දර පතන්නෙ නැහැ. මේ උපාදාන කියන වචනයෙ දර කියන අර්ථයත් තියෙනව. අල්ලාගැනීම කියන අර්ථයත් තියෙනව. එතකොට රහතන්වහන්සේගේ එදිනෙදා ජීවිතයේදී ඉන්ද්‍රියාරම්මණ ගන්නව අපි දැන් ප්‍රකාශ කරපු කාරණා අනුව. නමුත් ඒව දර හැටියට වැටහෙන්නෙ නැහැ. 'ආහාර' හැටියට වැටහෙන්නෙ නැහැ. වෙන එකක් තබා ආහාර පවා වැළඳුවත් ඒව ආහාර නොවෙයි රහතන්වහන්සේට. ඒව ආහාර නොවෙයි. වචනය පිළිබඳ මහා පරිවර්තනයක් සිද්ද වෙලයි තියෙන්නෙ. රහතන්වහන්සේගේ පඤ්චේන්ද්‍රියයන්ට ආරම්මණ ආවත් ඒව අමුතු දර නොවෙයි. ඒව උපාදාන නොවෙයි. 'ආහාර' නොවෙයි. ඒක නිසා හරියටම දැන් ගිනිඅඟුරු ගොඩක්. රහතන්වහන්සේගෙ සඋපාදිසෙස නිබ්බාන

ධාතුව හරියට අර ගිනිදැල් නිවිලගිය ගිනිඅඟුරු වගේ. මේ ගිනිදැල් හටගැනීම තමයි රාග ද්වේෂ මෝහ ඇතිවීම. සාමාන්‍ය පුද්ගලයින් ඉන්ද්‍රියාරම්මණ ගන්නකොට රාග ගිනිදැල් බුර බුරා නගිනවා. ද්වේෂ ගිනිදැල් , මෝහ ගිනිදැල් බුර බුරා නගිනවා. රහතන්වහන්සේගේ ඒ ගිනිදැල් නගින්නෙ නැහැ. මක්නිසාද ලෝකසම්මත ඉන්ද්‍රියාරම්මණ ගත්තට මොකද ඒවා 'ආහාර' වශයෙන් 'උපාදාන' බවට පත්වෙන්නෙ නැහැ. තවත් දර පතන්නෙ නැති ගිනි අඟුරු ගොඩක්. 'භවනෙත්තිසංඛයා' කියලත් අර ගාථාවල සඳහන් වෙන්නෙ සඋපාදිසෙස නිබ්බාන ධාතුව පිළිබඳව. 'භවනෙත්ති' නම්වූ තණ්හාව ක්ෂය කිරීමයි සඋපාදිසෙස නිබ්බාන ධාතුව - ඒකත් මේකට ගැලපෙනව. අර රාග ද්වේෂ මෝහ පැනනොනගිනව කියන එක එකවචනයකින් කියනව නම් තණ්හාව නැති කිරීමයි. තණ්හාව ක්ෂයයි. තණ්හාව ක්ෂයකරගෙන ජීවත්වෙනව ලෝකයෙ. අර ඉන්ද්‍රියයන් ඒ විදියටම ක්‍රියාකරනව. තවම අළුවෙලා නැහැ.

දැන් එතකොට මේක ආශ්‍රයෙන් අපට පුළුවන් අනුපාදිසෙස කියන එකත් තෝරගන්න. අනුපාදිසෙසයෙදි මොකද වෙන්නෙ. මෙතෙන්දි අපට ඉදිරියට ගන්න සිද්ද වෙනව මේ 'උපාදි' කියන වචනය. මේකත් මහ ගැටලු විදියෙ වචනයක්. අනාගාමි පුදගලයා පිළිබඳව ගත්තොත් සතිපට්ඨාන සූත්‍ර ආදියෙ එහෙම සඳහන් වෙනව. සතිපට්ඨානය යම්කිසි කෙනෙක් යම් කාලසීමාවක් පුරුදුකළොත් ඒ පුද්ගලයා පිළිබඳව මෙන්න මෙහෙම ප්‍රකාශකරනව. 'දිට්ඨෙව ධම්මෙ අඤ්ඤා සති වා උපාදිසෙසෙ අනාගාමිතා'[13] කියල. ඒ පුද්ගලය එක්කො මේ ජීවිතයේදීම 'අඤ්ඤා' නම් වූ අර්හත්ඵලය ලබනවා. එහෙම නැත්නම් 'සති වා උපාදිසෙසෙ' තවත් මොකක් නමුත් අල්ලගත්තු දෙයක් ඉතිරිව තිබෙනවනම් අනාගාමි වෙනව. එතන නම් 'උපාදි' කියන එක උපාදාන කියන වචනයට ඉතාමත් ළඟයි. නමුත් මෙතෙනදි සපාදිසෙස අනුපාදිසෙස පිළිබඳ ප්‍රශ්නයේදී රහතන්වහන්සේට කිසිසේත් උපාදානයක් නැහැ. ඒ මොකද කලින් අපි දැක්ක සඋපාදිසෙස නිබ්බාන ධාතුවත්, අනුපාදිසෙස නිබ්බානධාතුවත් දෙකම විග්‍රහ කරන්ට කලින් බුදුරජාණන්වහන්සේ දක්වන පාඨයෙන් රහතන්වහන්සේගේ සම්පූර්ණ ප්‍රත්‍යක්ෂය ප්‍රකාශවෙනව. 'සම්මදඤ්ඤා විමුත්තො' කියලත් කියනව. එහෙම පිටින්ම 'අඤ්ඤාවත්' එතන තියෙනව. අර්හත්ව ප්‍රතිලාභයත් ලබාගෙන උපාදානයක් කොහෙත්ම නැහැ.

එතකොට මෙතන මේ 'උපාදි' කියන වචනය අපට ගන්ට සිද්දවෙන්නෙ උපාදාන කියන වචනයට කිට්ටුකරල නොවෙයි. 'උපාදින්න' කියන වචනයට ළංකරලයි. සඋපාදිසෙස අනුපාදිසෙස ගැන කථාකරනකොට 'උපාදි' කියන වචනය තෝරන්න වෙන්නෙ උපාදිනන කියන වචනය ආශ්‍රය කරගෙනයි. මේ උපාදිනනය ගිනිඅඟුරු වගේ. අතීතකර්ම නිසා දැල්වුන දර කොටන්

තාම තියෙනව. මේ දරකොටන් වලට කොහොම කොහොමහරි වාත්තුකරගෙන රහතන්වහන්සේ ඒව ඉදිරියට ගෙනයනවා. මක්නිසාද, මේකට පටිසයක් නැහැ. ඕනකමින් ජීවිතය නැතිකරන්න අවශ්‍යතාවක් නෑ. සැරියුත් සවාමීන්වහන්සේ ප්‍රකාශකළා වගේ 'නාභිකඞ්ඛාමි මරණං - නාභිනන්දාමි ජීවිතං.[14] 'මම ජීවිතය පතන්නෙත් නැහැ. මරණය පතන්නෙත් නැහැ. අන්න ඒ වගේ කලින්ම ගිනි ගත්තු දරකොටන් ටික තවම දැවෙනව. ඔන්න ඔහොම ගත්තොත් අපට මේ සූත්‍රය අර්ථවත් කරගන්න පුළුවන්. එතකොට අනුපාදිසෙස තත්ත්වයෙ තියෙන්නෙ මොකක්ද? අර උපාදින්න ගිනිඅඟුරුත් එහෙම පිටින්ම නිවිල යනව. ආයුෂය ක්ෂයයි. ජීවිතය අවසානයේදී ඒ උපාදිනන ගිනිඅඟුරුත් නිවෙනව. අන්න ඒ ගිනිඅඟුරු නිවීම පිළිබඳව ඊළඟට මේ සූත්‍රයෙ තිබෙන තවත් වටිනා අදහසක් තමයි මේ වේදනාව පිළිබඳ ප්‍රශ්නය. සාමාන්‍යයෙන් මේ සූත්‍රයෙන් කෙනෙක් බලාපොරොත්තුවෙනව අනුපාදිසෙස නිබ්බානධාතුව හෝ අසංඛත ධාතුනම් වූ යම්කිසි පරමාර්ථ ධර්මයක් තියෙනවය රහතන්වහන්සේ ගිහිල්ල ඇතුල්වෙන. බුදුරජාණන්වහන්සේ ගැනත් සමහර කෙනෙක් කල්පනා කරනවනේ පරිනිර්වාණ ධාතුවට ඇතුල්උනා. අවුරුදු 5000 කට පස්සෙ එළියට ඇවිල්ල ධර්මය දේශනා කරනව. ඔය විදියටත් ජනප්‍රවාද තියෙනව. මක්නිසාද මරණින් මත්තෙ කොහේහරි ගිහිල්ල ඇතුල්වෙනව. දැන් මෙතන අනුපාදිසෙස නිබ්බාන ධාතුව තෝරන්නෙ 'තස්ස ඉධෙව භික්ඛවෙ සබ්බවෙදයිතානි අනභිනන්දිතානි සීතිභවිස්සන්ති' එකම වාක්‍යයකින් අනුපාදිසෙස නිබ්බාන ධාතුව තෝරල තියෙන්නෙ. 'ඉධෙව' - මෙහිදීම - මෙහිදීම කියන එකෙන් තේරෙනව මේ ජීවිතයේදීම, මරණයට කලින්ම, සබ්බවෙදයිතානි' - සියලුම වේදයිතයෝ 'අනභිනන්දිතානි' ඒවා පිළිබඳ සතුටුවීමක් නැති නිසාම 'සීතිභවිස්සන්ති' - සිසිල්වන්නාහ. එතකොට වේදයිතයන්ගේ සිසිල්වීමයි, මේ අනුපාදිසෙස නිබ්බාන ධාතුව. මරණයට කලින් කෙරෙන එකක් ඒක. ඒ කියන්නෙ කලින් ප්‍රකාශ කළ අදහසමයි. මාරයා උදුරාගන්ට එනකොට අතහරිනව. මරයා උදුරාගන්න එන්නෙ බරපතල ශාරීරික දුකකුත් දීල. මරණ වේදනාව කාටවත් හිතාගන්න බැරිතරම්, කවුරුත් බයවෙන විදියෙ වේදනාවක්. ඒ උදුරගන්න එන අවස්ථාවේදී රහතන්වහන්සේ කලින්ම පුරුදුකරල තියෙන අර්හත්ඵල සමාධිය මගින්, අර අනාශ්‍රව චෙතොවිමුත්තිය මගින්, අනාශ්‍රව ප්‍රඥා විමුක්තිය මගින්, අර සියලුම වේදයිතයන් සීතිභාවයට, සිසිල් භාවයට පමුණුවා ගන්නව. එතකොට මාරයට කරකියාගන්න දෙයක් නැතිවෙනව. එතකොට ඊට පස්සෙ මොකක්ද වෙන්නෙ ඒ ශරීරය අතහැරියට පස්සෙ? හරියට වෙන කෙනෙකුගෙ ශරීරයක් ආදාහනය කරන්න වගේ ආදාහනය කරගන්න උනත් පුළුවන්, දබ්බමල්ලපුත්ත රහතන් වහන්සේ වගේ. සමහර රහතන්වහන්සේල අහසට පැන නැගිල තේජෝධාතු

සමාපත්තියට සමවැදිල අළුවත් ඉතිරිවෙන්නෙ නැති අන්දමට තමන්ගෙ ශරීරය දවාගත්ත කියල සඳහන් වෙනව. එතකොට කෙනෙකුට හිතෙන්න පුළුවන් ඇයි මෙහෙම ගිනිතියාගත්තම වේදනාවක් දැනෙන්නෙ නැද්ද කියල. ඒ වේදනාව නැති කරගත්තෙ ඔන්න ඔය අරහත්ඵල සමාධියෙන්. එතන සඳහන්වෙන්නෙ අර තෙජො ධ්‍යානය පිළිබඳව. නමුත් ඇත්ත වශයෙන්ම කාරණය මොකක්ද? මාරයා උදුරාගන්න කලින් මේ ශරීරය අතහරිනව. අතහැරල වෙන අයට කරදර වෙන්න ඉඩනොදී තමන්ම ආදාහනය කරගන්නව. එහෙම පිටින්ම මාරයට තේරුම්ගන්න බැරි විදියේ විසඳුමක් බුදුරජාණන්වහන්සේ ඉදිරිපත් කළෙ

# අධෝලිපි

1. සු.නි. 222 පිට (බු.ජ.25)
2. ප.ජො. 404 පිට (හේ.මු.)
3. සු.නි. 258 පිට (බු.ජ.25)
4. සු.නි. 268 පිට (බු.ජ.25)
5. අං.නි. VI 268 පිට (බු.ජ. 23)
6. සං.නි. IV (බු.ජ.16) 326 පිටුව
7. ම.නි. II 584 පට (බු.ජ.11)
8. අං.නි. V 456 පිට (බු.ජ.22)
9. බ්‍රාහමණ වගග, ධ.ප.
10. ම.නි. I 350 පිටුව (බු.ජ.10)
11. බු.නි. I 368 පිටුව (බු.ජ.24)
12. ථෙර. 184 පිට (බු.ජ.28)
13. දී.නි. II 498 පිට (බු.ජ.8)
14. ථෙර. 282 පිට (බු.ජ.28)